

# අධිකරණ විනිශ්චය

# විඥාපනය.

---

ශ්‍රීඝන සුගත තථාගත ශාසනාවචර සුප්‍රතිපන්න කුලපුත්‍රයන්ගේ ගුණාතිශය රක්‍ෂණ ගොපනාර්ථවූ තථාගත සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ තදෞරස පුත්‍රයන්ගේ අධිකරණ විනිශ්චය සඳහා වදාළ පෙළ හා අටුවාව අළලා ලියනලද මේ විනය නීති සඞ්ග්‍රහය වනාගී වර්තමාන කාලික විනයනය විජානනාභිලාෂී සාධූන්ගේ ප්‍රයෝජනය පිණිස කරණලදී. විශෙෂයෙන් පාළි මුත්තක විනයවිනිශ්චය සඞ්ග්‍රහය මේ කෘත්‍යයෙහි මාතෘකා ස්වරූපයෙන් නිරූපිතය.

සම්‍යක් දෘෂ්ටික මහීපාලයන් ගේ ආඥාචක්‍රයෙන් තොරවූ ලඞ්කාශාසනය පාපභිරුක නොවන පැවිද්දන්ගේ ආත්ම ඝාතක රාජනීති ක්‍රමානුගත අධිකරණ මාර්ගාවතීර්ණව කෙරෙණ මිථ්‍යා ප්‍රතිපත්තිය ශාසනානුලොම නොවන බැව් මේ බුඩ නීතිමයවූ සුළු ග්‍රන්ථයෙන් පාළි භාෂාව නොහදළ නැණැතියන්හට අවබොධවිය යුතුය.

ශාසනාලය පූර්වකවැ අප විසින් මේ ධර්ම සඞ්ග්‍රහය සකස්කිරී මෙන් ජනිත කුශලය අපගේ දිවඞ්ගත ආචාර්ය්‍ය ප්‍රාචාර්ය්‍යාදීන්ටද අත්වේවායි ප්‍රාර්ථනා කරම්හ.

මෙහි අපගේ ප්‍රමාදජන්‍යස්ඛලිත ස්ථාන ඇතහොත් සාධුහු මෛත්‍රී කරුණා පූර්වකව සංශොධනය කෙරෙත්වා.

මිට-ශාසනොදයකාමි,

**ශාල්ලේ පඤ්ඤාසීහ ස්ථවිර.**

# සංක්ෂිප්තචරිතය.

මෙම "අධිකරණවිනිශ්චය" නම්වූ විනය නීතිසඞ්ග්‍රහයෙහි කර්තෘභූත ගරුකටයුතු ගාල්ලේ පඤ්ඤාසීහ ස්වාමිපාදයන් වහන්සේ වනාහී ශ්‍රී බුද්ධ වර්ෂ 2418 හෙවත් ක්‍රිස්තු වර්ෂ 1875 අප්‍රියෙල් මස 18 වෙනි දිනට පැමිණි නානුමුර මඞ්ගල දිනයෙහි සංජාතවූයේය. දෙගුරුන් සිත් ගන්නා සුළු සුවිනීත ගුණයෙන් යුත් ළදරුතෙම ක්‍රමාභිවෘද්ධවූයේ පාඨශාලාවට යවා අක්ෂරාභ්‍යාෂය කරවන කල්හි එවකට ගාල්ලේ විජයානන්ද විහාරාධිපතිව වැඩවිසූ ගෞරවාර්හ අක්මීමන ධම්මාරාම ස්වාමිපාදයන් වහන්සේ වෙතද ශතකපොත් හැදෑරීම කළේය. මෙසේ දසවස් පිරුණුකල ගරුතර ශ්‍රී ලඞ්කා රාමඤ්ඤනිකායේ ආදිකර්තෘභූත ශාසනවංශ කවිධජ සිරි සද්ධම්මාචරිය යති සඞ්ඝපති ඉන්දාසභවර ඤාණසාමි නම්වූ පූජ්‍යපාද අඹගහවත්තේ මහා නායක මාහිමියන් වහන්සේ ගාල්ලේ විජයානන්ද විහාරස්ථානයට වැඩමකළ කල්හි දෙවන දින උදෑසන සිරිත් පරිදි සිය මව හා විහාරයට පැමිණි ළදරුවා නායක හිමි වෙත කැඳවා "තුඹ මහණවනු කැමතිද" යි විචාළ කල්හි එසේයයි ඉතා සතුටින් පිළිවදන් දුනි. ඉක්බිති දෙගුරුන් විචාරා සිවුරු පිරිකරාදිය පිළියෙලකොට මාතර සීමා බන්ධනයට ගොස් පෙරළා වඩින ගමනෙහි ශ්‍රී බුද්ධ වර්ෂ 2428 දී හෙවත් ක්‍රිස්තු වර්ෂ 1885 පෙබ්‍රවාරි මස 4 වෙනි දින මහා සඞ්ඝයා වහන්සේ ඉදිරියෙහි ප්‍රව්‍රජ්‍යා භූමියට පත්කර වදාළේය. අනතුරුව ආචාර්යෝත්තම මහා නායක මාහිමියාණන් වහන්සේ සමග පයාගල ධර්මගුප්ත පරිවෙණ ස්ථානයට වැඩමවා අවුරුද්දක් ගතවන අතර ශ්‍රී බුද්ධ වර්ෂ 2429 දී හෙවත් ක්‍රිස්තු වර්ෂ 1886 ජනවාරි මස 29 වෙනි දින මහා නායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ අපවත්වී වදාළෙන් ගෞරවාර්හ අළුත්ගම ශාසනජ්‍යොතක සුජාතාසභ අනුනායක මහා ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේගේ ශිෂ්‍යයෙක්ව විසිවස් පිරිකල්හි ශ්‍රී බුද්ධ වර්ෂ 2441 දී හෙවත් ක්‍රිස්තු වර්ෂ 1867 ජුනි මස අධිශීලයෙහි පිහිටියේය.

ගරුතර ගාල්ලේ පඤ්ඤාසීහ ස්ථවිර ස්වාමිපාදයන් වහන්සේ බෞද්ධ මහාජනතාවට ආගම ධර්මය දැනගැන්ම පිණිස "ගෘහස්ථ ප්‍රතිපත්තිසඞ්ග්‍රහය" නම් වටිනා පොතක් හා වෙනත් නොයෙක් පොත් පත්ද කලින් කල සඞ්ග්‍රහකොට තිබේ

මීට-ශාසනස්ථිතිකාමි,

එච්. ඇඩ්වින් ප්‍රනාන්දු,

ශාසනධ්වජ දායක සභාවේ ගරු ලේකම්.

අළුත්ගම (බෙන්තොට)

1. 10. 38.

# සුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අසුද්ධ. | සුද්ධ. |
|---|---|---|---|
| 4 | 17 | පටිකෙඛ | පටිකෙඛප |
| 6 | 6 | විකය | විනය |
| 9 | 10 | ථූලසිවෙයි | තුලසිවෙයි |
| 10 | 34 | ගණ්ද | ගණ්ඨිද |
| ,, | ,, | මාණිකූට | මාණකූට |
| 12 | 17 | පටිච්ඡන්නාවර යයි | පටිච්ඡන්නාවහාරයයි |
| 13 | 24 | පරියාපතිධර වූ | පය්‍යාපතිධර වූ |
| 15 | 18 | ඉතවලයි | ඉවතලයි |
| ,, | ,, | සංඛ්‍යාතව | සඞ්ඛ්‍යාත වූ |
| 17 | 2 | නුවණැනි | නුවණැති |
| ,, | 20 | සම් වූ | සම වූ |
| 18 | 16 | මෙනම් | මේනම් |
| ,, | ,, | අධිඝත | අධිගත |
| ,, | 17 | අධිඝතදූයි | අධිගතදූයි |
| 19 | 10 | වචනය | වචනය |
| 21 | 22 | වඳුල | වඳුළ |
| ,, | 26 | මාංශ | මාංස |
| 25 | 7 | ආවරිය | ආචරිය |
| 28 | 30 | විනචඡය | විනිචඡය |
| 30 | 15 | වැවැත්ම | පැවැත්ම |
| ,, | 15 | යහපන්ව | යහපත්ව |
| 31 | 26 | වාදීන් | වාදීන් කී |
| 32 | 7 | පරම පරාතොම | පරම්පරාතොම |
| 33 | 11 | තමා | තම |
| 34 | 31 | මාගම | මාගම් |
| 35 | 8 | සඟ වෙසෙස් සවෙයි | සඟවෙසෙස්වෙයි |
| 40 | 13 | ආපිත්ති | ආපත්ති |
| 47 | 19 | චොදන | චොදනා |

මුද්‍රණ කාය්‍ය්‍යාලයයෙහි ඇතැම් ඌනතා හා ප්‍රමාද කරණ කොට ගෙන යම් යම් ස්ඛලිතස්ථාන ඇති බැව් පෙණෙතත් අර්ථාව බොධයට බාධක නොවන හෙයින් ශුද්ධි පත්‍රය දීඝී නොකරන ලදී. "විනිශ්චය" ශබ්දය බොහෝ තැනක "වීනිශ්චය" යයි වැරදී වැටී තිබේ. පද වෙන් කිරීමේද වරද ඇති බැව් පෙණෙතත් එයින් අභිප්‍රෙතාර්ථ බාධක නොවන හෙයින් ශුද්ධි පත්‍රයට නොගන්නාලදී.

# අධිකරණවිනිශ්චය

-: හෙවත් :-

## විනයනීති සංග්‍රහය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස.**

තිලොකතිලකං නාථං-නත්වාධිකරණ'ඤ්ඤාගුං
දීපයෙ දීප භාසාය-සඞ්ඝාධිකරණෙ නයං
පාළිං අට්ඨකථඤ්චෙව-ඔගාහෙත්වා යථොචිතං
පාළිමුත්තනයාලම්බ-භාසමානස්ස මෙවචො
සාසනත්ථාභිකඞ්ඛන්තා-පටිපත්ති පරායණා
වාසිතා සීලගන්ධෙන-නිසාමයථ සාධවො

ශ්‍රී සද්ධර්මවර චක්‍රවර්තිවූ භාග්‍යවත් සර්වඥරාජොත්තම යාණන්වහන්සේගේ ප්‍රජා සඞ්ඛ්‍යාත භික්ෂුසඞ්ඝයා වහන්සේ පිණිස වදාළ ආඥාදෙශනාපර නාමධෙය විනය පිටක පර්‍ය්‍යාපන්න අධිකරණ විභාගය අවබොධ කරනු කැමැත්තන් විසින් චොදක ලක්ෂණය, ත්‍රිවිධචොදනාය, චතුර්විධ චොදනාය, චතුර්විධ සඞ්ගීතාය, චොදනා සඞ්ඛ්‍යාය, චොදක චුදිතක ලක්ෂණය යන මොවුන් මුල්කොට ඇති විනිශ්චයකාර ලක්ෂණ අවසන් කොට ඇති සියල්ල දතයුතු වන්නේය.

චොදකයන් අතුරෙන් කවරෙක් චොදනා කරන්ට ලබාද කවරෙක් නොලබාදයත්- දුශීල චොදක වචනයගෙන වූකලී කිසිවෙකුත් චොදනා කරන්ට නොලබයි. දුශීල චොදකයා නම්:—බොහෝදෙනා එක්රැස්ව කථා සල්ලාපයෙන් යුක්තව හින්ද දී කිසිවෙක් කිසිවකු පිළිබඳව නියමයක් නොකොට පරිජ ඇවතකට පත්වූ කථාවක් කෙරේද, අනෙකෙක් එබස් අසා සිට ගොස් ඒ භික්ෂුහට දන්වයිද, එවිට හෙතෙම චොදනා වස්තුව ප්‍රකාශකළහු වෙත පැමිණ" තෙපි මට මෙනම් මෙනම් දෙයක් කීයෙහිදූ,,යි අසයි. එවිට ආදියෙහි කී තැනැත්තේ මම මෙබන්දක් නොදනිමි කථා ප්‍රවෘත්තියෙහි ලා නියම නොකොට කියනලද්දක් ඇත ඉදින් යුෂ්මතුන්ට මෙබඳු චිත්තභෙදොත්පත්තිය දත්තෙම් නම් මෙපමණ කුදු නොකී

යන්නෙමැයි කියාද, මේ දුශ්ශීල චොදකයාගේ **ලක්‍ෂණයි.** ඔහුගේ ඒ කථා සල්ලාපය ගෙන කිසිවෙක් භික්‍ෂුවක්හට චොදනා කරන්ට නොලබයි.

මෙබඳු දුශ්ශීල චොදනා බස නොගෙන වනාහී ශීලසම්පන්න භික්‍ෂුවක් භික්‍ෂුවකට හෝ ශීලසම්පන්න භික්‍ෂුණියක් භික්‍ෂුණියකට හෝ චොදනා කරන්ට ලබයි යනු **මහාපදුමස්ථවිර** වචනය වේ.

**මහාසුමම ස්ථවිර** වනාහි පස්සහද්දම්යෝ ම චොදනා කරන්ට ලබති යි කීයේය. **ගොදත්ත ස්ථවිරතෙම** කිසිවෙකුත් චොදනා කරන්ට නොලබන්නේ නොවෙයි කියා "භික්‍ෂුවක් වෙතින් අසා චොදනා කෙරෙයි මෙහෙණක් වෙතින් අසා චොදනා කෙරෙයි—පෙ—තීර්ථක ශ්‍රාවකයන් වෙතින් අසා චොදනා කෙරෙයි" යන විනය පාළිය ගෙන පෑය.

තුන්දෙනා වහන්සේගේ ම වාදයෙහි චුදිතකයාගේ හෙවත් චොදනා ලද්දහුගේ ප්‍රතිඥවෙන් ම වරදකරු හෝ නිවරදකරු කාරවිය යුත්තේ ය.

මේ චොදනා තොමෝ **දිට්ඨචොදනාය, සුත චොදනාය, පරිසඞ්කිත චොදනා** යි ත්‍රිවිධ වන්නීය. ඔවුන් අතුරෙන් **දිට්ඨචොදනා** නම්– තමාගේ හෝ අනුන්ගේ ප්‍රකෘති ඇසින් හෝ දිවඇසින් දක්නාලද යමක් කාරණා කොට ගෙන කරන චොදනායි. **සුත චොදනා** නම්– තමා විසින් හෝ අනුන් විසින් අසන ලද යමක් කාරණා කොට ගෙන කරන චොදනා යි. **පරිසඞ්කිත චොදනා** නම්– තමාවිසින් හෝ අනුන් විසින් සැකකරන ලද යමක් කාරණාකොට ගෙන කරන චොදනා යි.

එහි **පරිසඞ්කිත චොදනා** තොමෝ ත්‍රිවිධ **වන්නී ය.** කෙසේදයත්– **දිට්ඨ පරිසංකිතය, සුත පරිසංකිතය, මුත පරිසංකිතය** යන මොහුයි. එහි **දිට්ඨපරිසංකිතය** නම්– එක් භික්‍ෂු කෙණෙක් මලමූත්‍ර කරන පිණිස ග්‍රාම **සමීපයෙහි** වනලැහැබකට ප්‍රවිෂ්ටවූහ. එක් **ස්ත්‍රියක්ද** යම්කිසිවක් පිණිසඒ වනලැහැබටම ප්‍රවිෂ්ටවූවාය. **මහණ** තෙමේ **ස්ත්‍රියද ස්ත්‍රී** තොමෝ **මහණද** නොම දුටුයේ ය. ඔවුනොවුන් නො **දූ**කම කැමති සේ නික්ම ගියාහුය එක්තරා භික්‍ෂු කෙනෙක් එසේ ගිය දෙදනා දූක ඒකාන්තයෙන් මොවුන් විසින් මෛථුන සෙවනය කරන ලද්දේ හෝ කරනු ලැබේයයි සැක කෙරෙත් මේ දිට්ඨ පරිසංකිත නම් වේ.

**සුත පරිසංකිතය නම්:-** මේ ශාසනයෙහි යමෙක් සත්‍රියක් හා භික්ෂූවක්හුගේ එබඳු පිළිසඳර කථාවක් අසා ද ඒ සමීප යෙහි අන්කිසිවකු ඇති බව නොදනී ද හෙතෙම ඒකාන්ත යෙන් මොවුන් විසින් මෛථුන සෙවනය කරන ලද්දේ හෝ කරනු ලැබේ යයි සැකකෙරෙයි මේ සුත පරිසංකිත නම්වෙ.

**මුත පරිසංකිතය නම්:-** බොහෝ ධූර්තයෝ රාත්‍රි භාග යෙහි පුෂ්ප සුගන්ධ මස් රා ආදිය ගෙන සත්‍රීන් සමග එක් ප්‍රත්‍යන්ත විහාරයකට ගොස් මණ්ඩපයෙහි හෝ භෝජන ශාලාදියෙහි හෝ සැපවූ පරිද්දෙන් ක්‍රීඩාකොට මල් ආදිය විසුරුවා ගියාහුද, දෙවෙනි දින භික්ෂූහු ඒ විප්‍රකාරය දැක කවරක්හුගේ කර්මයෙක් දැයි පරීක්ෂා කෙරෙත්. එහිදු කිසියම් භික්ෂු කෙනෙක් පළමුවෙන් නැගී සිට වත්ත ශීඝ්‍රයෙන් මණ්ඩ පය හෝ භෝජන ශාලාව ප්‍රතිජගනය කරන්නහු විසින් මල් ආදිය අල්වන ලද හෝ වෙයි. කිසියම් උපස්ථායක කුලය කින් ගෙනෙන ලද මල් හෝ පුදන ලද වෙයි. කිසිවක්හු විසින් බෙහෙත් පිණිස අරිෂ්ටයක් හෝ බොන ලද වෙයි. ඉක්බිති ඔව්හු මේ කර්මය කවරක්හුගේ දැයි පරීක්ෂා කරන්නාහු භික්ෂුහුගේ හස්ත ගන්ධ මුඛ ගන්ධයන් ආඝ්‍රාණය කොට ඒ භික්ෂු කෙරේ සැකකෙරෙයි මේ මුත පරිසංකිතය නම් වේ.

සීලවිපත්ති චොදනාය; ආචාර විපත්ති චොදනාය, දිට්ඨි විපත්ති චොදනාය, ආජීව විපත්ති චොදනායයි අතිකුදු චොද නාවෝ සතරෙක් වෙති. එහි පාරාජිකා සඞ්ඝාදිසෙස සඞ්ඛ්‍යා තවූ දෙවදෑරුම් ගරුකාපත්තීන්ගේ වශයෙන් සීල විපත්ති චොදනා දතයුතුයි. අවශෙෂවූ ථුල්ලච්චය පාචිත්තිය පාටි දෙශනීය දුක්කට දුබ්භාසිත යන පස්වැදෑරුම්වූ ලහුකාපත්තීන්ගේ වශයෙන් ආචාර විපත්ති චොදනා දතයුතුයි.

“නත්ථිදින්නං” යනාදීන් දක්වනලද දශවස්තුක මිථ්‍යාදෘෂ්ටි යද “අන්තවා ලොකො” යනාදීන් දක්වනලද අන්තග්‍රාහිකා මිථ්‍යාදෘෂ්ටියද ශාස්වත උච්ඡෙද සඞ්ඛ්‍යාතවූ දෘෂ්ටිග්‍රහණය කිරීම් වශ යෙන් දෘෂ්ටි විපත්තිචොදනාද දතයුතුයි. ආජීවය හෙතුකොට පනවනලද සවැදෑරුම්වූ ශික්ෂාපදයන්ගේ වශයෙන් ආජීව විපත්ති චොදනා දතයුත්තීය. එහි ආජීවය හෙතුකොට පනවනලද සැවැදෑරුම් ශික්ෂාපදයෝ නම්:-

“ආජීවහෙතු ආජීවකාරණා පාපිච්ඡො ඉච්ඡාපකතො අසන්තං අභූතං උත්තරි මනුස්ස ධම්මං උල්ලපති ආපත්ති පරාජිකස්ස ආජීවහෙතු ආජීව කාරණා සංචරිත්තං සමාපජ්ජති ආපත්ති

සඞ්ඝාදිසෙසස්ස, ආජීව හෙතු ආජීව කාරණා යො තෙ විහාරෙ වසති සො භික්ඛු අරහාතිභණති පටිවිජානන්තස්ස ආපත්ති ථුල්ලච්චයස්ස, ආජීව හෙතු ආජීව කාරණා භික්ඛු පණීත භොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාචිත්තියස්ස, ආජීව හෙතු ආජීව කාරණා භික්ඛු පණීත භොජනානි අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති පාටිදෙසනීයස්ස, ආජීව හෙතු ආජීව කාරණා භික්ඛු සූපං වා ඕදනං වා අගිලානො අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජති ආපත්ති දුක්කටස්ස" යන මොහු සදෙන ආජීවය පිණිස පනවතලද ශික්ෂා පදයෝයි

වත්ථු සන්දස්සනාය- ආපත්ති සන්දස්සනාය- සංවාස පටික්ඛෙපය- සාමීචි පටික්ඛෙපය යයි අතිකුදු චොදනාවෝ සතරදෙනෙක් වෙති එහි වත්ථු සන්දස්සනා නම්- තෝ මෙවුන්දම් සෙවියෙහිය, නුදුන් දේ ගත්තෙහිය, මිනුෂ්‍යයකු මැරුවෙහිය. අනධිගතවූ උත්තරි මනුෂ්‍ය ධර්මය අධිගතයයි කීයෙහි යි මෙසේ පැවති කථායි. ආපත්ති සන්දස්සනා නම්:- තෝ මෛථුන ධර්ම පාරාජිකා පත්තියට පැමිණියෙහියි මේ ආදී පැවති කථායි. සංවාස පටික්ඛෙප නම්:- තාහා සමග පොහෝ කිරීමෙක් හෝ පවාරණයෙක් හෝ සඞ්ඝ කර්මයෙක් හෝ නැත්තේයයි මෙසේ පැවති කථායි. සාමීචි පටික්ඛෙපය නම්:- වැඳීම, දැක හුනස්තෙන් නැගීම, ඇඳිලි බැඳීම, පවන් සැලීම ආදී කර්මයන් නොකිරීමයි. හෙද පිළිවෙලින් වැඳීම් ආදිය කරන්නේ එක්කෙනෙකුට නොකොට සෙස්සන්ට කරන කාලයෙහි දත යුතුයි. මෙපමණෙකිනුත් චොදනා නම්වේ. කැඳබත් ආදිය යම් කෙනෙකුට දෙනු කැමතිනම් ඔහුට දෙයි. එපමණෙකින් චොදනා නම් නොවෙයි.

පාතිමොක්ඛට්ඨපනක්ඛන්ධකයෙහි "මහණෙනි අධාර්මික ප්‍රාතිමොක්ෂයාගේ එක් තැබීමෙක. ධාර්මික ප්‍රාතිමොක්ෂයාගේ එක් තැබීමෙකැ"යි මේ ආදිකොට ඇති යම්තාක් දස අධම්මික පාතිමොක්ඛට්ඨපනයද- දසධම්මිත පාතිමොක්ඛට්ඨපනයදූයි මෙසේ අධම්මිකයෝ පස්පනසෙක, ධම්මිකයෝ පස්පනසෙකැයි එක්සිය දසයක් චෝදනාවෝ කියන ලද්දාහුය. දිට්ඨ සුත පරිසඞ්කිත වශයෙන් ඒ චොදනාවෝ තුන්සිය තිසෙක් වෙති. ඔවුන් කායින්ද වචනයෙන්ද කාය වචන දෙකින්ද චොදනා කිරීම් වශයෙන් තුන්ගුණ කරන ලද්දාහු නවසිය අනූවක් වෙත්. ඔව්හු තමා චොදනා කරද්දීද අනුන් ලවා චොදනා කරවද්දීද

එපමණකැයි විසක් අඩු දෙදහසෙක් වෙත්. නැවත දිට්ඨි සුතාදි භෙදයෙහි සමූලික අමූලික වශයෙන් නොයෙක් දහස් ගණන් චොදනාවෝ වෙතියි දතයුත්තාහුය.

දක්වනලද ප්‍රභෙද ඇති මේ චොදනාවන් අතුරෙන් යම් කිසි චොදනාවක් වශයෙන් සඟ මැදට (චොදනා සඞ්ඛ්‍යාතවූ හෝ වීතික්කම සඞ්ඛ්‍යාතවූ හෝ) යම් වස්තුවක් බටකල්හි අපගේ විනිශ්චයෙන් තෙපි සතුටු වන්නහුදැයි චූදිතක චොදකයන්ට කිවයුත්තාහ. ඉදින් ඔවුහු සතුටු වන්නෙමුයි කියත්ද, සඞ්ඝයා විසින් ඒ අධිකරණය පිළිගතයුතුය. වැළිදු වනාහි වහන්ස! විනිශ්චයකර වදාළ මැනවි. ඉදින් අපට රුචිවී නම් ගනුම්හයි කියද්ද එකල්හි චෛත්‍යය වඳිව් ආදිය කියා විනිශ්චය ප්‍රමාදකොට ඔවුන් හැරිය යුත්තාහ. ඉදින් ඔවුහු බොහෝ වේලා විඩාපත්වූවාහු අඩුවූ පිරිස් ඇත්තාහු පිරිහුණු පක්ෂබල ඇතිව නැවත විනිශ්චය යාඥ කෙරෙද්ද යම්තාක් තුන්යලක් ප්‍රතික්ෂෙපකොට යම්විටෙක ඔවුහු මාන රහිතවෙත්ද, එකල ඔවුන්ගේ අධිකරණය විනිශ්චය කටයුතුය.

විනිශ්චය කරන්නවුන් විසිනුදු විනිශ්චය කරන සඟ පිරිස අතුරෙහි අලජ්ජී පිරිස අධික නම් ඔවුන් වෙන්කොට දශාඞ්ග යෙන් සමන්විතවූ භික්ෂූන් දෙතුන් නමක් ඤත්ති දුතිය කම් වාක්‍යයෙන් සම්මත කළයුත්තාහුය.

ඒ දශ අඞ්ගය නම්:- සීලවා හොති පාතිමොක්ඛ සංවර සංවුතො විහරති ආචාර ගොචර සම්පන්නො අනුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු බහුස්සුතො හොති සුතධරො සුතසන්නිචයො යෙතෙ ධම්මා ආදි කල්‍යාණා මජ්ඣෙකල්‍යාණා පරියොසාන කල්‍යාණා සාත්ථං සබ්‍යඤ්ජනං කෙවල පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං අභිවදන්ති තථාරූපාස්ස ධම්මා බහුස්සුතා හොන්ති ධතා වචසා පරිචිතා මනසානුපෙක්ඛිතා දිට්ඨියා සුප්පටිවිද්ධා උභයානි ඛො පනස්ස පාතිමොක්ඛානි විත්ථාරෙන ස්වාගතානි හොන්ති සුවිභත්තානි සුප්පවත්තිතානි සුවිනිච්ඡිතානි සුත්තසො අනුබ්‍යඤ්ජනසො විනයෙ ඛො පනඨිතො හොති අසංහීරො පටිබලො හොති උභො අත්ත පච්චත්ථිකෙ අඤ්ඤාපෙතුං සඤ්ඤාපෙතුං නිජ්ඣාපෙතුං පෙක්ඛතුං පසීදිතුං පසාදෙතුං අධිකරණ සමුප්පාදවූපසම කුසලො හොති අධිකරණං ජානාති අධිකරණසමූලං ජානාති අධිකරණ සමුදයං ජානාති අධිකරණ නිරොධංජානාති අධිකරණ නිරොධගාමිනී පටි පදං ජානාති,, මෙකී දශඅඞ්ගයෙන් සමන්විතවූ භික්ෂූන් දෙතුං

නමක් තෝරාගෙන ඤත්ති දුතිය කර්ම වාක්‍යයෙන් සම්මතකොට ඒ සම්මතකරනලද භික්ෂූන් විසින් වෙනම හිඳගෙන හෝ එම පිරිසෙහි හිඳගෙන හෝ අන්‍ය භික්ෂූන් විසින් කිසිවක් නොකිව යුත්තේයයි අස්වා ඒ අධිකරණය විනිශ්චය කටයුතුය. ඉදින් කිසිත් නොදන්නාවූ බාල භික්ෂු පිරිස අධිකවී නම් තොපට විශ්වාස විනයධරයන් සොයව් යයි විනයධරයන් සොයවා යම් ධර්මයකින් යම් විනයකින් යම් ශාස්තෘ ශාසනයකින් ඒ අධිකරණය සංසිඳේද, එසේ ඒ අධිකරණය සංසිඳවිය යුතුය. එහි ධර්මනම් විද්‍යමාන වස්තුය. විනය නම් චෝදනා කිරීම හා සිහිකරවීමය. ශාස්තෘ ශාසනය නම් ඤත්ති සම්පත්තිය හා අනුශ්‍රාවන සම්පත්තියයි. එහෙයින් චෝදකයා විසින් යම්කිසි වස්තුවක් ආරෝපනය කළ කල්හි චෝදනාලද තැනත්තහුගෙන් සත්‍යයද අසත්‍යය දැයි නොහොත් විද්‍යමාන දෙයක්ද අවිද්‍යමාන දෙයක් දැයි විචාළ යුතුය. මෙසේ වස්තු විමසා විද්‍යමානවූ වස්තුවෙන් චෝදනාකොට සිහිකරවා ඤත්ති සම්පත්තියෙන් හා අනුශ්‍රාවන සම්පත්තියෙන්ද ඒ අධිකරණය සංසිඳවියයුතුය. ඉදින් එහි අලජ්ජියෙක් අලජ්ජියකු හට චෝදනා කෙරේද ඉදින් ඒ අලජ්ජීතෙමේ බාලවේද අව්‍යක්ත වේද ඔහට මුඛාරූඪකොට කථා නොකළයුතුය. මෙසේ වනාහි කියයුතුය. “කිමහිනං චොදෙසි” මෙසේ කී කල්හි හෙතෙම වහන්ස! “කිම්හි නං” යන මේ වචනය කිමෙක්දැයි ඒ සාන්තයෙන් කීයානම් ඔහට “ කිමහිනං” යන මේ අභිප්‍රාය පමණකුදු නොදන්නෙහිය. මෙබඳුවූ අඥතවූ තොප විසින් අන්‍යයාට චෝදනාකරන්ට නුසුදුසුයයි ඔහුඑතනින් පහ කට යුත්තේය. ඔහට පෘච්ඡා ප්‍රතිපෘච්ඡා වශයෙන් නය (අනුබල) නොදියයුතු.

ඉදින් වනාහි අලජ්ජීතෙම පණ්ඩිතවේද, ව්‍යක්ත වේද, දක්නාලද දෙයින් හෝ අසන ලද දෙයින් හෝ චෝදනා ලැබූ තැනැත්තහු මැඩ පවත්වා ප්‍රතිවචන දීමට හැකිවේද ඔහට අනුබලදී ලජ්ජී භික්ෂුහුගේ ප්‍රතිඥාවෙන් විනිශ්චය කර්මය කටයුතුය.

ඉදින් සිල්වත් ලජ්ජී භික්ෂුනමක් අලජ්ජී භික්ෂුවක් හට චෝදනා කෙරේද ඒ අලජ්ජී මහණ බාලවේද අව්‍යක්තවේද ප්‍රතිවචන දීමට නොහැකිවේද ඔහට වචනා මුඛාරූඪකොට.විචාළ යුතුය. ඒ කෙසේදයත්? කවරෙක්හි චෝදනා කෙරෙහිද සීල විපත්තියකින් හෝ ආචාර විපත්ති ආදීවූ එක්තරා එකකින් දැයි මෙසේ ඔහු අතින් විචාළිය යුතුය. කවර කාරණයකින්

වනාහි මෝහටම වචනය මුඛාරූඪකොට විචාළයුතුද? අලජ්ජි මහණහුගෙන් එසේ නොවිචාළ යුහුද? විනයධරයන්ගේ අගති ගමන සුදුසු නොවේ ද යතහොත්? නුසුදුසු වන්නේමය. මේ වනාහි අගති ගමන නොවන්නේය. මෙතෙම ධර්මානුග්‍රහය නම් වෙයි. අලජ්ජීන්ට නිග්‍රහ පිණිසත් ලජ්ජීන්ට සංග්‍රහ පිණිසත් බුදුන් විසින් ශික්ෂාපද පනවන ලද්දේය. එහි අලජ්ජිතෙම අනුබල ලැබ ලජ්ජීන් මැඩපවත්වන්ට එයි ලජ්ජිතෙම වනාහි අනුබල ලැබ දුටුදේ දුටු ආකාරයෙන්ම ඇසූදේ ඇසූආකාරයෙන්ම සත්‍යයෙහි පිහිටා කියන්නේය. එහෙයින් ඔහට ධර්මානුග්‍රය කරන්ට වටී. ඉදින් වනාහි ලජ්ජිතෙම පණ්ඩිතවේද ව්‍යක්තවේද සත්‍යයෙහි පිහිටා කියයිද අලජ්ජිතෙම ඒත් නැතැයි ඒත් නැතැයි ප්‍රතිඥා නොදෙයිද ලජ්ජිහුගේ ප්‍රතිඥාවෙන්ම ආපත්ති ආරූඪකටයුතුය. ඒ කාරණය දක්වන පිණිස මේ කථා වස්තුව දතයුතුය.

**ත්‍රිපිටක චූලාභය** ස්ථවිරයන් වහන්සේ වනාහි ලොවාමහා ප්‍රාශාදයා ගේ යට භික්ෂූන්ට විනය කියා සවස්වේලෙහි එයින් නැගී සිටිසේක. උන්වහන්සේ නැගී සිටිනා වේලෙහි විවාද වස්තු සංඛ්‍යාතවූ අර්ථයෙහි විරුද්ධ වූ භික්ෂූනු දෙදෙනෙක් කථාවක් පැවැත්වූවාහුය. ඔවුන් දෙදෙනා අතුරෙන් චෝදනා ලැබූ තැනැත්තා ඒ ඒ තැන ඒත් නැත ඒත් නැතැයි ප්‍රතිඥාවක් නොදෙයි. ඉක්බිත්තෙන් රාත්‍රිය ගේ ප්‍රථම යාමය මදක් ශෙෂව සිටිකල්හි ස්ථවිරයන් වහන්සේට ඔවුන් දෙදෙනා අතුරෙන් චෝදනාකල තැනැත්තා සත්‍යයෙහි පිහිටා කියයි. චෝදනා ලැබූ'තැනැත්තා ප්‍රතිඥා නොදෙයි. බොහෝ වස්තූහු සහ මැදට බටුවාහුය. ඒකාන්තයෙන්ම මොහු විසින් මේ වැරැද්ද කරන ලද වන්නේයයි අශුභ ලබ්ධිය උපදනා ලද්දේය. ඉක්බිති විජිනීපත් දණ්ඩන් පාදපීඨයට ගසා ඔවුන්ගේ කථාව නවත්වන පිණිස සංඥකොට" ඇවැත්නි! මම විනිශ්චය කරන්ට නුසුදුස්සෙමි. අනික් කෙනෙකු ලවා විනිශ්චය කරවා ගනුව"යි කීසේක වහන්ස! කවර කාරණයක් නිසාදැයි විචාළේය. තෙරුන් වහන්සේ ඒ කාරණය කීසේක. එකල්හි චෝදනා ලැබූ තැනැත්තාගේ ශරීරයෙහි දාහය උපදනා ලද්දේය. ඉක්බිත්තෙන් තෙරුන්වහන්සේ වැඳ" වහන්ස! විනිශ්චය කරන්ට සුදුසුවූ විනය ධරයන් විසින් නුඹවහන්සේ වැනිවෙන්ට වටියි චෝදනාකරන්නන් විසිඳුදු මොහු වැනිවෙන්ට වටනේයයි කියා සුදුවස්ත්‍ර හැඳ මානිසා බොහෝ කාලයක් වෙහෙස ලැබුවහු යයි ක්ෂමාකරවා ගෙන ගියේය.

මෙසේ ලජ්ජි භික්ෂු විසින් චෝදනා කරනු ලබන්නාවූ අලජ්ජී භික්ෂුතෙම බොහෝ වස්තූන් උපන් කල්හිදු ප්‍රතිඥාවක් නොදෙයි හෙතෙම නොම ශුද්ධයයිද නොම අශුද්ධයයිද නො කිවයුතුය. හෙතෙම ජීවත්ව මැරුණේ නම අමුව කුණුවූයේ නම් වෙයි. ඉදින් වනාහි ඕහට අතිකුදු එවැනි වස්තුවක් උපන්නේවීනම් විනිශ්චය නො කටයුතුය. එසේ නසනලද වන්නේය.

ඉදින් වනාහි අලජ්ජියෙක්ම අලජ්ජියෙක් හට චෝදනා කෙරේද, ඕහට මෙසේ කියයුතුය. ඇවැත්නි.! තොපගේ වචනයෙන් යම්කිසිවක් කියන්ට නොහැක්කේයයි අනික් භික්ෂූහටත් එසේ කියා දෙදනාම එක සම්භොග පරිභොග ඇතුව ජීවත් වූව්යයි පිටත් කරවිය යුත්තාහ. ශීලය ගැණ විනිශ්චයක් නො කටයුත්තේය. පාසිවුරු පිරිවෙන් ආදිය පිණිස වනාහි සුදුසුවූ ශාක්ෂ්‍ය ලැබ විනිශ්චය කටයුතුයි.

නැවත ලජ්ජියෙක් ලජ්ජියෙකුහට චෝදනාකෙරේද, යම් කිසි දෙයක ඔවුන්ගේ විවාදය ශවලප මාත්‍රවේද නැවත මෙ බන්දක් නො කරව්යයි ඔවුන් සංසිඳුවා ඇවැත්දෙසවා හැරිය යුතුයි. නැවතද වනාහි මෙහි චෝදනා ලැබූ තැනැත්තා විසින් තමා විසින් කරනලද වැරද්ද වසන පිණිස බොරු කීයමින් වරදනා ලද්දේවේද මුලපටන් අලජ්ජියෙක් නැත් තේය. හෙද තම පක්ෂය රක්ෂා කරන පිණිස ප්‍රතිඥා නොදෙයි. අපි ද අදහම්හ අපිද අදහම්යයි. බොහෝදෙන නැගිට කියත් ඔවුන්ගේ ප්‍රතිඥාවෙන් වරක් දෙකක් ශුද්ධවේවා– එන කුදුවුවත් වරදනා ලද තැන් පටන් ලජ්ජීසංඝයෙහි නොසිටී. අලජ්ජී භාවයට පැමිණි බැවින් ඕහට විනිශ්චය නොදියයුතුයි.

**අදින්නාදාන පාරාජිකා** වස්තුව විනිශ්චය කරන්නාහු විසින් වනාහි පඤ්ච පඤ්චකයන් එක් රැස්කොට පස්විසි අවහාරයන් යහපත් කොට සැලකියයුත්තාහුය. එහි පඤ්ච පඤ්චකයෝ නම්:– නානා භණ්ඩ පඤ්චකය, එක භණ්ඩ පඤ්චකය, සාහත්ථික පඤ්චකය, පුබ්බපයොග පඤ්චකය, ථෙය්‍යාවහාර පඤ්චකය, යන මොහුයි. එහි නා නා භණ්ඩ පඤ්චකය, එක භණ්ඩ පඤ්චකය යන පඤ්චක දෙක පද භාජනියෙහි වදාරන ලද ආදියෙය්‍ය, හරෙය්‍ය, අවහරෙය්‍ය, ඉරියාපථං විකොපෙය්‍ය, ඨානා චාවෙය්‍ය යනපස්වැදෑරුම් පදයන්ගේ වශයෙන් ලැබෙත්. එහි නා නා භණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණක අවිඤ්ඤාණක,

වශයෙන් දතයුතුය ඒකභණ්ඩ පඤ්චකය සවිඤ්ඤාණක වශයෙන්ම දතයුතුයි. කෙසේද? ආදියෙය්‍ය යන්නෙහි අනෙකෙක් සන්තක පුෂ්පාරාම ඵලාරාමාදි ආරාමයක් බැලීමට යම් මහණෙක් උත්සාහ කෙරේද ඔහට දුෂ්කෘත ආපත්ති වන්නේය. අයිතිකාරයාට විමති උපදවාතම් ථුල්ලච්චය ඇවැත් වන්නේය. ස්වාමි තෙම මට නොවන්නේයයි ආලය හරණේවීනම් පාරාජිකා පත්ති වන්නේය.

"හරෙය්‍ය,, යන්නෙහි අනිකෙක්හුගේ බඩු ගෙණ යනුයේ හිසෙහි තිබෙන බර සොරසිත් ඇතිව අල්වාතම් දුෂ්කෘතා පත්තිවෙයි. සොලවාතම් ථුලසිවෙයි. කරට ගණිනම් පරිජිවෙයි. "අවහරෙය්‍ය,, යන්නෙහි යම් මහණෙක් ළඟ යමෙකු විසින් ප්‍රවේශම් පිණිස තබනලද බඩුවක් මාගේ බඩුව දෙවයි ඉල්වනු ලබන්නේ මම නොගතිමි කියාතම් දුෂ්කෘතා පත්ති වෙයි වස්තු ස්වාමියාට ලැබේද නොලැබේදැයි විමති උපදවාතම් තුලඝ් වෙයි. ස්වාමි තෙම මට නොලැබෙන්නේ යයි ආලය හරීනම් පරිජිවෙයි.

"ඉරියා පථං විකො පෙය්‍ය, යන්නෙහි යම් මහණෙක් අනිකෙකු ගේ බඩු සහිතවූ යමක් ගෙණ යන්නෙ මැයි ඔහු හා සමග යමින් පළමුවැනි පය ඉක්මවා නම් තුලසි වෙයි. දෙවෙනි පය ඉක්මවා නම් පරිජි වෙයි.

"ඨානාචාවෙය්‍ය" යන්නෙහි යම්කිසි තැනක තිබෙන අනුන් සන්තක යම්කිසි බඩුවක් සොරසිත් ඇතිව අල්වානම් දුෂ්කෘත වෙයි, සොලවානම් තුලසිවෙයි, තුබූ තැනින් ඉවත් කොළේනම් පරිජිවෙයි.

**නානා භණ්ඩ පඤ්චකය** මෙසේ **ද**තයුතු ය.

සස්වාමික වූ **ද**සයක්හුගේ හෝ තිරිසන්ගතයක්හුගේ හෝ යථොක්ත අභියොගාදිවූ ක්‍රමයෙන් ආදියන, හරණ, අවහරණ, ඉරියාපථ, විකොපන, ඨානා චාවන වශයෙන් ඒක භණ්ඩ පඤ්චකය දතයුතුයි. **සාහත්ථික පඤ්චකය** කවරේද? සාහත්ථිකය, ආණත්තිකය, නිස්සග්ගිය ය, අත්ථසාධක ය, ධුරනික්ඛෙප ය යන මේ පසයි.

එහි සාහත්ථික ය නම්:–අන්සතු බඩුවක් තෙමේම සොරසිතින් ගැණීම යි. ආණත්තික ය නම්:– අසවලාගේ බඩුවක් සොරකම් කරවයි අනෙකෙකුට ඇණවීම යි. නිස්සග්ගි ය නම්:–රජතියො

ගය පිට-සුංවත් ගන්නා ස්ථානවල කල්පනාය කරණලද අවකාශ
යෙන් ඇතුලත සිට යම්කිසි බඩුවක් පිටත හෙළීමයි. අත්ථසාධකය
නම්:-අසවලාගේ බඩුවක් යම් කලෙක හැකිද එකල සොරකම්
කොට ගණුවයි යමෙකුට අණකෙරේද එහි ඉදින් ඒ ඇණවනු
ලැබූ තැනැත්තා අනතුරක් නැතිව ඒ බඩුව සොරකම් කොට
ගණී නම් ඇණවූ තැනැත්තහුට ඇණවූ කෙණෙහි ම පරිජිවෙයි.

අනෙකකුගේ වනාහි තෙල්කලයක පාදයක් අගනා තෙල්
බොන්නාවූ වහන් සහල් ආදිය දමාතම් අතින් මිදුන කෙණෙ
හිම පරිජිවෙයි. ධුරනික්ඛෙපය වනාහි අරම් ආදිය ගැණීමට
කරණ උත්සාහය වශයෙන් ද සමීපයෙහි තබනලද බඩු වශ
යෙන් ද දතයුතු ය. ගන්නාතුරු තබනලද බඩු නො දෙන්නා
හටත් මෙම ක්‍රමයයි. මේ සාහත්ථික පඤ්චකය නම් වේ.

පුබ්බ පයොග පඤ්චකය නම්:-පුබ්බ පයොගය, සහ පයොගය
සංවිදාවහාරය, සංකෙත කම්මය, නිමිත්ත කම්මය යන මේ පසයි.
එහි ඇණවීම් වශයෙන් පුබ්බපයොගය දත යුතුයි. ඨානා චාවන
වශයෙන් ඉම්වල පිහිටුවන ලද ගල්කණු ආදිය උගුල්වා අනෙක්
අයගේ ඉඩම්වල පිහිටුවා කුඹුරු ආදිය ගැණීම් වශයෙන් සහ
පයොගය දතයුතුය. සංවිදා වහාරය නම්:= අසවල් නම් බඩු
සොරකම් කොට ගනුම්හයි බොහෝ දෙනෙකු සමග කථාකොට
සොරකම් කිරීම යි. එසේ කථාකොට ගියවුන් අතුරෙහි
එකෙකු විසිනුදු ඒ බඩුව තිබූ තැනින් ඉවත් කළ කල්හි සියල්
ලන්ටම අවහාරය වේ. සංකෙත කම්මය නම්:= (සංජානන) හැඳි
නීම් කම්මයයි. ඉදින් වනාහි උදය කාලාදීන් අතුරෙහි යම්කිසි
කාලයක් පිරිසිඳ අසවල් කාලයෙහි අසවල් බඩුව සොරකම් කර
වයි කී කල්හි සලකුණට පෙරපසු නොව ඒ බඩුව සොරකම්
කෙරේ නම් නියමකළ තැනැත්තහුට එකණෙහිම අවහාරයවේ.
නිමිත්ත කම්මය නම්:-සංඥා උපදවන පිණිස ඇස් ඉඟිකිරීමාදියයි.
ඉදින් වනාහි එසේ කරණ ලද නිමිත්තයට පෙරපසු නොව යමක්
සොරකම් කරවයි කියනලද්දේ, සොරකම් කෙරේද නිමිත්ත
කම්මය කළ තැනැත්තාහට එකෙණෙහිම අවහාරය වේ. මේ
පුබ්බ පයොග පඤ්චකය යි. ථෙය්‍යා වහාර පඤ්චකය කවරේද?
ථෙය්‍යා වහාරය, පසය්හාවහාරය, පරිකප්පාවහාරය, පටිච්ඡන්නා
වහාරය, කුසාවහාරය යන මේ පසයි. එහි මං පැහැරීම් ආදිය
කොට නොපෙණී යමක් පැහැර ගණීද තුලාකූට මාණකූට
යෙන් හා කහවණු ආදියෙන් වඤ්චාකොට යමක් ගණීද එසේ
ගන්නාවූ ඔහට වන්නාවූ අවහාරය ථෙය්‍යාවහාරයයි දතයුතු.

යමෙක් වනාහි බලාත්කාරයෙන් ගම්පහරන්නවුන් මෙන් අනුන් සන්තක දේ ගනීද රජහට ආදීන් මෙන් තමහට පැමිණී කොට්ඨාශයට වඩා අධික කොට යමක් ගනීද එසේ ගන්නාවූ ඕහට වන අවහාරය පසය්හා වහාරයයි දතයුතු. පිරිසිඳ යමක් ගැණීම පරිකප්පා වහාරය නම් වෙයි. ඒ වනාහි භණ්ඩපරිකප්පය ඕකාශපරිකප්පයයි දෙවැදෑරුම් වෙයි. එහි මේ මතු කියන්නේ භණ්ඩ පරිකප්පයයි. වස්ත්‍රයක් ගනුකැමති යම් මහණෙක් ගෙය තුළට ප්‍රවිෂ්ටව ඉදින් වස්ත්‍රයක්වීනම් ගණිමි. නූල්වීනම් නො ගණිමියි පිරිසිඳ අඳුරෙහි පසුම්බියක් ගණියි එහි ඉදින් වස්ත්‍රම වීනම් තුබූ තැනින් එසවීමෙහිම පාරාජිකා වෙයි. ඉදින් නූල්වීනම් පාරාජිකා නො වෙයි. පිටත ගෙණ හොස් පසුම්බිය මූද නූල් බව දැන නැවත ගෙණ ගොස් තැබුයේ වීනම් රුකෝ්මය. නූල්යයි දැනත් යමක් ලබන ලද්ද ඒ ගතයුතුයයි ගෙණ යේනම් දෙවෙනි පාදුද්ධාරයෙහි පාරාජිකා වෙයි. බිම තබා නූල්බව දැනත් ගෙණයේ නම් තුබූ තැනින් එසවීම හා සමග පාරාජිකා වෙයි. පසුම්බිය තුළ බලන්නට ප්‍රථමයෙන් යමෙක් දැක සොරෙක සොරෙනැයි ලුහුබඳනා ලද්දේ දමායේ නම් රුකෙයි. හිමියෝ දැක ගණිත් නම් රුකෝ්මය. අන් කිසිවෙක් ගණීනම් බඩු දිය යුතු වේ. බඩු හිමියෝ තමාදැක වැළකුනු කල්හි මේ මා විසින් ගන්නා ලද්දේය. දැන් මා සන්තකය යි හන්නා ලද්දහු විසිනුදු බඩු දිය යුතු මය.

එහි ඉදින් වස්ත්‍රයෙක් වීනම් ගණිමැයි මේ ආදි ක්‍රමයෙන් පැවැත්තාවූ යම් ඒ පිරිසිදීමෙක් ඇද්ද මේ තෙම භණ්ඩ පරිකප්ප නම් වේ ඕකාශ පරිකප්පය වනාහි මෙසේ දතයුතු යි. සමහර මහණෙක් පිරිවෙන් ආදියට ප්‍රවිෂ්ටවූයේ කිසියම් ලොභකටයුතු බඩුවක් දැක ගබ්භචාර පමුඛ හෙට්ඨා පාසාද, වාරකොට්ඨක රුක්ඛමූලාදි වශයෙන් පිරිසිඳ ඉදින් මා මේ අතුරෙහි දකිත් නම් බලනු කැමැත්තෙන් රැගෙන ඇවිදින්නකු මෙන් දෙන්නෙමි. ඉදින් නො දකිත්නම් ගෙණයන්නෙමියි පිරිසිඳීද එසේ පිරිසිඳ ඒ බඩුව රැගෙන පිරිසිඳිනලද අවකාශය ඉක්මුණු පමණකින් ඕහට අවහාරය වේ. මෙසේ කියනලද ක්‍රමයෙන් පැවැත්තාවූ පරිකල්පයෙක් ඇද්ද මේ තෙම ඕකාස පරිකප්පනම් වේ. මෙසේ මේ දෙවැදෑරුම් පරිකල්පයන්ගේ වශයෙන් පිරිසිඳ ගන්නාහට වන්නාවූ අවහාරය තෙම පරිකප්පාවහාර යයි දතයුත්තේය.

ප්‍රතිච්ඡන්න කොට යමක් සොරකම් කිරීම පටිච්ඡන්නාවහාර නම් වේ. හේ මෙසේ දතයුතු. යම් මහණෙක් උද්‍යානාදියෙහි

වැටීතුබූ අඞගුලි මුද්‍රිකාදී අනුන්ගේ යම්කිසි බඩුවක් දැක පසුව ගන්නෙමැයි පස්වලින් හෝ පත්‍රයකින් වසාද මෙපමණකින් තුබූ තැනින් එසවීමක් නැති හෙයින් තවම අවහාරය නො වෙයි. යම්කලෙක්හි වනාහි හිමියෝ සොයන්නාහු නො දැක සෙට බලාගණ්ණම්හයි ආලය සහිතව ගියාහු වෙත්ද නැවත ඒ බඩුව තුබූ තැනින් ඔසවා ගන්නාහට එසවීමෙහි අවහාරය වේ.

වසන ලද කාලයෙහි ම මේ මාසන්නකායයි සංඥවෙන් වසන ලදහට ද අවහාරයවේ. දැන් වනාහි ඔව්හු ගියහ. ඒම් දමනලද බඩුව යයි පාංශුකූල සංඥවෙන් ගන්නාහට වනාහි බඩු දිය යුතුමය. දෙවෙනි දින පරීක්ෂාකොට නො දැක ආලය හැරගිය කල්හිදු ගන්නා ලද්දේ බඩු දිය යුතුමය. පසුව දැන ඉල්වනු ලබන්නේ නොම දෙන්නාහට බඩු හිමියන් ගේ ආලය හැරීමෙන් අවහාරය වෙයි. කවර හෙයින්ද? ඔහුගේ ප්‍රයෝගයෙන් යම් හෙයකින් ඔවුන් විසින් නො දක්නා ලද්දේද එහෙයිනි. යමෙක් වනාහි ඒ ප්‍රකාර තුබූ බඩුවක් තුබූ තන්හිම නො වසා සොර සිතින් පසින් පාගා මඩෙහි හෝ වැල්ලෙහි හෝ යටකෙරේද එසේ යට කළ කෙණෙහිම අවහාරය වේ. මේ පටිච්ඡන්නාවහාරයයි

කුසපත් මාරුකොට සොරකම් කිරීම වනාහි කුසාවහාර නම්වේ. ඒ මෙසේ දතයුතු යම් මහණෙක් හුණබට ආදී පතුරුමයවූ හෝ තල්කොලමයවූ හෝ කරණලද සලකුණු ඇති කුසපත් හෙළා සිවුරු බෙදනු ලබන කල්හි තමාගේ කොට්ඨාසයට ලඟතුබූ අගය වශයෙන් සම සම අගය ඇත්තාවූ හෝ වැඩි අගය ඇත්තාවූ හෝ අඩු අගය ඇත්තාවූ හෝ අන්‍යයාගේ කොටස ගන්නා කැමතිව තමාගේ කොටසෙහි දමනලද කුසපත අන්‍යයාගේ කොටසෙහි දමනු කැමතිව කුසපත තුබූ තැනින් ඔසවා අන්‍යයාගේ කොටසෙහි හෙළාද ඒතාක් රැකේමය. යම් කලෙක්හි වනාහි අන්‍යයාගේ කොට්ඨාසයෙන් අන්‍යයාගේ කුසපත තුබූ තැනින් ඔසවා ද එසෙවි කෙණෙහිම අවහාරයවේ. ඉදින් පළමුවෙන් හෝ අන්‍යයාගේ කොටසින් තමාගේ කොටසෙහි හෙළනු කැමතිව අන්‍යයාගේ කුසපත ඔසවා තමාගේ කොටසෙහි හෙළාද. ඒතාක් රැකෙයි. තමාගේ කොටසින් තම කුසපත ඔසවන්නාහට එසවීමෙහි රැකෙයි. එය ඔසවා අන්‍යයාගේ කොටසෙහි හෙළන්නාහට අතින් මිදුනු කෙණෙහිම අවහාරයවේ. මේ කුසාවහාර නම්වේ.

යථෝක්ත පස්විසි අවහාරයෙහි ව්‍යක්තවූ විනයධරයා විසින් සඟ මැදට බට චෝදනා සංඛ්‍යාතවූ වස්තුව වහා විනිශ්චය නොකොට කාරණා පසක් බැලියයුත්තාහුය. ඒ කාරණා පසනම්:–

වස්තුය, කාලය, දේශය, අර්ඝය, පරිභෝගය යන මේ පසයි.

එහි වස්තු නම්:– බඩුවය, අවහාරකයා විසින් මෙනම් දෙයක් මාවිසින් සොරසිතින් ගන්නා ලද්දේයයි කී කල්හිදු ආපත්ති ආරොපණය නොකොට එම බඩුව සස්වාමිකද අස්වාමිකදැයි පරීක්ෂා කටයුත්තේය. සස්වාමිකයෙහිදු වස්තු හිමියන්ගේ ආලය සහිත බව හෝ නිරාලයබව හෝ පරීක්ෂා කටයුත්තේය. ඉදින් ඔවුන්ගේ ආලය සහිත කාලයෙහි ගන්නා ලද්දේ නම් බඩුව අගයකොට ආපත්ති ආරොපණය කටයුත්තේය. නිරාලය කාලයෙහි නම් පාරාජිකාපත්ති ආරොපණය නොකටයුත්තේය. බඩුව හිමියන් විසින් ඉල්වනු ලබන කල්හි දියයුත්තේය.

මේ කාරණය දක්වනු පිණිස මේ කථා වස්තුවයි:–

භාතික රජකාලයෙහි ථූපාරාම මහා චෛත්‍යය පුදන පිණිස එක් මහණෙක් සත්රියන් පඬුවන් කසාවතක් අංශයෙහිකොට දාගැබ් මළුවට ප්‍රවිෂ්ටවූයේය. එවේලෙහිම රජ්ජුද චෛත්‍යය වඳනා පිණිස ආයේය. ඉක්බිති ජනයා ඉවත් කිරීම පවත්වනු ලබන කල්හි මහජනයාගේ ඇළලීම වූයේය. ඉක්බිත්තෙන් ඒ මහණ තෙම මහජනයාගේ ඇළලීමෙන් පීඩිතව උරයෙන් වැටෙන්නාවූ කසාවත නොදැකම නික්මුණේය. නික්ම කසාවත නොදක්නේ මෙබඳු ජනසම්බාධයෙහි කවරෙක් කසාවත ලබන්නේද? ඒ කසාවත මතු මට නොලැබෙන්නේ යයි නිරාලයව ගියේය. නැවත අනික් මහණෙක් පසුව එන්නේ ඒ කසාවත දැක සොර සිතින් ගෙණ නැවත විපිළිසරව දැන් මම අශ්‍රමණ වූයෙමි. එහෙයින් සිවුරු හරින්නෙමි යි සිත උපන් කල්හි විනයධරයන් විචාරා දැනගන්නෙමි යි සිතුයේය. එසමයෙහි සියලු පර්‍යාප්තිධරවූ විනයාචාර්‍ය්‍යයන්ට ප්‍රධානවූ චූලසුමන ස්ථවිර නම් එක් ස්ථවිර කෙණෙකුන් වහන්සේ මහා විහාරයෙහි වැඩවසනසේක. යටකී මහණ ඒ තෙරුන් වහන්සේකරා එළඹ වැඳ අවසර ලබාගෙන තම කුකුස විචාළේය. ඒ ස්ථවිරයන් වහන්සේ මහජනයා පහව ගියකල්හි පසුව අවුත් ඒ මහණහු විසින් කසාවත ගන්නා ලද බව දැන මෙහිඅවකාශයක් ඇතැයි සිතා ඉදින් කසාවත හිමි මහණහු කැඳවාගෙණ ආයෙහිවී නම් තොපට පිහිට කරන්ට හැකිවන්නේයයි කීසේක. වහන්ස! මම කෙසේ දකිම්දැයි ඇසිය ඒ ඒ තන්හි ගොස් බලවයි කීසේක. හෙතෙම පස්වා මහා විහාරයෙහිම බලා නුදුටුයේය. ඉක්බිත්තෙන් කවර දිශාභාගයකින් බොහෝ මහණහු එත්දැයි ඒ මහණහුගෙන් (මහතෙරුන් වහන්සේ) විචාළසේක. වහන්ස! දකුණුදිශාභාගයෙනැයි කීයේය

එසේ වීනම් දිග පුළුල මැන කසාවත තබා දකුණුදිශාභාගයෙහි විහාර පරික්ෂාකොට ඒ මහණහු කැඳවා එවයි කීසේක. හෙතෙම එසේකොට ඒ මහණ දූක මහතෙරුන් වහන්සේ සමීපයට කැඳවා ගෙණ ආයේය. මේ කසාවත තොපගේදැයි මහතෙරුන් වහන්සේ ඔහුගෙන් විචාළසේක. හෙතෙම් වහන්ස! එසේයැයි කීයේය. තොප විසින් කොතැන්හි දමනලද්දේදැයි විචාළසේක, හෙතෙම සියලු ප්‍රවෘත්තිය කීයේය. ඔහු විසින් කරණලද ධුරනික්ෂේපය මහතෙරුන් වහන්සේ අසා මේ කසාවත කොතැන්හි දූය තොප විසින් ගන්නා ලද්දේදැයි අතික් මහණහුගෙන් විචාළේය ඔහුද සියලු ප්‍රවෘත්තිය කීයේය. ඉක්බිති තෙරුන් වහන්සේ ඕහට මෙසේ කීසේක. ඉදින් තොප විසින් පිරිසිදු සිතින් ගන්නාලද වීනම් තොපට අනාපත්ති වන්නේය. සොරසිතින් ගත්බැවින් දුෂ්කෘතාපත්තියට පැමිණියෙහිය. එය දෙසා ආපත්තියෙන් මිදෙව. මේ කසාවත තමා සන්තකකොට මේ භික්ෂුවහටම දෙවයි කීසේක. එසේ වදාළේ ඔවුන්ගේ සැකදුරුවන පිණිසය කෙසේද? අවහාරක මහණහට මා විසින් සියඅතින් නොදෙන ලද හෙයින් මෝහට කසාවත දියයුතු යයි කුකුස් උපදනේය. අතික් මහණහට මා විසින් පළමු ධුරනික්ෂේපකොට පසුව නොදෙනලද කසාවත ගන්නා ලද්දේයයි කුකුස් උපදනේය. එහෙයින් එසේ වදාළසේක ඒ අවහාරක මහණතෙම අමෘතාභිෂිකත යක්හු මෙන් මහත්වූ අස්වැසිල්ලට පැමිණියේවිය.

මෙසේ චෝදනා සඞ්ඛ්‍යාත වස්තුව බැලියයුතුය.

කාලය යනු අවහාරකාලයයි එම බඩුව කිසියම් කාලෙක අගය අඩුවෙයි. සමහර කාලෙක අගය වැඩිවෙයි. එහෙයින් ඒ බඩුව යම් කාලෙක සොරසිතින් ගන්නා ලද්දේද ඒ කාලයෙහිම එහි යම් අගයක් ඇද්ද ඒ අගනා පමණින් ආපත්ති කටයුත්තීය. මෙසේ කාලය බැලියයුතුයි.

දෙශයනම්:- අවහාරය කළදෙශය වෙයි. ඒ බඩුව වනාහි යම් දෙශයෙක්හිදී සොරකම් කරණලදද ඒ දෙශයෙහි ඒ බඩුවෙහි යම් අගයක් ඇද්ද ඒ අගයෙන් ආපත්ති කටයුත්තීය. බඩුව උපදින දෙශයෙහි අගය අඩුවෙයි. සෙසුතන්හි බොහෝ අගනේ වෙයි. මේ අර්ථය දක්වන පිණිසද මේ කථාවස්තුවයි.

ලඞ්කාවීපයෙන් පිට දෙශයක වනාහි එක් මහණෙක් මනාවූ සටහන් ඇති නාලිකෙර ඵලයක් ලැබ ලියන කණ්දෙහි තගා සක්තළ තැටියක් හා සමානවූ සින්කළුවූ පැන්තළ තැටියක්

කොට එහිම තබා සැඟිරියට ගියේය. අන් මහණෙක් ඒ දෙශයට නොස් විහාරයෙහි වාසයකරන්නේ යටකී තළුතැටිය දුක සොරසිතින් රැගෙන සැඟිරියටම ආයේය. එහි කැඳ වළඳන්නාවූ ඔහුගේ ඒ තළුතැටිය දුක තළුතැටිය හිමි මහණතෙම තොප විසින් මේ තළුතැටිය කොතැන්හිදී ලබන ලදදූයි ඇසුයේය. හෙතෙම මා විසින් අනතර සමුද්‍රයෙන් ගෙණතලදූයි කීයේය. තළුතැටිය හිමි මහණතෙම තළුතැටිය තොපසතු නොවෙයි. තොප විසින් සොරසිතින් ගන්නා ලද්දේයයි සඟමැදට ඇදගෙණ ගියේය. එහිදු විනිශ්චයයක් නොලැබ මහාවිහාරයට ගියාහ. එහි අණබෙර කරවා රුවැන්මැලි මහසෑය සමීපයෙහි සඞ්ඝ සන්නිපාතයකොට විනිශ්චයාරම්භ කළහ. විනයධර ස්ථවිරවරු අවකාශය පැනෙව්වාහ. ඒ සඞ්ඝ සභායෙහි කාරණා කාරණා දැනීමෙහි සමර්ථවූ ආභිධර්මික ගොධස්ථවිර නම් තෙර කෙණෙක් ඇති විය. උන්වහන්සේ “මොහු විසින් මේ තලුතැටිය කොයින් ගෙණෙතලද දූයි විචාලසේක. අනතර සමුද්‍රයෙන් ගෙණෙන ලදූයි කීහ. එහි පොල්කටුවක් කෙතෙක් අගීදූයි විචාළසේක. කිසිත් නොඅගනේය. එහි පොල්ගෙඩිය බිඳ මද අනුභවකොට කටුව ඉවත්ලයි. ඒ කටුව වනාහි ගිනිදූල්වීම් සංඛ්‍යාතවූ දැරුකෘත්‍යය සිද්ධකෙරේයයි කීහ. මේ භික්ෂූහුගේ මෙහි හස්තකර්මය කෙතෙක් අගනේදූයි විචාළේය. මසක් හෝ මසකට අඩු ගණනක් අගීයයි කීහ. සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ මස්සෙහි හෝ මස්සට අඩුගණනෙක්හි හෝ පාරාජිකාපත්තියක් කොතැන්හිදී පණවන ලදදූයි ඇසූසේක. එකල්හි යහපත යහපත අධිකරණය මනාකොට කියන ලද්දේ යයි මහවෙහෙර සියලු තන්හිම ඒක සාධුනාදය වූයේය.

එසමයෙහි භාතිය රජතෙම චෛත්‍යය වඳිනු පිණිස නුවරින් නික්මෙනුයේ ඒ ශබ්දය අසා මේ කිමෙක්දූයි විචාරා සියල්ල පිළිවෙළින් අසා මං ජීවත්ව සිටිනාතුරු භික්ෂු භික්ෂුණීන්ගේද ගෘහස්ථයන්ගේ ද අධිකරණයන් ආභිධර්මික ගොධස්ථවිරයන් වහන්සේ විසින් විනිශ්චයය කරණ ලද්දේ මනාව විනිශ්චයය කරණ ලද වන්නේය. උන්වහන්සේගේ විනිශ්චයයෙහි නොසිටිනවුන්ට රාජාඥ කෙරෙම්යි නුවර බෙර ලැවුයේය.

මෙපරිදි වස්තුව උපන් දෙශය බැලිය යුතුයි.

අගඝ යනු බඩුවේ අගයයි. අලුත් බඩුවෙහි අගය වැඩි වෙයි. එය පසුව අඩුවෙයි. ඒ මෙසේයි:– අලුතෙන් සාදා ශුද්ධකරණ ලද පාත්‍රය කහවනු අටක් හෝ දශයක් හෝ

අගනේය. ඒ පාත්‍රයම සිදුරුවූයේ හෝ ඇණවලින් ගැටවලින් පිළියම් කරණලද්දේ අගය අඩුවෙයි. එහෙයින් හැමකල්හි බඩුව ප්‍රකෘති අගයෙන්ම ආපත්ති නොකටයුතුයි මෙසේ අගය බැලියයුතුයි.

පරිභොගො යනු බඩුවෙහි ප්‍රයෝජන ගැන්මය. ප්‍රයෝජන ගැන්මෙනුදු දෑහැටි දඬු ඈ සිඳින ආවුධ ආදි· භාණ්ඩ ජාති අගය අඩුවෙයි. එහෙයින් මෙසේ පරීක්‍ෂා කටයුතු යි. ඉදින් යම්කිසිවෙක් යම්කිසිවකුගේ මසු පසක් වටනා ආවුධයක් ගණීද එහිලා ආවුධය හිමියාගෙන් මෙසේ විචාළ යුතුයි මේ ආවුධය තොප විසින් කෙතෙක් මිළ කොට ගන්නා ලදද කියායි. වහන්ස ! මසු පසකැයි කියාද, තොප විසින් මිලදී ගත් සැටියේම නගා තබන ලද්දේ ද නොහොත් ප්‍රයෝජන ගත්තෙහි දැයි ඇසූ කල්හි මවිසින් එක්දිනක් දෑහැටි දණ්ඩක් හෝ පඬු හෝ බත්පිසන දර හෝ කපන ලද්දේය. නැවත මූවහත් තබා නගා තබනලදැයි කියා නම් ඒ ආවුධයෙහි අගය අඩුවූයේ යයි දතයුත්තේය. ආවුධයෙහි අගය යම්සේ ද එසේම අඳුන් පියල්ලෙහි හෝ අඳුන්කූරෙහි හෝ පිදුරුවලින් හෝ දහයියාවලින් හෝ ගඩොල්සුන්නෙන් හෝ එක්වරක් ගවා ශුද්ධ කළ පමණකින් අගය අඩුවෙයි.

ඊයම් මඩලය මකර දන්තයෙන් කැපීමෙන්ද ජලසාටිකාව එක්වරක් ඇඳීම් පෙරවීමෙන්ද පරිභොගවාරයෙන් උරෙහි හෝ හිසෙහි හෝ තැබීම් මාත්‍රයකින් ද සහල් ආදීන්ගේ පෙළීමෙන්ද එකක් එකක් පහකිරීමෙන් ද යටත් පිරිසෙයින් එක් කැටක්ද කැබලීත්තක්ද උඩරණය කොට දැමීමෙන්ද ගිතෙල් තලතෙල් ආදිය භාජනයෙන් භාජනයට වත්කිරීමෙන්ද යටත් පිරිසෙයින් එයින් මැස්සකු හෝ කුහුඹුවකු හෝ නිකුත් කොට දැමූ පමණකිනුදු උක්සකුරු පිඬෙහි ද අගය පිරිහෙයි. මිහිරි බැව් දැනගැන්මට නියෙන් විද ඉතා මදක් ගත් පමණකිනුදු උක්සකුරු පිඬෙහිද අගය බසී එහෙයින් පාදයක් අගනා යම්කිසි බඩුවක් කියනලද ක්‍රමයෙන් හිමියා විසින් ප්‍රයෝජන ගැණීමෙන් අගය අඩුකරණ ලද්දේවෙයි ප්‍රයෝජන ගැණීමට ප්‍රථමයෙන් පාදයක් මිලදීගත් බඩුවක් සොරකම්කළ මහණතෙම පාරාජිකාපත්තියෙන් වරද කරුවෙක් නොකරවිය යුත්තේය. මෙසේ අගය බැලියයුතුයි.

මෙසේ මේ කරුණුපස තීරණයකොට නොහොත් විමසා බලා නුවණැති මහණතෙම ආපත්ති හෝ අනාපත්ති හෝ ගරුකාපත්ති හෝ ලහුකාපත්ති හෝ වූ පරිද්දෙන් ආපත්තියෙහි පිහිටුවිය යුත්තේය. එයින් කීහු අට්ඨකථාචාර්යයෝ:-

1 සික්ඛාපදං සමන්තෙන- අඤ්ඤං කිඤ්චි නවිජ්ජති,
අනෙක නය වොකිණ්ණං-ගම්භීරත්ථ විනිච්ඡයං.

2 තස්මා වත්ථුම්හි ඔතිණ්ණෙ-භික්ඛුනා විනයඤ්ඤුනා,
විනයා නුග්ගහෙ නෙත්ථ- කරොන්තෙන විනිච්ඡයං.

3 පාළිං අට්ඨ කථඤ්චෙව-සාධිප්පාය මසෙසතො,
ඔගය්හ අප්පමත්තෙන-කරණීයො විනිච්ඡයො.

4 ආපත්ති දස්සනුස්සාහො-නකාතබ්බො කුදාචනං,
පස්සිස්සාමි අනාපත්ති-මිතිකයිරාථ මානසං.

5 පස්සිත්වාපිච ආපත්තිං-අවත්වාව පුනප්පුනං,
වීමංසිත්වා ථ විඤ්ඤූහි-සංසන්දිත්වාව තංවදෙ.

6 කප්පියෙපිච වත්ථුස්මිං-චිත්තස්ස ලහුවුත්තිතො,
වසෙන සාමඤ්ඤ ගුණා-චවන්තීධ පුථුජ්ජනා.

7 තස්මා පරපරික්ඛාරං-ආසීවිස මිවොරගං,
අග්ගිං වියච සම්පස්සං-ආමසෙය්‍ය විචක්ඛණොති.

නොඑක් නයින් ගැවසීගත්තාවු ගැඹුරුවූ අර්ථයෙන් හා විනිශ්චයයෙන් යුක්තවූ මේ අදින්නාදාන ශික්ෂාපදය හා සම්වූ අන්කිසි ශික්ෂාපදයෙක් විද්‍යමාන නොවන්නේය. එහෙයින් සඟ මැදට යම්කිසි වස්තුවක් බටකල්හි ඒ වස්තුව විනිශ්චයය කරන්නාවූ යම් විනය දන්නාවූ මහණෙකු විසින් විනයට අනුග්‍රහ කිරීම් වශයෙන් විදාළ පෙළ හා අටුවා කථාවද භගවත්හුගේ අභිප්‍රායටද සර්වප්‍රකාරයෙන් බැස අප්‍රමාදව විනිශ්චයය කටයුත්තේය. ආපත්ති දැක්මෙහි උත්සාහය කිසිකලෙකත් නොකට යුත්තේය. අනාපත්තියම බලමින් මෙසේ මෙහෙහි කරව්. ආපත්තියක් දැක ආපත්ති යයි නොකියා නැවත නැවත විමසා තවද නුවණැත්තවුන් හා, කථා සංසන්දනය කොට ම ආපත්ති යයි කියන්නේය. මේ ශාසනයෙහි පෘථග්ජන භික්ෂුහු කැප වස්තුවෙහිදු චිත්තයාගේ ලඝු ප්‍රවෘත්ති හෙයින් ශ්‍රමණභාවයෙන් චුතවෙත්. එහෙයින් නුවණැති භික්ෂුතෙම අනුන්ගේ පිරිකර

ඝෝරවූ විෂඇති සර්පයක්හුමෙන්ද ගිනිගෙන දිලිසෙන වහ්නියක්මෙන්ද ප්‍රඥා චක්ෂුසින් දකිමින් අල්වන්නේය.

උත්තරි මනුෂ්‍ය ධර්මාරෝචනය විනිශ්චය කරන්නහු විසින් වනාහි තොප විසින් කුමක් අධිගමය කරණ ලද්දේද කුමකැයි කියා අධිගමය කරණ ලද්දේද කවරකලෙක්හි අධිගමය කරණ ලද්දේද කොතැන්හිදී අධිගමය කරණ ලද්දේද කවර නම් කෙලෙශ කෙනෙක් තොප විසින් ප්‍රහීණ කරණ ලද්දාහුද? නෝ කවර ධර්මයන් ලබන සුළුදූයි මේ සවැදෑරුම්වූ කාරණයන් ශුද්ධ කටයුත්තාහුය. ඉදින් යම්කිසි මහණෙක් උත්තරි මනුෂ්‍ය ධර්මාධිගමය පහළ කරන්නේවීනම් හෙතෙම මෙපමණෙකින් සත්කාර නොකටයුතුය. මේ කාරණා සදෙන ශුද්ධකරණ පිණිස මෙසේ කිවයුතුයි. කිං තෙ අධිගතං යන්නෙහි කවර ධ්‍යානයක් නොහොත් විමොක්ෂාදීන් අතුරෙහි එක්තරා එකක් දූයි විචාරණ ලද්දේ යමක්හු විසින් යම් ධර්මයක් අධිගම කරණ ලද්දේද එතෙම ඔහට ප්‍රකටවෙයි. ඉදින් ධ්‍යාන විමොක්ෂාදීන් අතුරෙහි මෙනම් දෙයක් මා විසින් අධිගත යයි කියාද ඉක්බිත්තෙන් කවරෙක්හි තා විසින් අධිගතදූයි විචාළ යුතයි. අනිත්‍ය ලක්ෂණාදීන් අතුරෙහි කවරක් ධුරකොට අටතිස් අරමුණෙහි හෝ රූපාරූප අධ්‍යාත්මික බාහිරාදීවූ ප්‍රභෙද ඇති ධර්මයන් අතුරෙන් කවරක්හුගේ මුඛයෙන් අභිනිවෙශ කොට අධිගතදූයි විචාරණලද්දේ යමක්හුගේ යම් අභිනිවෙශයක් ඇද්ද හෙතෙම ඔහට ප්‍රකටවෙයි. ඉදින් මාගේ අභිනිවෙශය තෙම මෙනම්වෙයි. මෙසේ මා විසින් අධිගතයයි කියාද ඉක්බිත්තෙන් කවරකාලෙක්හි තොප විසින් අධිගතදූයි විචාළ යුතුයි.

කිමෙක්ද පූර්වාහ්නයෙහි ද නොහොත් මධ්‍යාහ්නාදී කාලයන් අතුරෙන් කවරකාලයෙක්හිදූයි විචාරණලද්දේ සියල්ලන්ටම තමන් විසින් අධිගත කාලය ප්‍රකටවෙයි. ඉදින් අසවල් නම් කාලයෙහි අධිගතයයි කියාද ඉක්බිත්තෙන් තොප විසින් කොතැන්හිදී අධිගතදූයි විචාළ යුතුයි. කිමෙක්ද දිවා ස්ථානයෙහිදීද නොහොත් රාත්‍රි ස්ථානාදීන් අතුරෙන් එක්තරා අවකාශයෙක්හිදී දූයි විචාරණ ලද්දේ සියල්ලන්ටම වනාහි තමන් විසින් අධිගත අවකාශය ප්‍රකටවෙයි.

ඉදින් අසවල් නම් අවකාශයෙහිදී මා විසින් අධිගත යයි කියා ද, ඉක්බිති තොපට කවර නම් ක්ලෙශ කෙනෙක් ප්‍රහීණ දූයි විචාළ යුතුයි. කිමෙක්ද ප්‍රථම මාර්ගයෙන් ප්‍රහීණ වන්නාවූ

කෙලෙශයෝද නොහොත් විතීය මාර්ගාදීන් අතුරෙන් එක්තරා මාර්ගයකින් ප්‍රහීණ වන්නාවූ කෙලෙශයෝ දැයි විචාරණ ලද්දේ සියල්ලන්ටම තම තමා විසින් අධිගතමාර්ගයෙන් ප්‍රහීණ කෙලෙශයෝ ප්‍රකටවෙත්. ඉදින් මට මෙනම් කෙලෙශයෝ ප්‍රහීණයහයි කියාද, ඉක්බිති යුෂ්මත්හු කවර ධර්මයන් ලාභීවෙහිදැයි විචාළ යුතුය. කිමෙක? ශ්‍රොත ආපත්ති මාර්ගයද නැතහොත් සකෘදගාමී මාර්ගාදීන් අතුරෙන් එක්තරා මාර්ගයක්දැයි විචාරණලද්දේ සියල්ලන්ටම වනාහි තම තමන් විසින් අධිගත ධර්ම ප්‍රකටවෙයි. ඉදින් මම් මෙනම් ධර්මයක් ලාභීවෙමැයි කියාද, මෙපමණකිනුදු ඔහුගේ වචනය නො ඇදහිය යුතුයි. කුමක්හෙයින්ද? උග්ගහ පරිපුච්ඡාවෙහි දක්‍ෂවූ බහුශ්‍රැත භික්‍ෂුහු මෙකී සකාරණ ශුද්ධ වශයෙන් කියනු හැකිවෙති. මේ භික්‍ෂුහුගේ වනාහි ආගම ප්‍රතිපත්ති තොමෝ ශුද්ධ කටයුත්තීය. ඉදින් ආගම ප්‍රතිපත්තිය නොපිරිසුදු ද මේ ප්‍රතිපත්තියෙන් ලොකොත්තර ධර්මයක් නම් නොලබන්නේ යයි පහ කටයුත්තේය.

ඉදින් වනාහි ඔහට ආර්යමාර්ගය අවබොධ වන්නාවූ පූර්වභාග ප්‍රතිපත්ති තොමෝ පිරිසුදුවන්නීද ඉදින් මහණ ඒ ප්‍රතිපත්තියෙහි පැණෙනු ලැබේ ද එහෙයින් බොහෝ කාලයක් ත්‍රිවිධ ශික්‍ෂායෙහි අප්‍රමාදවූයේ නිදිවර්ජිත කිරිමෙහි යෙදුනෝ චීවරාදී චතුර්විධ ප්‍රත්‍යයෙහි අලග්නවූයේ ආකාශයෙහි හසන (පසාරණ) සමවූ සිතින් වාසය කරන්නේය. ඒ මහණහුගේ ප්‍රකාශ කිරීම ප්‍රතිපදාව හා සංසන්දනය වේ. සමවේ. යම්සේ ගඞ්ගාදකය හා යමුනොදකය සංසන්දනයවේ ද සමවේද එපරිද්දෙන් ඒ භාග්‍යවත්හු විසින් ශ්‍රාවකයන්ට මනාකොට පණවන ලද නිර්වානගාමී ප්‍රතිපත්ති තොමෝ සංසන්දනය වෙයි. සමවෙයි. “නිබ්බානං ච පටිපදාවාති” යන මේ සූත්‍රයෙහි වදාරණ ලද්ද හා සමවෙයි. ක්‍ෂීණාශ්‍රව ප්‍රතිපත්ති හා සදෘශවූ ප්‍රතිපත්තිය වේ. එතකුදුවුවත් මෙපමණකිනුදු සත්කාර නොකටයුතුයි. කවර හෙයකින්ද? පෘථග්ජන සවභාව ඇත්තාවූ සමහරක්හුගේ ප්‍රතිපත්ති තොමෝ ක්‍ෂීණාශ්‍රවයාගේ ප්‍රතිපත්ති (සම) වෙයි. එහෙසින් ඒ මහණතෙමේ ඒ ඒ උපායෙන් භය ගැන්විය යුතුයි. ක්‍ෂීණාශ්‍රවයාහට වනාහි සෙනක් නමුදු මස්තකයෙහි වැටෙන කල්හි භයක් හෝ තැති ගැන්මක් හෝ ලොමු දැහැගැන්මක් හෝ නොවෙයි. පෘථග්ජනයාහට සවල්ප මාත්‍රයකිනුදු භයතැති ගැණීම් ආදිය වෙයි. මෙම අර්ථය දක්වන පිණිස මේ නිදර්ශන කථාවස්තූහු වෙති.

දීඝභාණක අභයස්ථවිර තෙම වනාහි එක් පිණ්ඩපාතික භික්ෂු කෙණෙකුන් පරීක්ෂා කොට ගතනොහැකිවූයේ තරුණ කාමිකට සංඥා කළසේක. හෙතෙම කැලණිගඟ ජලස්නානය කරන්නාවූ පිණ්ඩපාතික භික්ෂුහුගේ පාදය දියයට කිමිද ග්‍රහනය කෙළේය. එවිට පිණ්ඩපාතික තෙම කිඹුලෙකැයි සිතා මහා ශබ්ද කෙළේය. එවිට ඔහු පෘථග්ජනයයි දැනගත්හ

චන්ද්‍රමුඛතිස්ස රජුකල මහා විහාරයෙහි ක්ෂීණාශ්‍රවවූ සඞ්ඝ ස්ථවිරතෙම දුර්වල ඇස් ඇතිව විහාරයෙහි වැඩසිටිසේක. රජ තෙමේ ස්ථවිරයන් වහන්සේ පරීක්ෂා කෙරෙමියි සෙසු භික්ෂූන් පිඬු පිණිස වැඩිකල්හි නිශ්ශබ්දව පැමිණ සර්පයෙකුසේ ස්ථවිරයන් වහන්සේගේ පාදය අල්වාගත්තේය. ස්ථවිරතෙම ගල් ටැඹක්සේ නිශ්චලව තොපි කවරහුදැයි පිළිවිසිය. ස්වාමීනි මම තිස්ස නමැයි දැන්විය. තිස්සය අප සුගන්ධය වහනයවේදැයි කීසේක. මෙසේ ක්ෂීණාශ්‍රවයාහට භයක් නම් නැත්තේය.

ඇතමෙක් වූකලි පෘථග්ජනවූයේත් අතිසූරවෙයි. නිර්භීය වෙයි. හෙතෙම ඇළුම් කටයුතු අරමුණෙන් පරීක්ෂා කටයුත්තේය. වසභ රජ වනාහි එක් තෙරුන් වහන්සේ කෙණෙකු පරීක්ෂා කරණුයේ තිවෙසෙහි වඩා හිඳුවා උන්වහන්සේ සමීපයෙහි ඬෙබර එල ඇඹුල් හා කුළු බඩුයෙන් යොදා මහිමින් උන්නේය. මිණ තෙරුන් වහන්සේගේ මුඛයෙහි කෙල ඉනුයේය. ඉක්බිති තෙරුන්වහන්සේගේ පෘථග්ජන භාවය ප්‍රකටවිය. ක්ෂීණාශ්‍රවයාහට වනාහි රස තෘෂ්ණාතොමෝ සුප්‍රහීණය. දිව්‍ය රසයෙහිදු කැමැත්තක් නම් නොවෙයි. එහෙයින් මේ උපායවලින් පරීක්ෂා කොට ඉදින් ඔහට භයක් හෝ තැතිගැන්මෙක් හෝ රස තෘෂ්ණාවක් හෝ උපදීද, යුෂමත්හු රහත් නොවෙහියි පහ කටයුත්තේය. ඉදින් වනාහි එසේ පරීක්ෂා කරනු ලබන්නේ භයක් වෙව්ළුමක් තැතිගැන්මක් නැතිව සිංහයෙක්සේ නිර්භීතව හිඳීද දිව්‍යමය අරමුණෙහිත් තෘෂ්ණාවක් නූපදවාද මේ මහණ තෙම වෙය්යාකරණයෙන් සමන්විතය. හාත්පස රාජරාජ මහාමාත්‍යාදීන් විසින් එවන ලද සත්කාරයට සුදුසුයයි දතයුතුය. උත්තරි මනුෂ්‍ය ධර්මාරෝචනාපත්තිය මෙසේ විනිශ්චය කටයුතුයි.

සියළු නය විනිශ්චයෙහි දක්ෂ බව පතන්නහු විසින් සතර වැදෑරුම් විනය දතයුතුයි.

චතුබ්බිධං හි විනයං-මහාථෙරා මහිද්ධිකා,<br>
නීහරිත්වා පකාසෙසුං-ධම්මසඞ්ගාහකා පුරා.

පූර්වකාලයෙහි ධර්මසංග්‍රාහකවූ මහත් සෘද්ධි ඇති මහා ස්ථවිරයන් වහන්සේලා සතරවැදෑරුම් විනය තමන්වහන්සේලාගේ ඥානාලොකයෙන් ගෙණහැර දක්වූවාහුය.
කවර සිව්වැදෑරුම් විනයක්දයත්?

සූත්‍රය, සූත්‍රානුලොමය, ආචාර්‍යවාදය, අත්තනොමතිය යන සතරයි. යම් චතුර්විධ විනයක් වදාරණ ලද්දේද ඒ මෙහිලා දතයුතුවේ. කියන ලද මැයි. සූත්‍ර සඞ්ඛ්‍යාතවූ භගවත්හුගේ වචනයෙන්ද රසය යන සාමාන්‍ය ලක්ෂණයෙන්ද ධම්මසඞ්ගාහකාදි ආචාර්‍ය පරම්පරාවෙන් ගෙණ ආ අටුවාය යන ආචාර්‍ය වංශයෙන්ද අත්තනොමතියෙන්ද සාවශෙෂ නිරවශෙෂවූ අර්ථය සම්පටිච්ඡිතව්‍යය යන මේ භගවත්හු විසින් ඛන්ධකපාලිවාදි ස්ථානය විරාත් සමුට්ඨානය පඨවිධාතුයෙන් පැහැර වදාළසූත්‍රය කැමැතිවන ලදී. රසයයි සූත්‍රානුලොමය කැමතිවන ලදී. ආචරිය රසයයි අට්ඨකථා තන්තිය කැමතිවන ලදී. අධිප්පාය යයි අත්තනොමතිය කැමතිවන ලදී.

චතුර්විධ විනය දක්වූ තන්හි සුත්තනම් සියලු විනය පිටකයෙහි පෙළය. සූත්‍රානුලොමය නම් භාග්‍යවත්හු විසින් මේ මතු කියන පරිදි වදාරණලද යම් විනය විනිශ්චය පිහිටන ස්ථානවූ සතරමහාපදෙශ කොණෙක් ඇද්ද ඒ සතරමහාපදෙශයෝ සූත්තානුලොම නම්හ. නොහොත් අකැපයයි හෝ කැපයයි හෝ උපන් සැකය විනිශ්චය කොට ගන්නට භාග්‍යවත්හු වදාළ මහාපදෙශයෝ සතරදෙන සූත්‍රානුලෝම නම්හු -පෙ- ඒ තොපට කැපයයි වදාළ ස්ථිර කාරණයෝයි. එහි "යං භික්ඛවෙ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො න කප්පති" යන මේ පළමුවන මහා පදෙශයෙහි පටික්ඛිත්තවූ මනුෂ්‍යමාංසාදිවූ දස මාංසවත් සතුන්ගේ ඇට සම් නහර ලේ කෙස් ලොම් ආදිය අකැපයයි අප්පටික්ඛිත්තවූයේද අකප්පියවූ මාංශයට අනුලොම් වෙයි. අකැපයට අනුලොම්වීමෙන්ම කැපදෙය පිළිබහානුයි. අටුවාවෙහි පටික්ඛිත්තය. "යං භික්ඛවෙ මයා ඉදං න කප්පතීති අප්පටික්ඛිත්තං තං චෙ කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති තං වො කප්පති" යන මේ දෙවෙනි මහා පදෙශයෙහි අකප්පියමාංස ඇති සතුන්ගේ ඛීරදධි සප්පි නවනීතාදිය අකැපයයි අප්පටික්ඛිත්තවූයේද කැපයට අනුලොම්වෙයි. කප්පියානුලොම බැවින්ම අකැපය පිළිබහානුයි. අටුවාවෙහි කැපයයි අනුදන්නා ලදී.

යං භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චෙ අකප්පියං අනුලොමෙති කප්පියං පටිබාහති තං වො න කප්පති" යන මේ තුන්වන මහාපදෙසයෙහි නාළිකෙරාදිවූ නවමහා ඵල යන්ගේ පානය කැපයයි අනුනොදන්නා ලද්දේ ධඤ්ඤානුලොමික ඵලයන්ගේ පානයද අකැපයට අනුලොම්වෙයි. අකප්පියානුලොම් බැවින්ම කැප පිළිබහානුයි. අටුවාවෙහි නොවේලෙහි වළඳන්නට අකැපයයි පිළිකෙව් කරනලද්'

"යං භික්ඛවෙ මයා ඉදං කප්පතීති අනනුඤ්ඤාතං තං චෙ කප්පියං අනුලොමෙති අකප්පියං පටිබාහති තං වො කප්පති" යන මේ සතරවන මහාපදෙසයෙහි වෙත්‍ර ඵලාදීන්ගේ පානය කැපයයි අනුනොදන්නා ලද්දේද කැප පානයට අනුලොම්වෙයි. කප්පියානුලොම බැවින්ම අකැප නාළිකෙර පානාදිය පිළිබහානුයි. අටුවායෙහි අනුදන්නාලදැයි කියා මෙසේ මේ සාමාන්‍ය ලක්ෂණයන් සතරදෙන බුදුන් කැපයයි ද අකැපයයි ද වදාළ සූත්‍රයට අනුලොම්වෙයි සලකා තමාගේ නුවණින් මහාපදෙස යන් තදනුරූපවූ අර්‍ථය උදුරාගෙන උපන් සැකය නිශ්චයකොට ගන්නට මහත් කාරණානුයි. මහාපදෙස නම්වූහයි දතයුතු.

ආචරිය වාදය නම් කවරේ ද? ධම්මසඞ්ගාහකයෙහි පළමු වන ධර්‍මසඞ්ගාහක කාශ්‍යපාදි පන්සියයක් රහතුන් විසින් සඞ්ගායනා කොට තුබූ විනය සූත්‍රාන්තාභිධර්‍ම පාළියෙන් වෙන්වූ ප්‍රස්තාවානුරූප කොට ඒ ඒ අර්‍ථයට දෙශනා සංඥවෙන් වදාළ විවිධාකාර අර්‍ථනිශ්‍රය වශයෙන් ප්‍රවෘත්තවූ අට්ඨකථාවය යන ප්‍රකීර්‍ණක දෙශනාවද ථෙරියවාද නම්වේ.

අත්තනොමති නම් කවරක්ද? සූත්‍රාදියෙහි මෙන් අත්තනොමතියෙහි වෙසෙසා නොදක්වන ලද බැවින් පාළිය සතර මහා පදෙසය අටුවා යන මූලුල්ල හැරදමා තමාගේ සූත්‍රාදිය අනුව ගිය සූත්‍රාදියෙන් ලැබෙන නය ගැන්මෙන් තමාගේ ඥණයට වැටහුනු අාකාරය කීම අත්තනොමති නම්වේ. අතික් ලෙස කුදු ඇති සූත්‍ර අටුවා අභිධර්‍ම අටුවා විනය අටුවා යන මෙහි ආවාවූ ත්‍රිපිටක චූලාභයාදි සියලු තෙරුන්වහන්සේලාගේ වාදය අත්තනොමති නම් වෙයි දතයුතු. දැන් එහි පිළිපැදියයුතු ආකාර දක්වනසේක්. "තත්‍ථ පන අත්තනොමතියං ගහෙත්වා"යි වදාළසේක. විනය විනිශ්චය ස්ථානයෙහි ඒ අත්තනොමතිය ගෙණ කියන්නහු විසින් වනාහි ගත්දෙයම දැඩිකොටගෙණ ව්‍යවහාර කටයුතු නොවේ. තමා විනිශ්චය කරන කාරියට

කාරණය සලකා තමා සැලකූ අර්ථය හා පාළිය පෙළ හා අර්ථය සංසන්දනය කොට කියයුතුය. අත්තනොමති තොම අටුවා යෙහි (අටුවා අර්ථයෙහි) නුවණින් බහාලිය යුතුයි. ඉදින් එයට වදීනම් ඒ හා සමවේ නම් අත්තනොමති තොමෝ ගතයුත්තීය. ඉදින් වදනට නිසිනොවන බැවින් නොවදී නම් සමනොවේ නම් ඒ අත්තනොමතිය ගතයුතු නොවෙයි. (සබ්බදුබ්බලා) පුද්ගලයාගේ සයං පටිභාණයක් හෙයින් මේ අත්තනොමති තොමෝ සවකීය මතයෙහි සුත්ත සුත්තානුලොම ආචරියවාද යන හැමටම දුර්වලවන්නීය. එසේහෙයින් යටකී ආකාරයෙන් එහි පිළිපැද්දයුතු අත්තනොමතියට වඩා අටුවා ඉතා බලවත් වන්නීය. ආචරිය වාදයද සතරමහාපදෙශයෙහි නුවණින් අනු ප්‍රවෙශ කටයුතු. -පෙ- සුත්තානුලොම සඞ්ඛ්‍යාතවූ සංසන්දනය නොවන ප්‍රමාද පාඨවූ අටුවා නොගතයුතුය.

සතරමහාපදෙශය ද බුද්ධභාෂිත සූත්‍රයෙහි නුවණින් ප්‍රවේශ කටයුතුයි. ඒ සූත්‍රයෙහි වදනාමවූ ඒ හැගෙන්නාවූම සුත්තානු ලොමය ගතයුතුයි. මෙසේ කීමේ "සමෙන්තමෙව ගහෙතබ්බං" යන වචනයෙන් සූත්‍රයෙහි මේ කැපය මේ නොකැපයයි වෙසෙසා වදාළ අර්ථය හා සුත්තානුලොම නම්වූ මහාපදෙශයෙන් තමා විසින් උද්ධරිත අර්ථය හැගෙන පරිද්දෙන් උදුරා විනිශ්චය කටයුතුයයි දක්වන ලදී.

කිසිවක් මේ කැපය මේ නොකැපයයි සූත්‍රයෙහි කිවා මෙන් වෙසෙසා කී සාමාන්‍ය ලක්‍ෂණවූ සතරමහාපදෙශයට වඩා කප්පියා කප්පිය වෙසෙසා වදාළ ආහච්ච භාෂිතවූ "ආහච්ච පදනහි සුත්තං අධිප්පෙතං" සූත්‍රයම ඉතා බලවති. මේ කැපය මේ නො කැපයයි වෙසෙසා වදාළ සූත්‍රය පරිමාණය නො කටහැකි මේ කාරක සඞ්ඝ සදෘශ සූත්‍රයෙහි කී හැම පමණ බැවින් සංගීති කාරක සඞ්ඝයා හා සදෘශ වේ. ජීවමාන බුදුන් හා සමය මේ කැපය මේ නො කැපයයි ආහච්ච භාසිත සූත්‍රය කීකල බුදුන් කීවාතම්වේද එහෙයිනි. දැන් සවමතයෙහි හා පරමතයෙහි භික්ෂූන් දෙදෙනෙකු විනය සාකච්ඡා කරණ කාල යෙහි ඒ සුත්ත සුත්තානුලොම ආචරියවාද අත්තනොමතියෙහි පිළිපැද්දයුතු ආකාර දක්වන්නට "යදා" යනාදිය වදාළසේක. යම්කලෙක ස්‍වකසමයෙහි හා පරසමයෙහි භික්ෂූන් දෙදෙනෙක් එක්ව සවකීයවූ ථෙරවාදය. ඇති මහණ සූත්‍රයන් ගෙන කියාද අන්‍ය නිකාය වැසි මහණෙක් තම නිකායෙහි සතරමහා පදෙශය ගෙණ ව්‍යවහාර කෙරේ ද මෙසේ භික්ෂුහු දෙදෙනෙක්

විනය කථාව එක්ව කරද්දී ඒ දෙදෙනා විසින් ඔවුනොවුන්ට තාගේ බසින් ප්‍රයොජන කිමෙක් දැයි වෙෂයක් හෝ මේ බාලයා කුමක්කියාදැයි ගර්හාවක් හෝ නොකට පරවාදීහු කී සුත්තානුලොමය සකවාදීහු කී සූත්‍රයෙහි නුවණින් බහාලිය යුතුයි. ඉදින් තමාගේ සූත්‍රයෙහි බසීනම් සූත්‍රාර්ථය හා සමවේ නම් පරවාදීහු කී සුත්තානුලොමය ගතයුතුය. එසේවීනම් සකවාදීහු විසින් තමාගේ සූත්‍රයෙහි නොබස්නා සූත්‍රය හා සමානව පරවාදීහු එළවූ සුත්තානුලොමය නොගතයුතු. සකවාදීහු විසින් තමාගේ සූත්‍රයෙහිම සිටියයුතු. සූත්‍රයෙහි වදාළ දෙය ගතයුතු. නැවතත් මේ සකවාදී තෙමේ මහා විහාරවාසීවූ ථෙර වාදය කියන මහණ හැමවාරයෙහිම සකවාදී නමැයි ගතයුතු. තමාගේ ථෙරවාදයෙහි සූත්‍රය ගෙණ කියා නම් අන්‍ය නිකාය වාදය අපගේ සමය ද දන්නා අතික් මහණතෙමේ මේ අපගේ අටුවා ගෙණ කියානම් කෙසේදයත්? "සුඞ්කං පරිහරතීති එත්ථ උපචාරං ඔක්කමිත්වාකිඤ්චාපි පරිහරති අවහාරො එවාති කුරුන්දට්ඨකථායං වුත්තං" යන මේ ආචාර්‍යවාදය ගෙණ කියා නම් ඒ සකවාදී පරවාදී දෙදෙනා විසින් ද ඔවුනොවුන්ට තාගේ බසින් ප්‍රයෝජන කිමෙක්දැයි ක්ෂෙපයක් හෝ (දමාලා බිණීම ක්ෂෙපන මැයියෙත්) මේ බාලයා කුමක් කියාදැයි ගර්හාවක් හෝ නොකොට අටුවා සූත්‍රයෙහි නුවණින් බහාලිය යුතුයි. ඉදින් සූත්‍රය අර්ථය හා සමද අටුවා සූත්‍රයට බසීනම් සමවේ නම් ගතයුතු. සූත්‍රයට නොබස්නාවූ ද. සූත්‍රාර්ථය හා සම නොවන්නාවූද "ගාරය්හා චරියවාදෙ න ගහෙතබ්බොයි" කී අර්කථා වාදයම පමණ බැවින් පෙරකී අට්ඨකථා පමණ නොවන බැවින් ගර්හා කටයුතු අටුවා වාදය නොගත යුතුයි. පරවාදීහු කී "කුරුන්දට්ඨකථායං වුත්තං" යන මේ ආචාර්‍යවාදය "සුංකං පරිහරති ආපත්ති දුක්කටස්ස" යන මේ සූත්‍රයෙහි බහාලිය යුතුයි නුවණින් බහාලන කල සූත්‍රයෙහි දුක්කෘතය වදාළ බැවින් එම සුඞ්කඝාත කථාවෙහි පසුව කී මහා අටුවා වාදයෙහි ද දුකුළාම වදාළ බැවින් ද අටුවා වාදය සූත්‍රාර්ථය හා නො සමනුයි. ගාරය්හාචරියවාද නම්විය. ඒ නො ගතයුතුයි. සූත්‍රයෙහි වදාළ දුකුළාවෙහිම සිට සූත්‍රයෙහි සිටීම කටයුතුයි.

මෙසේ පරවාදී තෙමේ අපගේ මේ මහා විහාරවාසීවූ ථෙර වාදය කියන සකවාදීහු එළවූ අපගේ මතයෙහි සුත්තානුලොම ආචරිය වාද අත්තනොමති යන මේ ලිදුරණු කැමැත්තේ තමාගේ මතය සුත්තාදිය හෝ එළවයි අපගේ මතයෙහි ආචරියවාදදිවූ දෙය නො ගතයුතුයයි කීවාහු එළවයි දතයුතු.

“ධම්මසිරි ත්ථෙරෙපන එත්ථපරෙහි වුත්තො අඤ්ඤනිකායි කොසො” යනු වජිරබුද්ධි ටීකායි. මෙසේ සාකච්ඡාවාරයෙහි අසම්මෝහය පිණිස වාරවවත්ථානය දතයුතු. පරවාදීහු සුත්තානු ලොමය ගෙණ කියන වාරයෙහිද ආචරිය වාදය ගෙණ කියන වාරයෙහිද අත්තනොමතිය ගෙණ කියන වාරයෙහිද සකවාදීහු සූත්‍රයම ගෙණ කී:–

පරවාදීහු සූත්‍රය ගෙණ කියන වාරයෙහිද ආචරිය වාදය ගෙණ කියන වාරයෙහි ද අත්තනොමතිය ගෙණ කියන වාර යෙහි ද සකවාදීහු සුත්තානුලොමයම ගෙණ කී. පරවාදීහු සූත්‍රයම ගෙණ කියන වාරයෙහි ද සුත්තානුලොමය ගෙණ කියන වාරයෙහි ද අත්තනොමතිය ගෙණ කියන වාරයෙහි ද සකවාදීහු ආචරිය වාදයම ගෙණ කී. පරවාදීහු සූත්‍රයමගෙණ කියන වාරයෙහි ද සුත්තානුලොමය ගෙණ කියන වාරයෙහි ද ආචරිය වාදය ගෙණ කියන වාරයෙහි ද සකවාදීහු අත්තනො මතියම ගෙණ කී.

මේ සාකච්ඡාවාරයෙහි සකවාදි පරවාදි දෙදෙනා සූත්‍රයම ගෙණ කියන සමාන ජාතිකයන්ගේ වශයෙන් වාරයද නො කියන ලද දෙදෙනාම අත්තනොමතිය ගෙණ කියන සමාන ජාතිකයන්ගේ වශයෙන් වාරයද නො කියනලදූයි දතයුතු. පරවාදීහු තමාගේ මතයෙන් එළවා කී සූත්‍රය සකවාදීහු තමාගේ සතරමහාපදෙශයෙහි නුවණින් බහාලිය යුතුයි. ඉදින් බසී නම් සාමාන්‍ය ලක්ෂණවූ සතරමහාපදෙශයෙන් උදුරාගත් අර්ථය හා සමවේ නම් උන් කී සූත්‍රය හා සමවේනම් තුන් සඞ්ගා යනාවටම නැගූ පිටකත්‍රය පාළියට නැගේ නම් පෙණේ නම් ගතයුතුයි.

‘සුත්තානුලොමතො සුත්තමෙව බලවතරන්ති ඉදං සකම තෙයෙව සුත්තං සන්ධාය වුත්තං, තත්ථ සකමතපරියාපණ්ණ මෙව සුත්තාදිං සන්ධාය අත්තනොමති සබ්බදුබ්බලා අත්තනො මතිතො ආචරියවාදො බලවතරො ආචරියවාදතො සුත්තානු ලොමං බලවතරං සුත්තානුලොමතො සුත්තමෙව බලවතරන්ති ච වුත්තං.”

තුන් සංගීතියෙන් පිටත් සූත්‍රයෙක් හෝ වේද අනික් ගර්හා කටයුතු සූත්‍රයෙක් හෝ වේද, වෙස්සන්තර මහා සඞ්ඝික නිකාය වාසීන්ගේ ගුළ්හ වෙස්සන්තර නම්වූ ගුළ්හ විනය නම්වූ ගුළ්හ වෙදල්ලනම් ආදිවූ එක්තරා අන්‍ය නිකායික සූත්‍රයෙන් එළවූ

සූත්‍රයක්වී නම් නොගතයුතු. ආචරියවාද ගහනයම බලවත් කටයුතු. යටකී ඇමතන්හිම තාගේ බසින් ප්‍රයොජන කිම්දැයි දමාලා බිණීමෙක් හෝ මේ බාලයා කුමක්කියාදැයි ගැහීමක් හෝ නො කටයුතුයි.

මේ විනය සාකච්ඡාවෙහි පිළිපැද්දයුතු විධියයි.

දැන් සකවාදි පරවාදි දෙදෙනාගේ කප්පියා කප්පිය භාවය නිසා වාදය උපන් කල්හි පිළිපැද්දයුතු විධි දක්වන පිණිස "අථපනායං කපපියනති" යනාදිය කී. නැවත මේ මහා විහාර වාසිවූ ථෙරවාදය! කියන සකවාදි තෙමේ කැපයයි ගෙණ කියයි. පරවාදී (අන්‍ය නිකායවාසී) මහණතෙම ඕහට කැප යයි ගත්දෙය අකැපයයි ගෙණ කියයි. සකවාදීහු විසින් තමාගේ සූත්‍රයෙහිද තමාගේ සතරමහාපදෙශයෙහි ද නුවණින් බහාලිය යුතුයි. සූතත සුතතානුලොමයෙහි බහා විමසන්නහුට කැපව වැටහේ නම් ඉදින් කැපවී නම් කැපයෙහි සිටිය යුතුයි. ඉදින් අකැපවී නම් අකැපයෙහි සිටිය යුතුයි.

නැවත ද මේ සකවාදී තෙමේ තමා කැපයයි ගත් කප්පියයාගේ කැප බව තමාගේ ථෙරවාදයෙහි සූත්‍රයෙන් ගෙණ හැර කාරණාද විවිධ වූ නිශචය ද දක්වා ද පරවාදි කාරණා නො ලබා ද කැපයෙහි ම සිටිය යුතුයි. නැවත පරනිකායවාසී පරවාදී තෙමේ ඒ සකවාදීහු කැපයයි කී කප්පියයාගේ අකැප බව සාදන්නා වූ තමාගේ පරමතයෙහි සූත්‍රයෙන් ගෙණහැර බොහෝ කාරණා ද විනිශචයද දක්වා ද මේ සකවාදීහු විසින් තමාගේ කපපිය ගහණයවේදැයි දැඩිකොටගෙණ නොසිටිය යුතු තමාගේ සූත්‍රාදියෙන් කාරණාද විනිශචයද නොලැබෙන සකවාදීහු විසින් පරමතයෙන් ගෙණහැර කී කාරණා විනිශචයය යහපතැයි පිළිගෙණ අකැප බැවී හිම සිටියයුතු.

නැවත සකවාදි පරවාදි යන දෙදෙනාහට ම කප්පියභාවූ සාධකවූ කාරණා පටිරූපකය (කාරණා වැනි දෙයක්ව) පෙණේ නම් කැපයයි ගැන්ම ප්‍රතික්ෂෙප කළ බවම මැනවැයි අකැප යෙහි සිටියයුතු. විනය විචාරයට පැමිණ ගරුක භාවය යන අකප්පිය භාවයෙහිම සිටියයුතු. "විනයං පත්වාපි වුත්තමෙවත්ථං පාකටතරං කත්වා දසෙසනෙතා ආහ. කප්පියා කප්පිය විචාරණං ආගමමාති" යනු ටීකා බැවින් කැපය යන විචාරයකට ද අකැපය යන විචාරයකට ද පැමිණ ලජ්ජිහු විසින් කැපයයි හෝ අකැපයයි හෝ නිශ්චයකොට ගන්නට බැරිවූ විනිශ්චයක් ඇතිකල්හි කැපයයි ගන්නවුන්ගේ ගැන්ම වැළකිය යුතුයි. අකැපයයි ගන්නවුන්ගේ ගැන්ම තර කටයුතුයි.

නැවත නැවත කැපයයි පවත්වන්නවුන්ගේ කප්පිය ගහණය ශොතාය නොසිඳ පවත්වන කැපයයි ගැන්ම පසින්දයුතු. අකැපබවය යනවරම එහිමූ ලජ්ජීහු විසින් සිටිය යුතුයි. නැවත මේ සකවාදීතෙමේ අකැපයයි ගෙණ කියයි. පරනිකාය වාදී මහණ කැපයයි ගෙණකියා නම් සකවාදීහු විසින් සවමත යෙහි සූත්‍රයෙහි ද සතරමහාපදෙශයෙහි ද ඥානයෙන් බහාලිය යුතුයි. සූත්‍ර සූත්‍රානුලොමයෙහි බහා විමසන සකවාදීහට කැපවී නම් කැපයයි ගැන්මෙහි සිටියයුතු. ඉදින් අකැපවීනම් අකප්පිය ගහණයෙහි සිටියයුතු. සෙසස ආදි කී වාරයෙහි අර්ථ බලා දතයුතු.

සකවාදි පරවාදි දෙදෙනාහටම අකප්පියභාව සාධකවූ ද කප්පියභාව සාධකවූ ද කාරණා ප්‍රතිරූපකය පෙණෙත් නම් සකවාදීහු විසින් තමාගේ අකැපයයි ගැන්ම නොහැරිය යුතුයි. යම්සේ මේ කප්පියා කප්පිය විචාරයෙහි විනිශ්චයය කියනලදද අකප්පියයිද කප්පියයිද විචාරයෙහි නානාප්‍රකාරවූ විනය විචාරය කියනලදද එසේම සකවාදි අනාපත්තියයි ද පරවාදී ආපත්තී යයිද ගෙණ කරණ විවාදයෙහි ද සකවාදීහු ආපත්තියයි ගෙණ කරණ පරවාදිහු අනාපත්ති යයි කරණ විවාදයෙහිද සකවාදීහු ලහුකාපත්තීයයි ද පරවාදීහු ගරුකාපත්තියයි කරණ විවාද යෙහි ද විනිශ්චය යටකීලෙසම යොදා දතයුතුයි. මේ අනාපත්ති ආපත්තිවාදාදි විනිශ්චයෙහි නම් පමණකින්ම වෙනසවේ. යොජනා ක්‍රමයෙහි වෙනස නැති. එසේහෙයින් විස්තර නො කරන ලදී. යට කියනලද දෙය නිගමනය කරණසේක්. මෙතැනට ගෙණහැර දක්වා එහි පටිපජ්ජනක විධිය දක්වන සේක්. "එවං කප්පියා කප්පියාදි විනිච්ඡයො" යනාදිය වදාළසේකී.

මෙසේ යටකී ලෙස කප්පියයී කියාද අකප්පියයී කියාද මේ ආදි විනිශ්චයක් උපන්කල්හි සකවාදි පරවාදි දෙදෙනා අතුරෙහි යම්කිසි මහණෙක් බුදුන් වදාළ පාළිය අකප්පිය අකප්පියානුලොමය කප්පියය කප්පියානුලොමයය යන සතර මහාපදෙශය යන සාමාන්‍ය ලක්‍ෂණයෝ සතරදෙන ආචාර්‍ය්‍ය වාදයම සංගායනා කරණ මහා කාශ්‍යපාදි ආචාර්‍ය්‍යවරයන් ත්‍රිපිටක පාළිය සඞ්ගායනාවට කාරණාවූ ප්‍රකිර්ණක දෙශනා යන ආචාර්‍ය්‍යවාද නම්ලද අටුවාය. සූත්‍රාදිය අනුවගිය තමන්ගේ බුද්ධීන් සූත්‍රාදියෙන් ලැබෙන නය ගැන්මෙන් "උපට්ඨිතාකාර කථනය" යන අත්තනොමති සඞ්ඛ්‍යාතවූ සියළු ථෙරවාදයෙන්ද

මෙහි අධික කාරණයක් ලැබේද ලජ්ජීවූ සකවාදීහු විසින් ඔහුගේ වාදයෙහි සිටිය යුතුයි. සූත්‍රාදිවූ හැමදෙයින්ම වනාහි කාරණා ද විනිශ්චයද නොලබන සකවාදීහු විසින් සූත්‍රාර්ථය නොහැරිය යුතුය. සූත්‍රයෙහි කී අර්ථයෙහිම සිටිය යුතුයි.

මෙසේ ත්‍රිවිධ ශික්ෂාවන්ගේ අධිගමූපායවූ මෛථුන සංවර සඞ්ඛ්‍යාත සිකපදයෙහි කොසල්ලයද සික්ඛාපද විභාගනම්වූ පදභාජනියෙහි කොසල්ලයද යන සියළු විනය විනිශ්චයයෙහි දක්ෂතාවය පතන විනයධරයා විසින් මෙහි සියළු විනය විනිශ්චයෙහි සතරවැදෑරුම් විනය දන්නා ත්‍රිලක්ෂණ සමන්වාගත විනයධරතෙමේ සඟමැදට චොදක චුදිතක දෙදෙනා විසින් කියයුත්ත කීමෙන් වස්තුව බටකල්හිද කතවිතික්කම ඇති මහණහු තමාම තමාගේ සැකය කීකල්හි ද වස්තුය, මාතිකාය, පදභාජනියය, තිකපරිච්ඡේදය, අන්තරාපත්තිය, අනාපත්තිය යන මේ සතැන බලන නුවණැස ද ඒ ආපත්තිය ද අනාපත්තිය ද දෙශනාගාමිනී යයි ද උට්ඨානගාමිනී යයි ද සතෙකිච්ඡ යයි ද අතෙකිච්ඡ යයි ද ආපත්තියයි ද දන්නා නුවණ ද මේ සික්ඛාපද විභාගය සකල විනය විනිශ්චයෙහි කොසල්ල නමැයි දතයුතු.

මේ හැමතැන කොසල්ලයපතන විනයධරයා විසින් සූත්‍රය සූත්‍රානුලොමය ආචරියවාදය අත්තනොමතිය යන මේ සතර වැදෑරුම් විනය දතයුත්තුය. මේ සතරවැදෑරුම් විනය දන්න විනය ධර පුද්ගලයා විසින් තුන්ලකුණකින් යුක්තවියයුතුයි. ඒ එසේ මැයි. විනයධරයාගේ තුන්ලකුණු කෙණෙක් කැමතිවිය යුත්තාහ.

'යොහි භික්ඛු චතුබ්බිධ විනය කොවිදෙ තිලක්ඛණ සම්පන්නො ඉමානි ඡය්‍ය නානි ඔලෙකෙත්වා අධිකරණං වූපසමෙති තස්ස විනිච්ඡයො අප්පතිවත්තියො බුද්ධෙනසයං නිසීදිත්වා විනිච්ඡිත සදිසොහොති" යන මේ වචනයෙන් විනයධර උපසම්පන්න මහණම සඞ්ගාමාවචර නම්වූ අනුයුජ්ජකවෙයි කියන ලදී.

"ආචරිය පරම්පරා ඛොපනස්ස සුග්ගහීතා හොති සුමනසිකතා සූපධාරිතා" යන මේ විනයධර ලක්ෂණයෙහි "ආචරිය පරම්පරාති ආචරියානං විනිච්ඡය පරම්පරා තෙනෙව වක්ඛති යථා ආචරියො ච ආචරියා'චරියො ච පාලිංච පාලි පුච්ඡංච වදනාති තථා [illegible] ඤතුං වට්ටති" යන මේ වචනයෙන් ඇදූරුවන් තෙරවූ ලජ්ජිපෙසලයන් ගේ විනිශ්චය පරම්පරාව දැනගතයුතු. කෙසේදයත්?

“එවං මයං වදාම එවං නො ආචරියා වදන්ති” කියා විස්සජ්ජනය කරණු මෙසේ දත සුග්ගහිතවූ සුමනසිකත වූ සූපධාරිත වූ ආචාර්‍ය්‍යවරයන්ගේ විනිශ්චය කරන්නට සමර්ථවූ විනයධරම කියන ලද තුන්වන ලකුණෙන් යෙදුනු ඒ ඇදුරන්ගේ අන්තෙවාසිකවූ විනයධරයාගේ සාමාථ්‍යය සාමාථ්‍යය නම්. උන්ගේ අත්තනොමතියෙන් උපන් මත සනිටුහන් කිරිමයි.

කෙසේ ද? “නත්ථියෙව යං පාලියා අට්ඨකථාය ච නත්ථි තම්පි ආචරිය වචනෙන විනිච්ඡිතුං සමත්ථතාවුත්තා” යන ආචරිය පරම්පරා නම්වූ අත්තනොමති සංඛ්‍යාතවූ පෙළ අටුවාහි විනිශ්චය ක්‍රමයක් නැති හරුකච්ඡ වස්තුව බඳු එබඳු වස්තු විනිශ්චය කොට ගතහැකි ආචරිය වචනයෙනි, තවත් කෙසේවූදයත්? ‘අපදෙ පදං කරොන්තො විය ආකාසෙ පදං දස්සෙන්තො විය උපාලි ඉමං පඤ්හං කථෙසි බුදුහු වදාරන්ට තිබිවූ “අනාපත්ති ආවුසො සුපිනන්තෙනාතිනායහි අත්තනොමතියා ථෙරො එතදග්ගට්ඨානං ලභි’ යන මෙසේවූ ආචාර්‍ය පරම්පරාවෙන් විනිශ්චය කරන්ට සමර්ථ බව කියන ලද “අඤ්ඤෙ පබ්බාජෙනි උපසම්පාදෙති ජිනසාසනං වඩ්ඪෙති අහමෙතං නලභාමිකාතුං අප්පමාණෙසු සික්ඛාපදෙසු සම්පන්නකාරිනා භන්තෙ සු වත්තාමි” යන මේ කාරණයෙන්ද ගිහි සොතාපන්න උපාසකයා නො ලබන පවත්ලිය නොහෙන ගුණයෙන් උපසපන් ලජ්ජී මහණම තිපදවා ජිනශාසන වඩ්ඪනය කෙරේ. මෙසේ සියලු විනය විනිශ්චයෙහි දක්ෂභාවය පතන විනයධරයා විසින් තුන් ලකුණක් කැමැති වියයුත්තේය. කවර තුන් ලකුණු ද?

විනයධරයාහට සියලු විනයපිටකය මනාකොට වාක්පථයෙහි පැවැත්ම ඇත්තේවේද, නොහොත් මනාවාග් ස්වභාවයෙන් පවතීද, පුහුණුද වනපොත්වේද, ඛන්ධක පරිවාරයෙන් ගෙණහැර අර්ථනිශ්චය කරණ සෙසු පාලි විසින් ද පාලිය අනුව අර්ථදීපනය කරණ ථෙරවා ද විසින් ද අටුවා විසින් ද විනය පිටකය කඞ්ඛාච්ඡේදය කොට මේ කළාහට මේ වෙයි කියා සැක නැතිකොට මොහු විසින් උගන්නා ලද්දේවේද යන මේ එක් ලක්ෂණයෙකි.

පාලියද පාලි අර්ථයද නොවරදවා ගරුකොට තබා දෙසනා පටිපත්ති දෙකින් විනය නොසික්මෙන්නේ ලජ්ජී මහණ තමාගේ ලජ්ජී භාවයෙන් විනයෙහි පිහිටියේවේද. අත්ත පච්චත්ථික සාසන පච්චත්ථිකයන් විසින් අනෙක ප්‍රකාරයෙන්

කියනු ලබන්නේද අර්ථය නොදන්නා නොසැලේද නොවෙවුලාද මෙසේ අපි කියම්හ. මෙසේ අපගේ ඇදුරෝ කියතියි විසඳන ලෙස පාළියද පළිවිනිශ්චයද යමක්හු කෙරෙහි උගන්නා ලද්දේ වේද. ආභොග කළවිටම උජ්ජාලිත ප්‍රදීපයක්මෙන් පහළවන ලෙස මනාකොට මෙනෙහි කරණ ලද්දීවේද පුබ්බාපරානු සන්ධි විසින් අර්ථ විසින් කාරණා විසින්ම මනාකොට දරණ ලද්දීවේද. අත්‍යන්තොමතිය හැර ඉතා පිරිසුදුවූ ඇදුරන්ගේ විනිශ්චයම කියන සුළුද යන මේ තුන්වන ලක්‍ෂණයයි. විනයධරයාගේ මෙසේවූ තුන්ලකුණෙක් කැමතිවිය යුත්තේයි. සසාඞ්කයෙන් යුක්තවූ චන්‍ද්‍රයාමෙන් විනයධර මෙතුන් ලකුණෙන් හැඳිනිය යුතුයි.

ඒ ත්‍රිලක්‍ෂණයෙහි සූත්‍රයනම් උභතො විභඞ්ග ඛන්ධක පරිවාර යන සියළු විනය පිටකයයි. ඒ විනය පිටකය මේ විනය ධරයාහට මනාවාග්පථයෙහි ඒද ඒ විනය පිටකය වාග් පථයෙහි මනාව පැවැත්ම ඇත්තේවේද නොහොත් නාගවම්ප කාදීන්ගේ සවභාවගන්ධය මෙන් සවභාවයෙන් යහපත්ව පව තීද පුහුණුද වණපොත්ද පිරවිය හැකිද. ඛන්ධක පරිවාරයෙන් ගෙණහැර කියයුතු පාළි විසින්ද විනය පිටකය සුවිනිච්ඡිත වේද. ථෙරවාද විසින්ද අටුවා විසින් දූසිසේයි. මේ කළාහට මේ වරදවෙයි කියා සැකපසිඳ විනය පිටකය උගත්තාලද වේද විනයාර්ථයද විනය පටිපත්තියද නොහරණේ නොයික් මෙන්නේ තමාගේ ලජ්ජීභාවයෙන් සියළු විනයෙහි පිහිටියේ වේද.

දූන් මේ ප්‍රස්තාවයෙහි අලජ්ජීහු කරණ විපත්තියද ලජ්ජීහු දිවිපියාද කරණ ශාසන සම්පත්තියද දක්වන්නට "අලජ්ජීහි බහුස්සුතො යතාදිය වදාළසේක. දූත දූන ඇවැත් අවදනා සඟවන අගති ගමනයට යන අලජ්ජී මහණ' වනාහි බොහෝ ඇසූ පිරූතැන් ඇතියේද ධර්මය ගරුනොකොට ලාභයම ගරු කොට ඇති බැවින් බුදුන් වදාළ පාළිය අතික් පරිද්දකින් පෙරළා සීල සමාධි විපස්සනා මග්ග ඵලවට්ට විවට්ට වශයෙන් දෙශකවූ අනුශාසකයාගේ අනුශාසනා ධර්මයෙන් පහකොට විනය විනයෙන් පහකොට දශවස්තු පහළකළ අලජ්ජීන් මෙන් ලෝවැස්සාහට හඟවා බුදුසස්නෙහි මහත් උපද්‍රවයක් කෙරේ. සීල සාමඤ්ඤයෙන් හැනී පවත්නා සඟනගේ බිඳීයාමද සඞ්ඝ භෙදයට පූර්වභාගයෙහි පවත්නා කළහයද උපදවා බහුශ්‍රැතවූ අලජ්ජීතෙමේ මහත් විපත්තියක්, කෙරේද. මූත්හරෙක එබූ

මැණිකක්සේ සඞ්ඝශොභණවූ ලජ්ජීපෙසල මහණ වනාහි පරමාණු පමණ වරදෙක පාරාජිකවක්සේ භයදක්නා සුළුවූයේ කුකුස් උපදවන්නේ ත්‍රිවිධ ශික්‍ෂාව අමාවක්මෙන් කැමැත්තේ මෙසේ නොකිවහොත් නොප දිවිගණුම්හයි කීවද ජීවිතය හේතුකොට ගෙණද පෙළ දහම් අනික් පරිද්දකින් නොකියා ධර්‍මයම විනයම ලොව පහළ කෙරේද. බුදුසස්න මහමෙරසේ බරකොට පිහිටූ වයි. එය එසේ මැයි. පූර්‍වකාලීන තුන්කල් දන්නා මහනීයවූ සර්‍වගුණඇති මහඋතුමෝ තුන්වරක් අමොඝවචනයක් තික්මවූහ.

යථාපරාධ ශාසනය යථානුලොම ශාසනය අනාගත කාල යෙහිදී ලජ්ජීපෙසලයා රක්නේය. රක්නේය, රක්නේයයි නොසිස් තෙපුලක් තික්මවූහ. මෙසේ යම් මහණෙක් ලජ්ජීද එතෙමේ විනයාර්‍ථයද විනය ප්‍රතිපත්තියද නොහරණේ. නොයික්මෙන්නේ තමාගේ අනාපජ්ජනය ආපත්තාවුට්ඨාණය. මැදහත්බවය යන ලජ්ජී බැවින් විනයෙහි පිහිටියේ වේ. "සංහීරෙ" යන්නෙහි සංහීර නම් කවරේද?

පාළියෙහි යටදිශාවෙන් හෝ මතුදිශාවෙන් හෝ විචාරනු ලබන්නේ පදපිළිවෙළින් හෝ විචාරනු ලබන්නේද අටුවාවෙහි විචාරනු ලබන්නේද කිවමනා අර්‍ථය නොදැක තතනාද වෙවුලාද එකම අර්‍ථක පිහිටා ගන්නට නොපොහොසත්ද එකම අර්‍ථයෙක්හි නොසිටිනා හෙයින් මෙරමා යම් යම් අර්‍ථජාතයක් කියාද ඒ කී කී දෑම යහපතැයි පිළිගණී. තමාගේ ථෙරවාද හැර අන්‍ය නිකාය වාදගණී කෙසේද? "උච්ඡුම්හි කසටං යාවජීවිකං රසොසත්තාහ කාලිකො තදුභය විනිම්මුත්තොනාව උච්ඡුනාම විසුංනත්ථි තස්මා උච්ඡුපි විකාලෙවට්ටති"යි පරවාදීහු කීකල ඒ යුක්තය ඒ එසේමය මැනවැයි කියා උච්ඡුයාව කාලිකය යන තමාගේ ථෙරවාදය හැර පරනිකාය වාදීන්ගේ යාවජීවික වාදය හෝ සත්තාහකාලික වාදය හෝ ගණීද. ඒ මහණතෙමේ සංහීර නම්වේ

අසංහිර නම් කවරේද? යම් මහණෙක් වනාහි පාළියෙහි හෝ අටුවාවෙහි හෝ යටින් මත්තෙන් හෝ පද පිළිවෙළින් හෝ විචාරණු ලබන්නේ අර්‍ථය නොදැක නොතතනාද නො හැකිළේද නොම වෙවුලාද එකි එකී නරයක් අඬුවෙන් උදුරා ගන්නක්හු මෙන්වේද අටුවාවද අපි මෙසේ කියම්හ. මෙසේ අප ඇදුරෝ කියතියි විසඳද. යම් පුද්ගලයකු කෙරෙහි පාළියද පාළියට කියන අටුවා විනිශ්චයද රන්බඳනෙක බහාලූ සිංහ තෙල් මෙන් පරික්ඛය සඞ්ඛ්‍යාතවූ පරියාදානයට ගෙවීමට නොගොස්සිටීද ඒ පුද්ගලතෙම් විනයෙහි අසංහීර නම්වේ. අකම්ප්‍ය නම්වේ.

**"ආචරිය පරම්පරා බොපනස්ස සුගගහිතා"** යන්නෙහි ආචරිය පාචරියයන් තොසිඳ පැවති ගෙණ ආ විනිශ්චය පරම්පරාව මේ අනෙඣවාසික විනයධරයා විසින් යහපත්කොට ගන්නාලද්දීවේද. මොහු විසින් ආචාර්යයන්ගේ විනිශ්චය පරම්පරා තොම ව්‍යඤ්ජන විසින්ද අර්ථ විසින්ද මතුමත්තෙහි නො මුළාවන ලෙස ව්‍යඤ්ජනයද අර්ථයද වනපොත්කොට ලෙහි තබනලද්දී වේද **"සුමනසිකතා"**යන්නෙහි ආචරිය පරම්පරාතොම ආදි මනසිකාරයට පසු පසුව නොසිඳී උපන් සිත්හි මනාකොට තබන ලද්දීවේද. කෙසේද? ඇදුරන්ගේ පරම්පරාගතවූ විනිශ්චය ආභොගකල පමණෙක්හි නගාලූ පහනක්මෙන් මනාකොට වැට ගෙන්නේවේද. එසේ ආචරිය පරම්පරා සුමනසි කතාද. **"සුපධාරිතා"** යන්නෙහි මනාකොට දරණලද්දීවේද කෙසේද? මේ පූර්වවචනය. මේ පසුවකී, වචනය මේ අනුසන්ධියය, මේපූර්වාපරයන්ගේ ගලපාළිමය. මෙසේ පූර්වා පරානුසන්ධි විසින්ද අර්ථවිසින්ද කාරණා විසින්ද දරණලද්දීය. තමාගේ අභිප්‍රාය හැරපියා ආචාර්යවරයන්ගේ ශුද්ධවූ මතයෙන් කියන්නේ වේද. ඔහු විසින් ආචාර්ය පරම්පරා තොම සුපධාරිත නම්වේ.

තවද මේ මතුකියන පරිද්දෙන් පටිලෝමයෙන් අනුලෝමයෙන් පරම්පරා සූපධාරිත නම්වේ. කෙසේද? මාගේ උපසම්පදාචරිය, ඔවාදාචරිය, උද්දෙසාචරිය, තෙම අසවල් ආචාර්යයන් වහන්සේ කෙරෙහි විනය ඇසීය. ඒ ඇදුරු අසවල් ඇදුරන් සමීපයෙහි ඇසීයයි මෙසේ සියළු ආචරිය පරම්පරාසඞ්ඛ්‍යාතවූ ථෙරතරඞ්ගය (තෙරපිළිවෙල) මත්තට ගෙනහැර යම්තාක් උපාලි ස්ථවිර තෙමේ සම්මාසම්බුදුන් සමීපයෙහි විනයඋගතැයි සම්මාසම්බුදුන් කරා පමුණුවාතබා ද ඒ විනය ධරයා විසින්ද පරම්පරා සූපධාරිත නම්වේ, ඒ බුදුන් කෙරෙන්ද ගෙනගොස් "අත්තනො ආචරියං පාපෙත්වා, යනුහා සම්බන්ධයි. උපාලිමහතෙරතෙමේ සම්මා සම්බුදුන් සමීපයෙහි විනය උගත්තේයයි දාසක ස්ථවිර තෙමේ තමාගේ උපාධ්‍යායවූ උපාලි ස්ථවිරයන් සමීපයෙහි ඇසීය. සොනක ස්ථවිරතෙමේ තමාගේ උපාධ්‍යායවූ දාසකස්ථවිරයන් සමීපයෙහි ඇසීය. සිග්ගවස්ථවිරතෙමේ තම උපාධ්‍යායවූ සොනක ස්ථවිරයන් සමීපයෙහි ඇසීය. මොග්ගලිපුත්තතිස්ස ස්ථවිර තෙමේ තම උපාධ්‍යායවූ සිග්ගව ස්ථවිරයන්ගේද ආචාර්‍ය්‍යව වැඩසිටි චණ්ඩවජ්ජි ස්ථවිරයන්ගේද දෙදනෙකුන් වහන්සේ සමීපයෙහි ධර්මවිනය ගැන්ම කීයේ කුමක්හෙයිනයත්? හේමෙසේ දතයුතු. මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ තමන්වහන්සේගේ ආචාර්යයන් වහන්සේ සමීපයෙහි සාමණේරව සිට විනය පිටකය තබා අටුවා

කථා හා සමග සියළු බුද්ධ වචනය උගති. යන මේ වචනයෙන් සූත්‍රාන්තාභිධර්ම පිටකවය ඇසූසේකැයි හැඟේ. උපාධ්‍යායයන් වහන්සේ සමීපයෙහි විනය පිටකය ඇසූහ. එයින් කීහ. උපසම්පන්න කාලෙපන අවස්සිකොව සමානො තිපිටකධරො අහොසි ආචරියුපජ්ඣායා මොගගලි පුත්තතිස්ස ථෙරස්ස හත්ථෙ සකලං බුද්ධවචනං පතිට්ඨාපෙත්වා යාවතායුකං ඨත්වා පරිනිබ්බායිංසු,,සි.

මෙසේ හෙයින් මොගගලිපුත්තතිස්ස ස්ථවිරයන්වහන්සේ උපාධ්‍යායවූ සිග්ගව ස්ථවිරයන් වහන්සේගේද ආචාර්‍යවූ චණ්ඩ වජ්ජි ස්ථවිරයන් වහන්සේගේද සමීපයෙහි ධර්මවිනය ඇසූසේ කැයි සියලු ආචාර්‍ය පරම්පරායයි කියනලද ථෙරතරඞ්ගය (තෙරපිළිවෙළ) අනුලොම ක්‍රමයෙන් ගෙණහැර තම ආචාර්‍ය යන්කරා පමුණුවා තබාද මෙසේ උගන්නාලද ආචාර්‍ය වර යන්ගේ විනිශ්චය පරම්පරාතොම උගන්නා ලද්දීවේද. මෙසේ ආචාර්‍ය පරම්පරාව දන්නට නොපොහොසත්වූවහු විසින් වනාහි යම් ප්‍රකාරයකින් පෙළද අටුවාද ආචාර්‍යවරයන් දෙතුන් දෙනෙක් වදාරද්ද ඒ ප්‍රකාරයෙන් උන්ගේ අන්තෙවාසික විනය ධරයා විසින් දන්නටවටී. මේ ත්‍රිලක්ෂණ සම්පන්න විනය ධරයාගේ සාමාර්ථ්‍යයයි. මේ ත්‍රිලක්ෂණයෙන් සමන්විතවූ විනය ධරයා විසින් "ඡට්ඨානානි ඔලොකෙ තබ්බානි" යනු සම්බන්ධයි.

එක් මහණක්හු විසින් කරණලද සික්ඛාපද වීතික්කම සඞ්ඛ්‍යාත වරදක් ගරුකලහුක වස්තුවශයෙන් විනිශ්චය කරන පිණිස කාරක සඞ්ඝයා රැස්වූ කල්හි චොදනා සඞ්ඛ්‍යාතවූ හෝ වීතික්කම සඞ්ඛ්‍යාතවූ හෝ වස්තුව සඟමැදට බටකල්හි චොදක චුදිතක දෙදෙනා විසින් කියයුත්ත තෙමේ මෙහි වස්තු නමැයි දතයුතු.

එක් මහණක්හු කළදෙය කියන මහණහු විසින්ද චොද නාව ලබන මහණහු විසින්ද කියයුත්ත කීකල්හි සඟමැදට වස්තුව බටුවා නම්වෙයි. වහාවිනිශ්චය නොකොට විනය ධරයා විසින් සය කාරණයක් නුවණැසින් බැලිය යුත්තේය. ඒ කවර සතැනක්ද.?

ඒ ඒ ශික්ෂාපදය පනවන්නට හේතු වස්තුව බැලියයුතුයි. මාතිකායෙහි මේ විතික්කමයට කවර ඇවතෙක් වදාරණලදද්දේ හෝයි විනය මාතිකාතොම බැලිය යුත්තීය. අක්ඛයිතාදි

ශරීරයෙහි ආපත්තිය විස්තරකොට වදාළ පද විභාගය බැලිය
යුතුයි. තිකසඞ්ඝාදිසෙස තිකපාචිත්තියාදිවූ චාරත්තික වශයෙන්
ආපත්තිය පිරිසුන් තික පරිච්ඡේදය බැලියයුතුයි. සික්ඛාපදන්ත
රයෙහි වදාළ ආපත්තිය බැලියයුතුයි. යොපන භික්ඛු-පෙ-සමා
දහාපෙය්‍යවා පාචිත්තියං,, යනාදී සික පදයෙහි වදාළ විනීත
වස්තු ඇතුළත්කොට මේ අතර සික්ඛාපදන්තර නම් වෙයි.
ඒ සික්ඛාපදන්තරයෙහි පටිලාත උක්ඛිපනාදියෙහි වදාළ දුක්ක
ටාදී ආපත්තිනමැයි දතයුතු. "අනාපත්ති භික්ඛු අසාදියන්තස්ස
අථෙය්‍ය චිත්තස්ස,,යනාදිවූ අනාපත්තියෙහි වදාළ අනාපත්තීතොම
බැලිය යුත්තීය. මේ සතැන බැලියයුතු.

සඟ මැදට බට අධිකරණයට නිසි වස්තුව බලන්නේද
අඤ්ඤතර විඤ්ඤත්ති සික්ඛාපද පනවන්නට වස්තුවෙහි සිවුරු
උදුරාගත් මහණහු විසින් තෘණයෙන් හෝ පත්‍රයෙන් හෝ
ලජ්ජා ස්ථානය වසාගෙන ඉයයුතුය. නග්නව නොම ඉයයුතුය.
යමෙක් නග්නව ආනම් ඔහට දුකුලා ඇවැත්වෙයි කියා මෙසේ
ඒ සිකපදය පනවන්නට වස්තුවෙහි වදාළ ආපත්තියක් නුවණැ
සින් බලයි. ඒ විනය ධර තෙමේ ඒ සූත්‍රය මෙතැනට ගෙන
හැර සිවුරු නැතිකල කොළින් පතින් වසාගෙන නොඅවුදින්
නග්නව ආවාහට දුකුළාවෙයි කියා දුකුළා දෙසවාද ඒ ආපත්තාධි
කරණය සංසිඳුවා-

සඟ මැදට බට විසංවාද චිත්තයෙන් තදනුලොම්කවූ වාචා
යෙන් "වචනත්ථ පටිවෙධ" ය යන තිවඞ්ග සම්පත්ති ඇති වස්තු
වට නිසි විනය මාතිකා බලන්නේද-දූත දූත මුසවාකීම නිමිත්ත
කොටගෙන පචිති ඇවැත්වෙයි. යනාදි නයින් විනය මාතිකා
යෙහි ආ පාරාජික සඞ්ඝාදිසෙස පාචිත්තිය පාටිදෙසනීය
සෙඛියායෙන් දුෂ්කෘත යන පස් ඇවැත් කඳු අතුරෙන් එක්
තරා ඇවතක් බලයි. ඒ විනයධරයා ඒ විනය සූත්‍රය ගෙන මේ
වස්තුවෙහි පචිති ඇවැත්වෙයි කියා ඒ උපන් අධිකරණය සං
සිඳුවයි. පඨම පාරාජිකාදි සික්ඛාපදයට වදාළ පද විභඞ්ගය
බලන්නේද, ස්ත්‍රී නිමිත්තය බළු කැනැහිල් ආදි සතුන් විසින් නො
කනලද මළ මාගම් සිරුරෙහි මෙවුන්දම් සෙවනය කෙරේද,
ඔහට පාරාජිකාපත්තිය වෙයි. බොහෝ කෑ නිමිත්ත ඇති මළ
මාගම් සිරුරෙහි මෙවුන්දම් සෙවනය කෙරේද, ඔහට ථුල්ලච්ච
යාපත්තිවෙයි. යන මේ ආදි නයින් පාරාජිකා සඞ්ඝාදිසෙස පා
චිත්තිය පාටිදෙසනීය ථුල්ලච්චය දුක්කට දුබ්භාසිත යන සත්

ඇවැත් කඳුන් අතුරෙන් එක්තරා ඇවතක් දකීද, ඒ විනය ධරතෙම පදභාජනියෙන් සූත්‍රයක් ගෙණ හැර සඟ මැදට බට ඒ අධිකරණය සංසිඳවා.

පාළියෙහි තික පරිච්ඡේදය බලන්නේද සඞ්ඝභෙද සංවත්ත නිකවූ අධිකරණය ගෙන සිටි මහණ ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥිව නොහරිනමුත් සඟ වෙසෙස් වෙයි. ධර්මකර්මයෙහි විමති ඇතිව නොහරිනමුත් සඟ වෙසෙස් වෙයි ධර්ම කර්මයෙහි අධර්ම කර්ම සංඥිවද නොහරිණමුත් සඟ වෙසෙස් වෙයි යන තික සඞ්ඝාදිසෙස පරිච්ඡේදයද, මෙසේ තික සඞ්ඝාදිසෙසය හෝ තික පාචිත්තිය හෝ තික දුක්කටය හෝ දුක දුක්කටය හෝ එක්තරා ආපත්ති යක් තික වශයෙන් දුක වශයෙන් පිරිසුන් තන්හි බලයි. ඒ විනයධර තෙමේ ඒ තික පරිච්ඡේදයෙන් සූත්‍රය ගෙන හැර ඒ අධිකරණය සංසිඳුවා සික්ඛාපදන්තරයෙහි වදාළ අපත්තිය යන අනන්තරා පත්තිය බලන්නේ දද බැසගිය පෙනෙල්ල නගාද ඕහට දුක්කටාපත්තියෙක් වෙයි කියා ගිහිතප්නා මහණ කාරු ණක් නැතිව පවිති ඇවැත් අවදනේද එබඳු කටයුත්තක් නැතිව දබට පෙනෙල්ල ගින්නට නගාලාද දුකුළා ඇවැත් අවද නේය.

මෙසේ ඒ සිකපද ඇතුළත යම් අනන්තරාපත්තියෙක්වේද ඒ අනන්තරාපත්තිය දකියි. අනාපත්තිය බලන්නේද මෛථුන ධර්ම ශික්ෂාපදයෙහි මාර්ගයෙහි මාර්ග ප්‍රවේශය ඇති කල්හිද නො ඉවසන මහණහට ඇවැත් නැතැයි කියාද, අදත්තා දාන ශික්ෂාපදයෙහි සොරසිත් නැත්තාහටද ආපත්ති නැතැයි කියාද මනුෂ්‍ය විග්‍රහ ශික්ෂාපදයෙහි මරම් යන අභිප්‍රාය නැත්තා හටද ඇවැත් නැතැයි කියාද, උත්තරි මනුස්ස ධම්ම සික්ඛාපද යෙහි තමා කෙරෙහි නැති ගුණ කියන අභිප්‍රාය නැත්තාහටද ඇවත් නැතැයි කියාද සුක්කවිස්සට්ඨි ශික්ෂාපදයෙහි මොචනස්සාද සුකුරු මුදන්නෙමි යන අභිප්‍රාය නැත්තාහටද ඇවැත්නැත. ඒ මේ උපක්‍රමයෙන් පොළොව කොප්‍ය කෙරෙම්යි උත්සාහ නොකොට කළ ප්‍රයොගයෙන්ද අනාපත්තිය, අසතියෙන්ද නො දන්නාහටද ඇවැත් නැතැයි කියාද මෙසේ ඒ ඒ සිකපදයෙහි අනාපත්ති වාරයෙහි වදාළ අනාපත්තිය දකියි.

යම් විනය ධර මහණෙක් සුත්ත සුත්තානුලොම ආචරියවාද අත්තනොමති යන සතර වැදෑරුම් විනයෙහි දක්ෂවූයේ "සුත්තං චස්ස සාගතං හොති" යනාදිවූ තුන් ලකුණෙන් අනුගතවූයේ වත්ථුය මාතිකාය පදභාජනිය ය. තික පරිච්ඡේදය අනන්තරා පත්තිය අනාපත්තිය යන සකාරණයන් බලා විවාදාධිකරණය අනුවාදාධිකරණය ආපත්තාධිකරණය යන චතුර්විධ අධිකරණ යන් අතුරෙන් එක්තරා අධිකරණයක් සංසිඳුවාද.

මෙහි විවාදධිකරණය නම් ධර්මය අධර්මයයි කියා හෝ අධර්මය ධර්මයයි කියා හෝ විනය අවිනයයි කියා හෝ අවිනය විනයයි කියා හෝ තථාගතයන් විසින් වදාරණ ලදදෙය නො වදාරණ ලදැයි කියා හෝ නො වදාරණ ලදදෙය වදාරණ ලදැයි කියා හෝ ආචිණ්ණය අනාචිණ්ණයයි කියා හෝ පනවන ලද දෙය නො පනවන ලදැයි කියා හෝ නො පනවන ලද දෙය පනවන ලදැයි කියා හෝ ලහුකා පත්තිය ගරුකාපත්ති යයි කියා හෝ ගරුකාපත්තිය ලහුකාපත්තියයි කියා හෝ සාවශෙසාපත්තිය අනවශෙසාපත්තියයි කියා හෝ අනවශෙසාපත්තිය සාවශෙසාපත්තියයි කියා හෝ දුට්ඨුල්ලාපත්තිය අදුට්ඨුල්ලාපත්තිය කියා හෝ යම් භික්ෂු කෙනෙක් මෙකී අෂ්ටාදශ භෙදකරවස්තූන් අතුරෙන් යමක් කරණ කොටගෙණ කලහ විග්‍රහ විවාදදිය කෙරෙද්ද මේ විවාදධිකරණ නම්වේ.

මෙහි ධර්මය නම්:– දශකුශලකර්මපථය සතර සතිපට්ඨානය සතර සම්‍යක් ප්‍රධානය සතරඍද්ධිපාදය පඤ්චෙන්ද්‍රියය පඤ්ච බලය සප්ත බොධ්‍යඞ්ගය අෂ්ටාඞ්ගික ආර්‍ය්‍යමාර්ගය යන මොව්හුය.

අධර්මය නම්:–දශඅකුසල කර්මපථය ත්‍රිවිධ සතිපට්ඨානය ත්‍රිවිධ සම්‍යක් ප්‍රධානය ත්‍රිවිධ ඍද්ධිපාදය ෂට්විධ ඉන්ද්‍රියයෝය ෂට්විධබල යෝය අෂ්ටබොධ්‍යාඞ්ගයෝය නවාඞ්ග ආර්‍ය්‍යමාර්ගයෝය චතුර්විධ උපදානයෝය චතුර්විධ නීවරණයෝය සප්ත අනුශයයෝය. අට්ඨමිච්ඡත්තයෝය යන මොව්හුයි මේ සුත්තන්ත පරියායයෙනි.

විනය පරියායයෙන් වනාහි විද්‍යමාන වස්තුවෙන් චොදනා කොට සිහිකරවා ප්‍රතිඥාවු පරිද්දෙන් කටයුතු කර්මය ධර්ම නම් වේ. අවිද්‍යමානවූ වස්තුවෙන් චොදනා නොකොට සිහි නොකරවා ප්‍රතිඥාවක් නැතිව කටයුතු කර්මය අධර්ම නම් වේ. විනය නම් රාග විනය දෙ‍ෂ විනය මොහ විනය සංවර විනය පහාණ විනය යන මොහුයි. අවිනය නම් රාගද්වෙෂ මොහාදීන් ගේ අවිනය යන අසංවරය අප්‍රහාණය යන මොව්හුයි. මේ සූත්‍රාන්ත පර්‍ය්‍යායයෙනි. විනය පර්‍ය්‍යායයෙන් වනාහි වත්‍ථුසම්පත්ති ඤත්ති සම්පත්ති අනුසාවන සම්පත්ති සීමා සම්පත්ති පරිස සම්පත්ති යන මොව්හු විනය නම් වේ. වත්‍ථු විපත්ති–පෙ– පරිස විපත්ති යන මොව්හු අවිනය නම් වේ.

සතර සතිපට්ඨානය සතර සම්මප්පධානය–පෙ–අට්ඨඞ්ගික මග්ග යන මොව්හු තථාගතයන් විසින් වදාරණ ලද්දාහුය. ත්‍රිවිධ සතිපට්ඨානය ත්‍රිවිධ සම්‍යක් ප්‍රධානය–පෙ–නවාඞ්ගික ආර්‍ය්‍යමාර්ගය යන මේ තථාගතයන් විසින් නොවදාරණ ලද්දේය.

මේ සූත්‍රාන්ත පර්‍යායයෙනි. විනය පරියායයෙන් සතර පාරාජිකාවෝය තෙලෙස් සඞ්ඝාදි සේසයෝය දෙවදූරුම් අනියතයෝය. තිස් නිසඟි පචිතිය යන මොහු තථාගතයන් විසින් වදාරණලදහ. ත්‍රිවිධ පාරාජිකාය තුදුස් සඞ්ඝාදිසෙසය තුන් අනියතය එක්තිස් නිසඟි පචිතිය යන මොව්හු තථාගතයන් විසින් නොවදාරණලදහ.

දවස් පතා පලසමවතට සමවැදීමය මහාකරුණා සමාපත්තියට සම්වැදීමය බුදු ඇසින් ලොව බැලීමය අථොත්පත්ති වශයෙන් සූත්‍රාන්තජාතක කථාවස්තු දෙසීමය යන මොව්හු තථාගතයන් විසින් ආචිණ්ණයෝය. දවස්පතා ඵල සමාපත්තියට සමනොවැදීමය-පෙ-ජාතක කථාවස්තු නොදෙසීමය යන මොව්හු තථාගතයන් විසින් අනාචිණ්ණයෝය. මේ සූත්‍රාන්ත පර්‍යායෙනි විනය පර්‍යායයෙන් වනාහි නිමන්ත්‍රණය කරනලදුව වස්වැස අපලොකනය කොට සැරිසරා වැඩීමද පවාරණය කොට සැරිසරා වැඩීමද ආගන්තුකයන් හා ප්‍රථමකොට පිළිසඳර කථාකිරීමද යන මොව්හු තථාගතයාහට ආචිණ්ණයෝය. පුරුදුවූදෙය නුපුරුදුයයි කීම අනාචිණ්ණ නම්වේ.

සතර සතිපට්ඨානයෝය-පෙ-අෂ්ටාඞ්ගික ආර්‍ය මාර්‍ගය යන මොව්හු තථාගතයන් විසින් පනවනලද නම්වේ. තුන්සති පට්ඨානයෝය-පෙ-නවාඞ්ගික ආර්‍ය මාර්‍ගය යන මොව්හු තථාගතයන් විසින් නොපනවන ලද නම්වෙයි. මේ සූත්‍රාන්ත පර්‍යායයෙනි.

විනය පර්‍යායයෙන් වනාහි සතර පාරාජිකාවෝය-පෙ-තිස් පචිතිය යනමෙය ප්‍රඥප්ති නම්වේ. නොදන්නාහටද සොර සිතක් නැත්තාහටද මරණ අදහස් නැත්තාහටද අනුල්ලපනාභිප්‍රාය නැත්තාහටද අනාපත්තියයි ඒ ඒ තන්හි වදාරණලද අනාපත්තීහු අනාපත්ති නම් වෙති. සොරසිත් ඇත්තාහට යයි මේ ආදි ක්‍රමයෙන් වදාරණ ආපත්තීහු ආපත්ති නම් වෙත්. ථුල්ලච්චයා පත්තිය පාටි දෙසනීය දුක්කට දුබ්භාසිත යන මේ පඤ්චා පත්ති ස්කන්ධයෝ ලහුකාපත්ති නම් වෙත්. පාරාජික සඞ්ඝාදිසෙස යන ආපත්ති ස්කන්ධයෝ දෙදෙන ගරුකාපත්ති නම් වෙත්. පඤ්චාපත්ති ස්කන්ධය හා සඞ්ඝාදිසෙස ආපත්ති ස්කන්ධයද යන සදෙන සාවසෙස ආපත්ති නම් වෙත්. පාරාජිකා පත්ති ස්කන්ධය තෙම අනවසෙෂ ආපත්ති නම් වේ.

ගරුකාපත්ති ස්කන්ධයෝ දෙදෙන දුට්ඨුල්ලාපත්ති නම් වෙත්. ලහුකාපත්තිස්කන්ධයෝ පස්දෙන අදුට්ඨුල්ලාපත්ති නම් වෙත්. යන මේ ධර්මාධර්මාදීන්ගේ ප්‍රභේදයෝයි.

අනුවාදාධිකරණ නම් කවරේද? මේ ශාසනයෙහි යම් මහණෙක් තෙම යම් මහණක්හට සීලවිපත්තියෙන් හෝ ආචාර විපත්තියෙන් හෝ දිට්ඨිවිපත්තියෙන් හෝ ආජීව විපත්තියෙන් හෝ දොෂාරොපණය කිරීමෙන් හටගත් යම් අධිකරණයක් ඇද්ද ඒ අනුවාදාධිකරණ නම් වේ.

එහි ආපත්තාධිකරණය කවරේද? පඤ්චාපත්තිස්කන්ධයන්ද සප්තාපත්ති ස්කන්ධයන්ද හේතුකොටගෙණ හටගන්නාවූ යම් අධිකරණයක් ඇද්ද ඒ ආපත්තාධිකරණ නම්වේ.

කිච්චාධිකරණ නම්:-අපලොකන කර්මය ඤත්තිකර්මය ඤත්ති දුතිය කර්මය ඤත්ති චතුත්ථ කර්මය යනමේ චතුර්විධ විනය කර්මයන් හේතුකොටගෙණ හටගත් යම් අධිකරණයක් ඇද්ද හේ කිච්චාධිකරණ නම් වේ.

එහි විවාදාධිකරණයට මූල් දොළොසය, අනුවාධිකරණයට මූල් තුදුසය, ආපත්තාධිකරණයට මූල් සයය, කිච්චාධිකරණයට මූල් එකය, මෙසේ චතුර්විධ අධිකරණයට මූල් තෙතිසෙකි.

එහි විවාදාධිකරණයෙහි මූල්දොළොස නම්:-ක්‍රොධ, උපනාහ, මක්ඛ, පලාස, ඉස්සා, මච්ඡරිය, යන මේ සය හා ලොභ දොස මොහ ආලොභ අදොස අමොහ යන මේ සයදූයි මේ මූල් දොළොසය.

අනුවාදාධිකරණයෙහි මූල් තුදුස නම්:-විවාදාධිකරණයට කී මූල් දොළොස හා දුශීණි දුණිවාදී වශයෙන් කාය වාචා මූල් දෙක දූයි යන තුදුසය, ආපත්තාධිකරණයෙහි මූල් සයනම් කයින් හට ගන්න ආපත්තිය වචනයෙන් හටගන්නා ආපත්තිය කායවාචා දෙකින් හටගන්නා ආපත්තිය කාය චිත්තදෙකින් හටගන්න ආපත්තිය වාචා චිත්ත දෙකින් හටගන්න ආපත්තිය කාය වචා චිත්ත තුනෙන් හටගන්න ආපත්තියයි මේ ආපත්ති සමුට්ඨාන යෝ සදෙන ආපත්තාධි කරණයට මූල් වෙත්.

කිච්චාධිකරණයෙහි මූල් එකනම් සඞ්ඝයායි. මේ චතුර්විධ අධිකරණයෝ සත්ත සමථයෙන් සංහිඳෙත්. ඔව්හු සම්මුඛා විනය සති විනය අමූළ්හ විනය පටිඤ්ඤාත කරණය යෙභුය්‍යසිකාය තස්ස පාපීය්‍ය සිකාය තිණවත්ථාරකය යන මේ සතය.

එහි සම්මුඛා විනය නම්:-සඞ්ඝ සම්මුඛ බවය ධම්ම සම්මුඛ බවය විනය සම්මුඛ බවය පුග්ගල සම්මුඛ බවය යන මේ චතුර්විධ කාරණයන් සම්මුඛව කරණ විනය කර්මය සම්මුඛා විනය නම් වේ. සති වෙපුල්ලප්‍රාප්ත ක්ෂීණාශ්‍රවයාහට අමූලික ශීල විපත්තියෙන් කරණලද චෝදනාවෙහි ඒ ක්ෂීණාශ්‍රව තෙම පිරිසුදු වේද අනාපත්තික වේද ඔහට අපවාදත් කෙරෙද්ද හෙතෙම සංඝයාගෙන් සති විනය කර්මය ඉල්වාද මේ චතුර්විධ ලක්ෂණයෙන් සමන්විත ක්ෂීණාශ්‍රවයාහට සමගි සංඝයා විසින් දියයුතු විනය කර්මය සති විනය නම්වේ.

අමූළ්හ විනය නම්:- යම් මහණෙක් උමතුව සිහි මුළාවන ලදුව බොහෝ අශ්‍රමණ ක්‍රියාවන් කරනලදද ඔහට ඒ උමතු භාවය අත්හැරී සිහිය ප්‍රකෘතිවත්වූ කල්හි ආපත්තියෙන් චෝදනා කරනු ලබන්නේ මා විසින් බොහෝවූ අශ්‍රමණ ක්‍රියාවන් කරන ලද බව මම නොදනිමි. සිහිමුළාවී කෙළෙමි. එහෙයින් අමූළ්හ විනය දුන මැනවයි ඉල්වන්නාහට දියයුතුවූ විනයකර්මය අමූළ්හ විනය නම්වේ.

තජ්ජනීය කර්මයක් හෝ නියස්ස කර්මයක් හෝ පබ්බාජනීය කර්මාදීන් අතුරෙන් යම් කර්මයක් කටයුත්තක්හුගේ හෝ පාරාජිකාදිවූ සප්තා පත්තිස්කන්ධයන් අතුරෙන් යම් යම් ආපත්තියකට පැමිණෙන ලද්දක්හුගේ ප්‍රතිඥවෙන් කටයුතු විනය කර්මය පටිඤ්ඤාත කරණ නම් වෙයි.

සඞ්ඝ මධ්‍යයෙහි කලහ විග්‍රහ විවාද බහුලව ඔවුනොවුන්ට මුඛ නමැති අඩයටිවලින් විදිමින් වසන්නවුන් බහුලවී නම් ඒ අධිකරණ සංසිඳුවාගත නොහෙන කල්හි ෂඩඞ්ගයකින් සමන්විත තෙර කෙනෙකු සලාක ගාහාපක සම්මුතියෙන් සම්මතකොට:-

"නව ඔරමත්තකං අධිකරණංහොති" යනාදි දශවැදෑරුම්වූ ධාර්මිකවූ සලාක ගැන්වීමෙන් ඒ අධිකරණය සංසිඳුවාද ඒ විනය කර්මය යෙභුය්‍යසික නම් වේ.

සඟ මැද යම් මහණකුගෙන් ආපත්තියට පැමිණියෙහිදැයි විචාරණු ලබන්නේ නැත කියා ඇතැයි කියාද ඇතැයි කියා නැතැයි කියාද අතික් අතික් කාරණයකින් ඒ කථාව වසාද දූන දූන බොරු කියාද ඔහට චෝදනා කොට සිහිකරවා

ආපත්ති ආරොපණය කොට ව්‍යක්තවූ ප්‍රතිබල මහණක්හු විසින් සඟමැද ඒ මහණහට කටයුතු විනයකර්මය තස්ස පාපියසිකා නම් වේ.

මේ ශාසනයෙහි යම් භික්ෂු කෙණෙක් හටගන්නා ලද කලහ විග්‍රහ විවාදාදි බොහෝ අශ්‍රමණ ක්‍රියාකරණ ලද්දාහු වෙද්ද එසේවූ මහණුන්ට මෙසේ උපදනා ලද කලහ විග්‍රහ විවාද ඇතිව බොහෝ අශ්‍රමණ ක්‍රියාවන් කරණලද්දාවූ අපි ඔවුනොවුන්ට මේ ආපත්තිවලින් කරන්නමෝ නම් ඒ අධිකරණය කක්ඛශ බවට පැමිණෙන්නේය. එහෙයින් මෙබඳු අධිකරණය පාරාජිකා සංඝාදිසෙස යන මහත් වරද හා ගිහීන් පිළිබඳ ප්‍රසිඬවූ වරද යන මේ වරද හැර අවශෙෂ ආපත්ති කර්ම වාක්‍යයෙන් සංසිඳවීම **තිණවත්ථාරක සමථ** නම් වෙයි.

විවාදාධිකරණ ප්‍රත්‍යයෙන් ආපත්ති දෙකක් සිද්ධවෙත්. ඒ කෙසේ ද? යම් මහණෙක් උපසම්පන්නයක්හට ජාතිගොත්‍ර කුලාදියෙන් ගටා බණිද ඔහට පචිති ඇවැත් වෙයි. අනුප සම්පණ්ණයක්හට එසේම [illegible] බණිද ඔහට දුසකෘතාපත්තිවෙයි මේ ආපත්ති දෙක විවාදාධිකරණය හේතුකොටගෙණ සිඬවෙත්.

අනුවාදාධිකරණය හෙතුකොටගෙණ ආපත්ති තුනකට පැමිණේ. හේ කෙසේද? යම් මහණෙක් අමූලික පාරාජිකා ඇවතින් අනුද්ධංසනය කෙරේද ඔහට සඞ්ඝාදිසෙස ආපත්ති වෙයි. අමූලික සංඝාදිසෙසයෙන් අනුද්ධංසනය කෙරේද ඔහට පචිති ඇවැත්වෙයි. අමූලික ආචාර විපත්තියෙන් අනුද්ධංසනය කෙරේද, ඔහට දුසකෘතාපත්තිවෙයි. අනුවාදාධිකරණය හේතු කොටගෙණ මේ ආපත්ති තුනට පැමිණෙයි.

ආපත්තාධිකරණය හෙතුකොටගෙණ ආපත්ති සතරකට පැමිණෙයි. ඒ කෙසේද? යම් මෙහෙණක් දැන දැන අනික් මෙහෙණකගේ පාරාජිකාපත්තියක් වසාද ඈට පාරාජිකාපත්ති වෙයි. විමතිව පටිච්ඡාදනය කෙරේද ඈට තුලසි ඇවැත්වෙයි. යම් මහණෙක් දැන දැන සංඝාදිසෙසාපත්තියක් පටිච්ඡාදනය කෙරේද ඔහට පචිති ඇවැත්වෙයි. දැන දැන ආචාර විපත්තියක් පටිච්ඡාදනය කෙරේද ඔහට දුෂ්කෘතාපත්ති වෙයි. ආපත්තාධිකරණය හේතුකොටගෙණ මේ ආපත්ති සතරට පැමිණෙයි.

කිච්චාධිකරණය හෙතුකොටගෙණ ආපත්ති පසකට පැමිණෙයි. ඒ කෙසේද? උක්ඛිත්තානුවත්තක මෙහෙණී තොමෝ යම්තාක් තුන් වරසමනුභාෂණ කර්මය කරනු ලබන්නී ලබ්ධිය අත්නොහරින්නීද පළමුවර දුෂ්කෘතය වෙයි දෙවෙනිවර තුලසි වෙයි. කර්මවාක්‍යාව ශාතයෙහි පරිජීවෙයි. සඞ්ඝ හෙදනුවත්තක යම් මහණ කෙණෙක් යම්තාක් තුන්වර සමනුභාසන කර්මය කරනු ලබන්නාහු අත් නොහරිද්ද ඔවුන්ට සඞ්ඝාදිසෙස ආපත්ති වෙයි.

මිථ්‍යාදෘෂ්ටිගත් යම් මහණෙක් යම්තාක් තුන්වර සමනුභාෂණ කර්මය කරනු ලබන්නේ ඒ දෘෂ්ටිය අත්නොහරීද ඕහට පචිති ඇවැත් වෙයි. කිච්චාධිකරණය හෙතුකොටගෙණ මේ ආපත්ති පසට පැමිණෙයි.

මෙහි විවාදධිකරණය සම්මුඛාවිනය සමථයෙන්ද යෙභුය්‍යසිකා සමථයෙන්ද යන මේ සමථ දෙකෙන් සංසිඳෙයි. අනුවාදධිකරණය සම්මුඛා විනයෙන්ද පටිඤ්ඤාත කරණයෙන්ද තිණවත්ථාරකායෙන්ද. යන මේ සමථ තුනෙන් සංසිඳෙයි. කිච්චාධිකරණය සම්මුඛාවිනය සමථයෙන් සංසිඳෙයි. විවාදධිකරණයද අනුවාදධිකරණයද සම්මුඛා විනයෙන්ද යෙභුය්‍යසිකායෙන්ද සතිවිනයෙන්ද අමූළ්හ විනයෙන්ද තස්සපාපීය්‍ය සිකායෙන්දැයි මේ සමථපසෙන් සංසිඳෙත්.

විවාදධිකරණයද ආපත්තාධිකරණයද සම්මුඛාවිනය යෙභුය්‍ය සිකාය පටිඤ්ඤාත කරණය තිණවත්ථාරකය යන සමථ සතරෙන් සංසිඳෙත්. විවාදධිකරණයද කිච්චාධිකරණයද සම්මුඛා විනයය යෙභුය්‍යසිකාය යන සමථ දෙකෙන් සංසිඳෙත්. අනුවාදධිකරණයද ආපත්තාධිකරණයද සම්මුඛාවිනය සතිවිනය අමූළ්හ විනය පටිඤ්ඤාතකරණය තස්සපාපීය්‍යසිකාය තිණ වත්ථාරකය යන සමථ පසෙන් සංසිඳෙත්.

අනුවාදධිකරණයද කිච්චාධිකරණයද සම්මුඛාවිනය සති විනය අමූළ්හවිනය තස්ස පාපීය්‍යසිකාය යන සමථ සතරෙන් සංසිඳෙත් ආපත්තාධිකරණයද කිච්චාධිකරණයද සම්මුඛාවිනය පටිඤ්ඤාතකරණය තිණවත්ථාරකය යන සමථ තුනෙන් සංසිඳෙත් විවාදධිකරණයද අනුවාදධිකරණයද ආපත්තාධිකරණයද යන අධිකරණ තුන සත්ත සමථයෙන් සංසිඳෙත්. විවාදධිකරණයද අනුවාදධිකරණයද කිච්චාධිකරණයද සම්මුඛාවිනයය යෙභුය්‍ය සිකාය සතිවිනයය අමූළ්හවිනයය තස්ස පාපීයසිකාය යන සමථ පසෙන් සිංසිඳෙත්.

විවාදධිකරණයද අනුවාදධිකරණයද ආපත්තාධිකරණයද කිච්චාධිකරණයද යන අධිකරණ සතර සම්මුඛාවිනයය යෙභුය්‍යසිකාය සතිවිනයය අමූළ්හවිනයය පටිඤ්ඤතකරණය තස්සපාපීයසිකාය තිණවත්ථාරකය යන සමථ සතෙන් සංසිඳෙත් මෙහි සම්මුඛා විනය අනිකුත් සමථ සයෙහිම ව්‍යාප්තව තිබෙයි. ඒ කුමක් මෙන්ද? කතෘකාරකය අනිකුත් කාරක පසෙහි ව්‍යාප්තව තිබෙන්නාක් මෙනි.

මේ ශාසනයෙහි ධර්මය අධර්මය කියා හෝ අධර්මය ධර්මය කියා හෝ යට කියනලද ක්‍රමයෙන් යම් භික්ෂුකෙණෙක් විවාද කෙරෙද්ද ඒ විවාදධිකරණ නම්වේ. මෙලෙස විවාදකෙරෙමින් සීලවිපත්ති ආදියෙන් අමූලික වශයෙන් චෝදනා කෙරෙද්ද ඒ අනුවාදධිකරණය නම්වෙයි (අනුවාදය කෙරෙමින් ආපත්තියට පැමිණෙයි ) ඒ ආපත්තාධිකරණ නම්වෙයි. ඒ ආපත්තියට සඞ්ඝතෙම විනයකර්ම කෙරෙයි. ඒ කිච්චාධිකරණ නම් වෙයි. මෙසේ විවාදධිකරණය හේතුකොටගෙණ චතුර්විධ අධිකරණයෝම උපදිත්.

එසේම මේ ශාසනයෙහි යම් භික්ෂුකෙණෙක් යම් මහණක්හට සීලවිපත්ති ආදියෙන් චෝදනා කෙරෙද්ද ඒ අනුවාදධිකරණ නම්වෙයි. ඒ අනුවාදධිකරණයෙහි සඞ්ඝතෙමේ විවාද කෙරේද ඒ විවාදධිකරණය නම්වෙයි එලෙස විවාදකෙරෙමින් අනුවාදය කෙරෙද්ද ඒ අනුවාදධිකරණය නම්වෙයි. අනුවාදය කෙරෙමින් ආපත්තියට පැමිණේද ඒ ආපත්තාධි කරණය නම් වෙයි. ඒ ආපත්තියෙන් සංඝතෙම විනයකර්ම කෙරේද. ඒ කිච්චාධිකරණ නම් වෙයි. මෙසේ අනුවාදධිකරණය හේතු කොටගෙණ චතුර්විධ අධිකරණයෝම උපදිත්.

පඤ්චාපත්ති ස්කන්ධයෝද සප්තාපත්ති ස්කන්ධයෝද ආපත්තාධිකරණ නම්වෙත්. ඒ ආපත්තාධි කරණයෙහි සඞ්ඝතෙමේ විවාද කෙරේද ඒ විවාදධිකරණ නම්වෙයි විවාද කෙරෙමින් අනුවාදය කෙරේද ඒ අනුවාදධිකරණය නම්වෙයි. අනුවාද කෙරෙමින් ආපත්තියට පැමිණේද ඒ ආපත්තාධිකරණ නම්වෙයි. ඒ ආපත්තියෙන් සඞ්ඝතෙමේ විනය කර්මකෙරේද ඒ කිච්චාධිකරණ නම්වෙයි. මෙසේ ආපත්තාධිකරණය හෙතුකොටගෙණ චතුර්විධ අධිකරණයෝම උපදිත්.

අපලොකන කර්මය ඤත්ති කර්මය ඤත්ති දුතිය කර්මය ඤත්තිචතුත්ථ කර්මය යන මේ චතුර්විධ විනයකර්මය කිච්චාධිකරණ නම්වෙයි. මේ කිච්චාධිකරණයෙහි සඞ්ඝතෙමෙ විවාද

කෙරේද ඒ විවාදාධිකරණය නම්වෙයි. විවාද කෙරෙමින් අනුවාදය කෙරේද ඒ අනුවාදාධිකරණය නම්වෙයි. අනුවාද කෙරෙමින් ආපත්තියට පැමිණේද ඒ ආපත්තාධිකරණය නම්වෙයි. ආපත්තියෙන් සඞ්ඝතෙමේ විනයකර්ම කෙරේද ඒ කිච්චාධිකරණ නම්වෙයි. මෙසේ කිච්චාධිකරණය හේතුකොටගෙණද චතුර්විධ අධිකරණයෝම උපදිත්.

මෙහි කී චතුර්විධ අධිකරණයන් අතුරෙන් එක්තරා අධිකරණයක් මෙහි සප්තවිධ සමථයන් අතුරෙන් ඒ ඒ සමථයෙන් සංසිඳුවාද ඒ විනයධරයාගේ අනෙකප්‍රකාරයෙන් කරණලද විනය විනිශ්චයතෙම මෙසේ නොවෙයි කියා පෙරළාලිය නොහැකි වෙයි. බුදුන් විසින් තෙමේ වැඩහිඳ කරණලද විනිශ්චයයක් සමානවේ යම්බඳුවූම චොදක චුදිතක දෙදෙනෙක් විසින් සඟමැදට එළවූ වස්තුවට විනිශ්චය වදාරා දුන් තමාගේ කුකුස ඇවිත් විචාළහට කළමනා විනිශ්චය විධානය දක්වන සේක් "තං වෙ විනිච්ඡය කුසලං හිකබුං" යනාදිය වදාළසේකි.

ඒ විනය විනිශ්චයයෙහි දක්‍ෂවූ මහණක්හු කරුගොස් කරණලද අදින්නාදානාදි ශික්‍ෂාපද ඉක්මවූ මහණෙක් තමාගේ කුකුස විචාළකල්හි ඉදින් වනාහි ඒ මහණහු විචාළ ආපත්ති වස්තුව ආපත්තිවීනම් ඉදින් ඒ වස්තුවෙහි අවන් ඇවැත්තොම දෙශනායෙන් නැගීම් ඇත්තීවී නම් දෙශනා ගාමිනීයයි කියයුතුයි වුට්ඨානයෙන් සුද්ධන්තයට යන සුළු ආපත්තියක්වී නම් ඒ මහණහට තා විචාළ වස්තුවෙහි අවන් ආපත්තිතොම උට්ඨානගාමිනීයයි කිය යුතුයි. නැවත මේ විනයධරයාහට ඔහු විචාළ වස්තුවෙහි පාරාජිකාවක් නොපෙණේ නම් පරිජි ඇවැත්වෙයි. නොකියයුතුයි. කුමක් හෙයින්ද? මෛථුනයෙහි ශික්‍ෂාපද ඉක්මීමද උත්තරි මනුෂ්‍යධර්ම ශික්‍ෂාපද ව්‍යතික්‍රමයද ප්‍රකටව වැටහෙයි. අදින්නාදාන සිකපදය ඉක්ම පැවැත්මද මනුස්ස විග්ගහ සිකපදය ඉක්ම පැවැත්මද යන මේ ව්‍යතික්‍රමයෝ වනාහි තමා විසින්ද දැනගත නොහැකිය වහාම ලඝු පරිවර්තනය ඇති චිත්තයගේ වහාම අතික් ප්‍රකාරයෙන් පෙරළීම ඇති බැවින් සියුම් බව ඇත්තේය. ලඝුවූ චිත්ත ප්‍රවෘත්තිය ඇත්තාහ. ඒ අදින්නාදාන මනුස්ස විග්ගහ වීතික්කමයන් සියුම් ලෙසින්ම අවදනෝය සුඛුමත්වයෙන්ම පරිජි ඇවතින් රැකේ. එහෙයින් ඉතිරි වීතික්කම දෙකට වඩා වෙසෙසින් ඒ අදින්නාදාන මනුස්ස විග්ගහ වීතික්කමසඞ්ඛ්‍යාතවූ වස්තුව ඇති කුක්කුච්ච විචාරක විනයධර තෙමේපාරාජිකාපත්තියක් වැනිව වැටහුනහොත් පරිජි ඇවැත් වෙයි. නොකියා ඉදින් ඒ විනයධරයාගේ ඇසෙන තන්හි

ආචාර්යී තෙමේ ජීවත්වේ නම් ඒ තමා විචාළ ඉක්බිති ඒ විනය ධරයා විසින් ඒ කතවීතික්කම ඇති මහණ අපගේ ආචාරීන් වහන්සේ විචාරවයි යැවිය යුතුවේ. ඉදින් ඒ මහණ උන්කරා ගොස් විචාරා නැවත අවුත් අන්තෙවාසිකවූ විනයධරයන්ට නුඹවහන්සේගේ ආචාර්යී තෙමේ මා විචාළ සැක පාළි විසින් විනය නය විසින් විමසාබලා සප්‍රතිකාරවූ ඇවැත් ඇත්තෙහි යයි හෝ මට කිවුයයි කියාද ඔහු කී පසු ඒ විනයධරයා විසින් කුකුස් ඇති මහණ තෙමේ ඉතා යහපත යමක් ආචාර්යී තෙමේ කියාද ඒ කරවයි කියයුතුවේ. ඉදින් ඒ විනයධරයාගේ ආචාර්යී තෙම නැද්ද තමන් හා කැටුව විනය උගත් අනිත් ස්ථවිරයන් ඇද්ද ගණ දෙටුවූ අප හා සමග විනය උගත් අනික් ස්ථවිර යෙක් ඇත. අසවල් ස්ථවිරයන් කරාගොස් තොපගේ කුකුස විචාරවයි. ඔහු සමීපයට යැවියයුතුවේ. ඒ සමග උගත්තෙරුන් විසිනුදු ප්‍රතිකාර සහිතවූ ඇවැත්ඇත්තෙහියි විනිශ්චයකළ කල්හි ඉතා යහපත ඔහුගේ වචනය කරවයි කිවයුතුවෙයි. ඉදින් සමග උගත් තෙර කෙණෙකුන් නැද්ද විනයධර පණ්ඩිත අන්තෙ වාසිකයෙක් ඇද්ද අසවල් මහණහු කරාගොස් විචාරවයි. ඔහු සමීපයට යැවියයුතුවේ. ඒ ළදරු මහණහු විසිනුදු ප්‍රතිකාර සහිත ඇවැත් ඇත්තෙහියි විනිශ්චයකළ කල්හි ඉතා යෙහෙක ඔහුගේ වචනය කරවයි කියයුතුවේ. නැවත ගොස් විචාළ ළදරු මහණහට පාරාජිකා පත්තියක්සේම වැටහුණීනම් ඒ දහරයා විසින්ද පරිජි අවන්තෙහියි නොකිය යුතුවේ. බුද්ධොත්පාදය වනාහි ලැබියහැකි දෙයක්නොවේ. එයට වඩා පැවිද්දද උප සම්පදාවද ලැබියහැකි දෙයක්නොවෙයි. එහෙයින් ප්‍රව්‍රජ්‍යාවද උපසම්පදාවද අතිශයින් දුර්ලභය. තම ආත්ම ශුද්ධිය තමා විසින්ම විමසිය යුතු බැවින් කතවීතික්කමය ඇතිව තමාම විචාළ මහණහට මෙසේ වනාහි කියයුතුයි.

ජනයානැති ප්‍රදෙශයක් හැමද දවල් වසන තැනහිද යම් වීතික්කමයක් නිසා කුකුස උපන්ද එවැනි ක්‍රමය සිත්හි නොකොට අවශෙෂ ශීලය විශුද්ධකොට කෙශාදි දෙතිස් ආකාරවූ කමටහණ මෙණෙහි කරවයි කියයුතුයි. ඉදින් ඒ මහණහුගේ ශීලය නිරොගිවීනම් නොබිඳිනීනම් වත්තිංසාකාර කමටහන අතරකුරෙහි උපදනා විතර්කයෙන් කඩක් නැතිව සිත හා සමග කමටහන් අරමුණු බැවින් බොහෝ කලක් ගැටෙයි විපස්සනා කමටහන මෙනෙහි කරන්නාහට රූප වෙදනාදිවූ සංඛාරයෝ කැඩපත් තලයෙහි මුඛනිමිත්තමෙන් පහළව වැටහෙත්. උප චාර සමාධි අප්පණා සමාධියට පැමිණි කලක්මෙන් සිත එකග

වෙයි. නිවාත ස්ථානයෙහි පහන් සිළුව මෙන් එක අරමුණෙහි පවතී. විවේකයෙහි සිතිවිලි පවත්නා බැවින් දවස ඉකුත්වුව නොදනීද. ඒ මහණ දවස ඉක්මුණු කල්හි ථෙරූ පට්ඨානයට ආයේ "තාගේ සිත් හසර කෙබඳුදැයි" මෙසේ කියයුතුය. ඔහු තමාගේ සිත්හසර කී කල්හී පැවිද්ද නම් විපිළිසරක් නැතිව පිරිසුදුව පවත්නා සිත පිණිසය. තාගේසිත පිරිසුදුව පවත්නා බැවින් නොපමාව මහණදම් කරවයි කියයුතුවේ.

යමක්හුගේ වනාහි සිල්බිඳුනේ හෝ වේද සමථ විපස්සනා කම්මටහණ නොගැටෙයි නිරන්තරයෙන් සිත නොපවතියි. කැට කින් විදිත ලද්දක්හුගේ දුක් වේදනායෙන් විදුනාලද සිත මෙන් කම්පාවෙයි. විපිළිසර නමැති ගින්නෙන් දනුලැබෙයි හුණු පහණෙක උන් එකකුමෙන් එකෙණෙහිම හුනස්නෙන් නැගෙයි. ථෙරූපට්ඨානයට ආ ඒ මහණතෙමේ තාගේ සිත් හසර කෙබඳුදැයි විචාළයුතුවේ. තම සිත්හසර කී කල්හිද පව්කම් කරන්නාහට රහසෙක් නම් නැති. ඒ එසේ මැයි පව් කරන්නේ හැමදෙනාට පළමු තෙමේමදනී. නැවත මොහු අරගහත් දෙවතාවෝ දනිති. පරසිත් දන්නා මහණ බමුණෝද අරගහත් දෙවියන් කෙරෙන් අන්‍යවූ පරසිත් දන්නා දෙවියෝ දනිති. එහෙයින් මෙසේ චිත්ත විසුද්ධිය නැති කල්හි තෝම තට මෙලොව පරලොව සුව සොයවයි කියයුතුවේ. මේ තමාම තමාගේ සැකය අවුත් විචාළහට කිවමනා විනිශ්චයයයි.

දූත් ආදියෙහි කියනලද ප්‍රභෙද ඇති චොදනාවක්වීද ඒ චොදනාවගේ සම්පත් විපත් දූතගන්නා පිණිස ආදි මධ්‍ය පර්‍ය්‍ය වශානාදීන්ගේ වශයෙන් විනිශ්චය දතයුතු. හේ කවරේද? චොදනාවට කවරක් ආදිවේද? කවරක් මධ්‍යද? පර්‍ය්‍යවශානය කවරක්ද? මම තොපට (චොදනා වශයෙන්) කියනු කැමැත්තෙමි. ආයුෂමත් තෙමේ මට අවකාශ කෙරේවායි මෙසේ අවකාශ කිරීම චොදනාවට ආදිවේ. සඟමැදට බට වස්තුවෙන් චොදනා කොට සිහිකරවා විනිශ්චයය කිරීම චොදනාවගේ මධ්‍යයවේ ආපත්තියෙහි හෝ අනාපත්තියෙහි හෝ පිහිටුවීමෙන් සංසිඳුවීම චොදනාවගේ පර්‍ය්‍යවශානය නම්වේ.

තවද චොදනාවගේ මූල්කෙතෙක්ද? වස්තුකීයක්ද? භූමි කෙතෙක්දයත්? සමූලික අමූලික වශයෙන් මූල්දෙකය දිට්ඨ සුත පරිසංකිත වශයෙන් වස්තුතෙක සුදුසු කාලයෙහි කියමි අකාලයෙහි නොකියමි විද්‍යමාන වස්තුවක් කියමි අවිද්‍යමාන

වස්තුවක් නොකියමි මොළොක් මතපුලෙන් කියමි පරුෂබසින් නොකියමි අර්ථයෙන් යුක්තව කියමි අනර්ථයෙන් නොකියමි මෙත්සිත් ඇතිව කියමි ද්වේෂසිත් ඇතිව නොකියමි යන මේ ක්‍රමයෙන් චෝදනාවගේ භූමිපසෙක ඒචෝදනාවෙහි වනාහි චෝදක පුද්ගලයා විසින් කිමෙක්ද මම පිරිසිදු කායසමාචාර ඇත්තෙම්දැයි යන මේ ආදික්‍රමයෙන් උපාලි පඤ්චකයෙහි කියන ලද පසළොස් ධර්මයෙහි පිහිටිය යුතු.

එහි පසළොස් ධර්මයෝ නම්:-පරිසුද්ධකාය සමාචාරතා පරිසුද්ධ වචීසමාචාරතා සබ්‍රහ්මචාරී සුමෙත්තචිත්තතා බහුස්සුතතා උභින්නං පාතිමොක්ඛානං විත්ථාරෙන ස්වාගත සුවිභත්ත සුප්පවත්ත සුවිනිච්ඡිතතා කාලෙන වක්ඛාමීති ආදිනා වුත්ත පඤ්ච ධම්මා කාරුඤ්ඤතා හිතෙසිතා අනුකම්පතා ආපත්ති වුට්ඨානතා විනය පුරෙක්ඛාරතාති" යන මේ පසළොස් ධර්මයෝයි.

චෝදනාවලද තැනැත්තහු විසින් සත්‍යයෙහිද නොකිපීමෙහිද යන දෙකාරණයෙහි පිහිටිය යුතුයි. අධිකරණය විනිශ්චය කරණ විනයධරයා විසින් චෝදක තෙමේ යම්හෙයකින් අවැත්නි තෝමේ මහණහට චෝදනා කොළෙහිය. සීල විපත්තියෙන් චෝදනා කොළෙහිද ආචාර විපත්තියෙන් චෝදනා කොළෙහිද දිට්ඨි විපත්තියෙන් චෝදනා කොළෙහිදැයි මෙසේ විචාළ යුතුවේ. ඉදින් ඒ චෝදක තෙම සීලවිපත්තියෙන් හෝ චෝදනාකරමී. ආචාර විපත්තියෙන් හෝ චෝදනා කරමි. දිට්ඨිවිපත්තියෙන් හෝ චෝදනා කරමියි මෙසේ කියා නම් විනයධරයා විසින් හෙතෙම ආයුෂ්මත් තෙම වනාහි සීල විපත්තිය දන්නේද ආචාර විපත්තිය දන්නේද දිට්ඨිවිපත්තිය දන්නේදැයි මෙසේ කියයුතු වන්නේය.

ඉදින් චෝදක තෙම ඇවැත්නි! මම වනාහි සීලවිපත්තියද ආචාර විපත්තියද දිට්ඨි විපත්තියද දනිමැයි මෙසේ කියාතම්. විනයධරයා විසින් ඇවැත්නි! සීලවිපත්ති තොමෝ කවරීද? ආචාර විපත්තිය කවරක්ද? දිට්ඨි විපත්ති තොමෝ කවරීදැයි මෙසේ කියයුතු වන්නේය. ඉදින් ඒ චෝදක තෙම සතර පාරාජිකාවෝද තෙළෙස් සඞ්ඝාදිසෙසයෝද යන මේතොමෝ ශිලවිපත්තිය. තුලසී පචිති පාටිදෙසනිය දුක්කට දුබ්භාසිත යන මේතොම ආචාරවිපත්තිය මිච්ඡාදිට්ඨිය අන්තග්ගාහිකදිට්ඨිය යන මේතොමෝදිට්ඨිවිපත්තියයි මෙසේ කියාතම් විනයධරයා විසින් ඒ චෝදකතෙම යම්හෙයකින් ඇවැත්නි! තෙපි මේ මහණහට චෝදනා කොළෙහිය. දුටුදෙයක් කාරණකොටගෙණ

චොදනා කෙළෙහිද ඇසූදෙයක් කාරණකොට ගෙණ චොදනා කෙළෙහිද සැකකල දෙයක් කාරණකොටගෙණ චොදනාකෙළෙහිදූයි මෙසේ කියයුතු වන්නේය.

ඉදින් ඒ චොදක තෙම දුටුදෙයක් කාරණකොටගෙණ හෝ ඇසූ දෙයක් කාරණකොටගෙණ හෝ සැකකල දෙයක් කාරණකොටගෙණ හෝ චෝදනා කෙරෙමියි මෙසේ කියාතම් විනයධරයා විසින් ඒ චොදක තෙම යම්හෙයෙකින් ඇවැත්නි! තෝ මේ මහණහට දුටුදෙයින් චොදනා කෙළෙහි නම් තා විසින් කුමක් දක්නා ලද්දෙද කුමකැයි දක්නා ලද්දෙහිද කවරකාලෙක්හි දක්නා ලද්දෙහිද කොතැන්හි දක්නා ලද්දෙහිද පාරාජිකාවට පැමිණෙන්නේ දක්නාලද්දෙහිද සඞ්ඝාදිසෙසයට පැමිණෙන්නේ දක්නාලද්දෙහිද තුලසි පචිති පාටිදෙශනීය දුඃකට දුබ්භාසිත යන මේ මේ ආපත්තිවලට පැමිණෙන්නේ දක්නා ලද්දෙහිද මේ මහණ කොතැන්හි සිටියේවේද තෝ කොතැන සිටියේ වෙහිද තෝ කුමක් කෙළෙහිද මේ මහණ කුමක් කෙළෙහිදූයි මෙසේ කිවයුතු වන්නේය.

ඉදින් ඒ චොදක තෙම ඇවැත්නි! මේ මහණහට මම චනාහි දුටු දෙයකින් චොදනා නොකෙරෙම් එතකුදුවුවත් අසන ලද දෙයින් චොදනා කෙරෙමියි කියා නම් ඒ විනයධරයා විසින් චොදක මහණතෙමේ යම් හෙයකින් ඇවැත්නි! තෝ මේ මහණ හට ඇසූදෙයින් චොදනා කෙළෙහිය. තා විසින් කුමක් අසන ලදද කුමකැයි අසනලදද කවර කලෙක අසනලදද කොතැන්හිදී අසනලදද පාරාජිකාවට පැමිණියේ යයි අසනලදද සඞ්ඝාදි සෙසයට පැමිණියේ යයි අසනලදද ථුල්ලච්චයට පාචිත්තියට පාටිදෙසනීයට දුඃකටයට දුබ්භාෂිතයට පැමිණියේයයි අසන ලදද භික්ෂුවක්හුගෙන් අසන ලදද භික්ෂුණියකගෙන් උපසම්පදාවීමට හික්මෙන්නියකගෙන් සාමණේරයක්හුගෙන් සාමණේරියක්හුගෙන් උපාසකයක්හුගෙන් උපාසිකාවකගෙන් රජදරුවන්ගෙන් රාජ මහාමාත්‍යයන්ගෙන් තීර්ථකයන්ගෙන් තීර්ථක ශ්‍රාවකයන්ගෙන්අසනලදදූයි කිවයුතු වන්නේය.

ඉදින් ඒ චොදක තෙම ඇවැත්නි! මම මේ මහණහට ඇසූ දෙයින් චොදනා නොකරමි. එතකුදු වුවත් සැකකල දෙයින් චොදනා කෙරෙමැයි මෙසේ කියාතම් විනයධරයා විසින් ඒ චොදක තෙමේ යම් හෙයකින් ඇවැත්නි! තෝ මේ මහණහට සැකකල දෙයින් චොදනා කෙළෙහිය. කුමක් සැක කරන්නෙහිද

කුමකැයි සැකරන්නෙහිද කවර කලෙක්හි සැක කරන්නෙහිද කවර තැනෙක්හි සැක කරන්නෙහිද පරාජිකාවට පැමිණියේයයි සැකකරන්නෙහිද සඞ්ඝාදි සෙසයට- ථුල්ලච්චයට පාචිත්තියට පාටිදෙසනීයට දුක්කටයට දුබ්භාසිතයට පැමිණියේ යයි සැක කරන්නෙහිද භික්ෂුවක්හුගෙන් අසා සැක කරන්නෙහිද භික්ෂුණියක්හුගෙන් අසා සැක කරන්නෙහිද-පෙ-තීර්ථක ශ්‍රාවකයක්හුගෙන් අසා සැකකරන්නෙහිදැයි මෙසේ කිවයුතුවන්නේය.

දිට්ඨං දිට්ඨෙන සමෙති-දිට්ඨෙන සංසන්දති දිට්ඨං,
දිට්ඨම්පටිච්ච න උපෙති-අසුද්ධ පරිසංකිතො.

සො පුග්ගලො පටිඤ්ඤාය-කාතබ්බා තෙනුපොසථො,
සුතං සුතෙන සමෙති-සුතෙන සංසන්දතෙ සුතං.

සුතං පටිච්චනුපෙති-අසුද්ධ පරිසංකිතො,
සො පුග්ගලො පටිඤ්ඤාය-කාතබ්බා තෙනු පොසථො.

මුතං මුතෙන සමෙති-මුතෙන සංසන්දතෙ මුතං,
මුතං පටිච්චන උපෙති-අසුද්ධ පරිසංකිතො,
සො පුග්ගලො පටිඤ්ඤාය-කාබ්බා තෙනුපොසථො.

ලජ්ජී සු පටිඤ්ඤාය කතා-අලජ්ජීසුතං න විජ්ජති,
බහුම්පි අලජ්ජිභාසෙය්‍ය-වුත්තානු සඤ්ඤිතෙන කාරයෙති.

දුටිම දක්නාලද දෙය හා සමවේද දක්නාලද දෙය දුටිම හා සංසන්දනය වේද දුක්ම පිණිස ඒ මහණ තෙම ආපත්තියට නොපැමිණෙන්නේයි. ඒ පරිසංකිතය අමූලික වන්නේය. මම පිරිසිදුයයි ඒ මහණහුගේ ප්‍රතිඥාවෙන් ඔහු හා සමග පොහොය කටයුතුවේ. මෙහි භාවයනම්:-එක් මහණෙක් අතික් මහණක්හු මාගමක් සමග එක තැනකින් නික්මෙන්නේ හෝ එක තැනකට ප්‍රවිෂ්ටවන්නේ හෝ දක්නා ලද්දේවේද හෙතෙම ඒ මහණහට පාරාජිකා පත්තියෙන් චෝදනා කරයි. චෝදනා ලද තැනැත්තේ චෝදකයාගේ දුක්ම අනුදනී නොහොත් සැබවයි කියයි. මෙසෙයින් දුටිම චුදිතකයාගේ කීමට එකඟවෙයි. සම වෙයි. ඒ දුක්ම පිණිස චුදිතකයා ආපත්තිය හෝ අනුදනී එහෙයින් හෙතෙම අසුද්ධ පරිසංකිත වන ලද්දේය. නොහොත් ඒ දුක්ම ගැන කරණලද සැකය පිරිසිදු නොවන්නේය. හෙවත් අමූලිකවන්නේය. මම පිරිසුදුවෙමැයි චෝදනාලද තැනැත්තහුගේ ප්‍රතිඥාවෙන් ඔහු හා සමග පොහෝ කටයුතුය යනුයි.

ඇසීම අසනලද දෙය හා සමවේද අසනලද්දේ ඇසීම හා සංසන්දනයවේද ඒ පුද්ගලතෙම ඇසීම පිණිස ආපත්තියට නොපැමිණෙයි. හෙතම අසුද්ධ පරිසඞ්කිත නම්වෙයි. මම පිරිසුදු වෙමියි චුදිතකයාගේ ප්‍රතිඥවෙන් ඔහු හා සමග පොහෝ කට යුතු.

සැකකිරීම සැකකරනලද දෙය හා සමවේද ඒ සැකකිරීම සැක කරණලද දෙය හා එකගවේ ඒ සැකකිරීම පිණිස ඒ පුද්ගල තෙම ආපත්තියට නොපැමිණෙයි. හෙතෙම අසුද්ධ පරිසඞ්කිත නම්වෙයි. මම පිරිසුදුයයි චුදිතකයාගේ ප්‍රතිඥව ගෙණ ඔහු සමග පොහෝ කටයුතුවේ

ලජ්ජීන් කෙරෙහි ප්‍රතිඥගෙණ පොහෝ කිරීම නියම කරණ ලද්දේය. ඒ නියමය අලජ්ජීන් කෙරෙහි විද්‍යමාන නොවෙයි. ඒ කුමක් හෙයින්ද? අලජ්ජීතෙම සත්‍ය සත්‍යවූ බොහෝ තෙපුල් කියන්නේය. එහෙයින් ඔහුගේ පෙර වචනද පසු වචනද එකග කොට බලා ඒ වචනානුසන්ධි ගැලපේනම් අනාපත්ති වශයෙන් කරවන්නේය. නොගැලපේනම් ආපත්ති වශයෙන් කරවන්නේය යනු භාවයි.

වැලිත් මෙහිලා සඞ්ග්‍රාම සඞ්ඛ්‍යාතවූ අධිකරණය පිණිස රැස්වූ සඟමැදට එළඹෙන මහණ විසින් නිහතමානයෙන් යුක්තව එළඹිය යුතුයි. රජෝහරණ නම්වූ පාපිස්නා පිළීකඩක් වැනිවී කරුණාවෙන්ද යුක්තව මධ්‍යස්ථව තමහට සුදුසු අස්න දැන් මෙහි බුහුටි වියයුතුය. හිඳීමෙහි යොග්‍ය යොග්‍යතා දන්නහු විසින් ස්ථවිර භික්ෂූන් නොගටන්නහු විසින් නවක භික්ෂූන් හුනස්නෙන් නොනගන්නහු විසින් තමහට සුදුසු අස්නෙහින්ද යුතුය. නිරර්ථකවූ නන්වැදෑරුම් කථා නොකළ යුතුය. තිරශ්චීන කථා නොකටයුතුය. තෙමේ හෝ දහමක් කියයුතුය. අනිකෙකුට හෝ ආරාධනා කටයුතුය. කම්ස්ථාන භාවනාවෙක්හියෙදී සිටීම් සඞ්ඛ්‍යාත ආර්යයන්ගේ තුෂ්ණීම් භාවයද ඉක්ම නොසිතිය යුතුය.

සඞ්ඝයා විසින් අනුමතකළ අනුවිජ්ජක නායීය කරණු කැමති විනිශ්චයකාර තැන්පත් තැනැත්තා විසින් චූදිතකාදීන්ගේ උපාධ්‍යාය තෙම නොවිචාළ යුත්තේය. ආචාර්යයාද නොවිචාළ යුතුය. සද්ධි විහාරිකයාද නොවිචාළ යුතුය. අන වැසියාද නො ඇසිය යුතුය. සමානොපාධ්‍යායයාද සමානාචාර්යයාද නොවිචාළ යුතුය. ජාතියද නාමයද ගොත්‍රයද නොපිළිවිසිය යුතුය. දීඝ භාණකද මජ්ඣිම භාණකද යනාදීන් ආගම විචාරණයද නො

කටයුතුයි ක්ෂත්‍රිය කුලාදියක් ඇත්තෙහිද යනාදී කුල ප්‍රදෙශ නොඇසිය යුතුය. උපන් ගමද නොඇසිය යුතුය. කවර හෙයින් දයත්? මේ ඇසීම්වලදී ප්‍රේමයක් හෝ වෙෂයක් වියහැක ප්‍රෙම වෙෂවූ කාර්‍යහි ඡන්ද වශයෙන් හෝ අගතිගාමී වන්නේය වෙෂවශයෙන් හෝ අගතිගාමිවන්නේය. මෝහයෙන් හෝ භයින් හෝ අගතිගාමී වන්නේය.

සඞ්ඝයා විසින් අනුදන්නාලද විනිශ්චය කරණු කැමති අනුවිජ්ජක තැනැත්තා විසින් සඞ්ඝගරුක වියයුතුය. පුද්ගල ගරුකනොවිය යුතුය. ආමිෂගරුක නොව සද්ධර්ම ගරුක විය යුතුය. හිතාභිවෘද්ධියක්ම එක්වන් සිතන්නෙක්වී පිරිස සතුටු දෙයක්ම කිරීමෙහි සිතයොමු නොකරන්නෙක් වියයුතුය. සුදුසු කාලයෙන් යුක්තව අනුයොග කටයුතුය. නුසුදුසු කාලයෙන් යුක්තව අනුයොග නොකට යුතුය. (අනුයොග නම් ප්‍රශ්නයි.) අභූතයෙන් නොව විද්‍යමාන වස්තුවෙන් අනුයොග කටයුතුය. පරුෂ වචනයෙන් නොව මෘදු වචනයෙන් අනුයොග කටයුතුය. අනර්ථ සංනිඃශ්‍රිත දෙයින් නොව අර්ථනිඃශ්‍රිත දෙයින් අනුයොග කටයුතුය. වෙෂයෙන් නොව මෛත්‍රීයෙන් යුක්තව අනුයොග කටයුතුය. කණමුල කෙඳිරීම නොකටයුතුය. වක්ව නොබැලිය යුතුය ඇස් ඉඟි නොකළ යුතුය. බැම නොනැගිය යුතුය. ඉස නොම එසවිය යුතුය. හස්තවිකාර නොකට යුතුය. හස්තමුද්‍රා නොදැක්විය යුතුය. ආසන කුශලත්වයෙන් යුක්ත වියයුතුය. නිෂද්‍ය කුශලත්වයෙන් යුත් යුග මාත්‍රයක් බලන අර්ථානු විධානය කරන්නහු විසින් ස්වකීයාසනයෙහි හින්ද යුතුය. තමා හුනස්නෙන් නැගී (සඞ්ඝ) සභාවෙහි නොහැසිරිය යුතුය. (විනයධරයා නැගී සිටිකල සියලු පිරිස නැගී සිටී) වීථි (සඞ්ඛ්‍යාතවූ විනිශ්චය කර්මය) ඌන නොකළ යුතුය කුන්මාගී සෙවන (නම්වූ ආපත්ති දැක්වීම) නොකට යුතුය. බාහා විකෙඛප (නම්වූ අත්නැගීම් ආදිය කරමින්) නොබිණිය යුතුය. සුහුසුලුනොවී බිණියයුතුය. ලාහෙලා නොකරන්නහු විසින් වී රළුවචන නොබිණිය යුතුය. චණ්ඩිකකභාවය නොකටයුතුය. මෙරමාගේ දුරුත්තවචන ඉවසන මෙත්සිත් ඇතිවිය යුතුය. හිතානුකම්පි කරුණාවෙන් යුක්ත වියයුතුය. හිතකැමතිවූවහු විසින් සම්ඵප්පලාප නොකියන්නෙක් විසින් වියයුතුය. (ආදී යෙහි හිතෙෂී බව හා කරුණාව එළවා සිටිය යුතුයයි සේයි) නිශ්චිත වචන බණන වෛර වසඟ නොවූ සිත් ඇතිවිය යුතුය. විග්‍රාහික කථා (නොමනාබස්) නොබිණියයුතුය. විනිශ්චය හැකි වම්ද, නොවම්දූයි මෙසේ තම පමණ දතයුතුය. විනිශ්චය පිණිස මේ පිරිස ලජ්ජී පිරිසක්දූයි මෙරමාද දතයුතුය. ධර්ම

චෝදකයෙක්ද නොවේදැයි චෝදකයා හැඳිනගත යුතුය. ධර්ම චුදිතකයෙක්ද නොවේදැයි චුදිතකයා හැඳිනගත යුතුය. අධර්ම චෝදකයා දැනගත යුතුය. (ඔහුගේ පමණ දතයුතුයයි සේයි) අධර්ම චුදිතකයාද දතයුතුය. අධර්ම චෝදකයාද අධර්ම චුදිතකයාද දතයුතුය.

චෝදක චුදිතකයන් විසින් කියන ලද්ද ඌන නොකරන් තහු විසින් චෝදනා වස්තුවශයෙන් නොකියන ලද්දක් ගෙණ නොපාන්නහු විසින් අවතීර්ණපද ව්‍යඤ්ජනයන් මනාව ඉගෙණ මෙරමා පිළිවිස ප්‍රතිඥා පරිද්දෙන් ඇවතින් කරවිය යුතුයි. මඳවූ නුවණමද තැනැත්තහු ධෛර්‍යදීමෙන් සතුටු කරවිය යුතුය. සංඝ ගණ මධ්‍යයට නොපැමිණි විරූ තැනැත්තහු බියවන සුලුතම් ඕහට බිය නොවෙව විශ්වාසීව කිවයුත්ත කියව, අපිත් නොපට ආධාර වම්හයි අනුයෝගවත කියවිය යුතුය. චණ්ඩයා තර්ජනයෙන් වැලැක්විය යුතුය. අලජ්ජිපුද්ගලයා ප්‍රකාශකර ඇවැත් දෙසවිය යුතුය. ඍජුවූ කායවංකාදිය රහිත සිල්වත් තැනැත්තහුට මෘදුභාවයෙන්ද පැවතිය යුතුය. ඡන්දයෙන්ද, ද්වේෂයෙන්ද, මෝහයෙන්ද, භයෙන්ද අගතිගමන නොකට යුතුය. තෙමේ මධ්‍යස්ථ වියයුතුය, ධර්මවිෂයෙහිද පුද්ගලයන් කෙරෙහිද මෙසේ විනිශ්චය කරණ අනුවිජ්ජක භික්ෂුතෙම ශාස්තෘශාසනය කරන්නේද නුවණැති සබ්‍රම්සරවරුන්ට ප්‍රියවූයේද වන්නේය. මනාපවූ ගරු කටයුතු සැලකිය යුත්තෙක්ද වන්නේය.

---


සල්ලෙඛියො සුගත සාසන වුද්ධිකාමො
සබ්බස්සතං විහිතවා අකිලා සුධීරො
රාමඤ්ඤවංස යති සඞ්ඝ පතිස්ස තස්ස
ඉන්දසභා දි වරඤ්ඤණ පතිස්ස තස්ස.

සිස්සස්ස පච්ඡිම පදං පතිලද්ධපඤ්ඤා-
සීහා භිධාන සහිතෙන තපොධනෙන
අඞ්ගීර සුත්තමපි අට්ඨකථංච පාළි
මූත්තං නයංච පරියාදිය එස ගන්ථො.

සම්පාදිතො ධිකරණම්පි ජනෙදයාය
ගන්ථඤ්ච පුබ්බලිඛිතං සමුපාසිතෙන
සන්නිධයානි ඛලිතානි සුධීගණො ච
දිස්වා විසොධයතු සාසන වුඩ්ඪිකාමො.

---

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු